සැඟවුණු බොදු මග යළි පුබුදන

# හෙළ බොදු පියුම

ශ්‍රී බු. ව. 2559ක් වූ දුරුතු මස (ව්‍යවහාරික වර්ෂ 2016 ජනවාරි)

52 වෙනි කලාපය

## කල් ගතවූ කැස්ස | ඇදුම | හතිය සඳහා ප්‍රත්‍යක්ෂ අරිෂ්ටයක්











රු. 25/-

● සැඟව ගිය බොදු මග යළි රැගෙන සෑම පුන් පොහෝ දිනකම එළිදකින දහම් සංග්‍රහය









# රජ්ජු මාලාවෝ

උරුවෙල දනව්වෙහි පෙර බමුණු පවුලෙක
කරුමය පරිදී දිවි ගෙවූ විලස වහලෙක
හුරු කළ මාලයකි ගෙල සැදුන ලණුවෙක
දැරූ නම රජ්ජු මාලා දහමෙ පුවතෙක

බැමිණිය මැයට ගුටි බැට දෙයි හැම දාම
විළි බිය නැති විලස හිරි හැර ගැරහීම
දර දිය ඇද නිමක් නැති මුත් වෙහෙසීම
පුදුමය තමා බැමිණිට නැත ඉවසීම

තව දුර මැගේ කෙස් ටික තද කර අල්ලා
හිරි හැර කරයි හැම විට හිස ගත හොල්ලා
කරදර කරනු කිම මම නිදහස ඉල්ලා
දිවි තොර කර ගනිමි මගෙ නෙත් දෙක පල්ලා

විදු සර බුදු සමිඳු හට මැගෙ දුක පෙනුණා
මඩු වැල ගෙල රැඳුන ගස වෙත පිය මැනුණා
රුදු මරු වෙත නොවේ හිත සමිඳුට බැඳුණා
බුදු හිමි දෙපා අභියස මැය වැඳ වැටුණා

සත් දහමට මැගේ පුහුදුන් සිත නැමුණා
සිත් සැනසුනා හිමි දෙසු බණ පද ඇසුණා
මෙත් කරුණා බෙලෙන් මැගෙ දුක් ගිනි නිවුණා
පත් විය අරි මගට නිරයෙන් අත මිදුණා

දුටු සඳ බැමිණි සහ බමුණා මැගෙ වෙනස
තුටු විය අසා දෙසු බණ දුරු විය කුකුස
ඉටු කර ගනු පිණිස සිරි සදහම් පවස
බටු මහ මගට හමු විය බුදු හිමි විගස

පබැඳුම - පානදුරේ එස්. ඒ. එස්. පෙරේරා

# ධම්ම පදය තුලින් නිවන් මග

**19 වන කොටස**

පාරෙ වැටිල තියෙන, අව්වට වැස්සට පින්නට අහු වෙච්ච යකඩ කැලි අපි ඕන තරම් දැකල තියෙනවා. කෙනෙක් තීන්ත ආලේපනයක් කරල ආරක්ෂා කළාට වඩා වෙනස් දෙයක් තමයි ඒවායේ දකින්න තියෙන්නෙ. ඒ යකඩ කැලිවල දුඹුරු පාටට හුරු දෙයක් බැඳිල තියෙනවා. මේවට කියනවා මලකඩ කියල. මේ මලකඩවලින් සිද්ධ වෙන දේ අත්දැකීම් තියෙන අය හොඳටම දන්නවා. ඒ යකඩෙ උඩම වැඩිල යකඩෙම විනාස කරන්න පුළුවන්. ඉතින් අපේ හිතත් රාගයෙන්, ද්වේශයෙන්, මෝහයෙන් ආරක්ෂා කරගත්තෙ නැත්නම්, අර අව්වට වැස්සට පින්නට අහු වෙච්ච, කිසිම ආරක්ෂාවක් නැති යකඩෙ වගේ මල බැඳෙන්න පුළුවන්.

**සංයුක්ත නිකායේ එන මල සූත්‍රයේ රාග, ද්වේශ, මෝහ කියන මේ තුන මල විදිහට පෙන්වා තියෙනවා. තේරුම දන්නෙ නැති වුනත්, කෙනෙක් තරහ ගිහින් ඉන්න වෙලාවට මල පැනල කියල කතාවටත් කියන්නෙ මේ රාග, ද්වේශ, මෝහ මතුවීම නිසා.**

යමක ඇත්ත තත්වය නොදැන ඒ දේට වටිනාකමක් දුන්නොත්, හිත රාගය කියන මලෙන් බැඳුණ වෙනවා. ඒ වටිනාකම දුන්න දේට විරුද්ධව යමක් ආවොත් හිත ඊළඟට එන ද්වේශය කියන මලෙන් බැඳෙනවා. ඊට පස්සෙ ගන්න තීරණ මොටයි, තීක්ෂණ නෑ. මොනව වෙනවද දන්නෙ නෑ. ඒත් කරනවා. නැවතත් අර වටිනාකම දුන්න දේ මොන ක්‍රමයෙන් හරි ආරක්ෂා කරන්න හදනවා. විරුද්ධව යමක් ආවොත් ඒකට ගැටෙනවා. තාවකාලිකව හෝ ජය ගත්තොත් සතුටු වෙනවා. දැන් හිත මෝහය කියන මලෙනුත් බැඳිල. රාගය, ද්වේශය, මෝහය කියන මල බැඳුනම අර යකඩෙට වෙච්ච දේම තමයි අපිටත් වෙන්නෙ. ටික ටික යකඩෙ විනාස වෙනව වගේම අපිත් විනාස වෙනවා.

ඒ මල ඉවත් කරන එකම ක්‍රමය තමයි කුසල් කිරීම (ආර්ය අෂ්ඨාංගික මග වැඩීම). යකඩයේ බැඳිල තියෙන ඒ මල හූරල පොල් තෙල් ගාල පිරිසිදු කරල නැවත මල නොබැඳෙන්න ආලේපයක් ගානව වගේ තමයි හිතට කුසලය කියන එක. ලොව්තුරා බුදුන් වහන්සේ වැඩ හිටපු කාලෙ මෙහෙම අකුසල් කරපු කෙනෙක් සහ අවසාන මොහොතෙ නුවණ පාදා ගත් කෙනෙක් පිළිබඳ කියවෙන කථාවක් ධම්ම පදයේ එන මල වර්ගයේ තියෙනවා. මේ ලිපිය තුලින් විග්‍රහ කරන්නෙ, ලොව්තුරා බුදුන් වහන්සේ මේ ගාථා දේශනා කරන්න මුල් වෙච්ච හේතුවත්, ඒ ගාථාවල වැඩි විස්තරත්.

ඒ කාලයේ හරක් මරන මනුස්සයෙක් හිටියා. ඔහුගෙ රස්සාව හරක් මරල ඒ මස් ටික විකුණල ඉතුරු වෙන මස් ටික තමන්ගෙ පරිභෝජනයට ගැනීම. මේ මනුස්සය අවුරුදු පනස් පහක් තිස්සෙ මේ



වැඩේ කරගෙන ගියා. කිසිම දවසක මසක් නැතුව කෑම කෑවෙ නෑ. මේ හරක් මරන මනුස්සයට පුතෙකුත් හිටියා. දවසක් හරකෙක් මරල ඒ මස් ටික විකුණල තමන්ගෙ කොටස උයල තියන්න කියල බිරිඳට දුන්නා. එහෙම දීල නැවත ගිහින් එන අතරෙ, අර උයල තියන්න කියපු මස් ටික ඔහුගෙම යාළුවෙක් ඇවිත් අවශ්‍යතාවයකට බලෙන්ම අර ගෙන ගියා. දැන් මේ මනුස්සයට උයල දෙන්න මස් නෑ. නැවත ආවට පස්සෙ කාරණය කිව්වම, මම මස් නැතුව කෑම කන්නෙ නෑ ඒක දන්නෙ නැත්ද කියල රණ්ඩු වුනා. කොච්චර නම් මේ කාරණය හිතේ බැඳිල තිබුනද කියනව නම්, එවෙලෙම පිහියක් අරගෙන ගිහින් ගෙදර පිටි පස්සෙ බැඳල හිටපු හරකගෙ කට ඇතුලට අත දාල දිව එළියට ඇදල කපා ගෙන ආවා. ඒ ගෙනාපු දිව ලිපට දාල අඟුරු කරල එක පාරටම කන්න කියල කටේ දාගත්තා. දැන් අර අඟුරු වෙච්ච දිවේ රස්නෙට මේ හරක් මරන මනුස්සයගෙ දිව පිච්චිලා දෙකට කැඩිල පිඟානට වැටුණා. දින ගණන් කටින් ලේ දදා දුක් විඳල මැරිල අන්තිමට අවීචියේ ඉපදුණා. තාත්තගෙ දිව කැඩිල ලේ වැගිරෙන සිද්ධිය දැකපු පුතා බය වෙලා ගෙදරින් පැනල ගියා. ගිහින් රන් කරුවෙක් ළඟ වැඩ කළා. මේ පුතා විශේෂයෙන් පිනක් දහමක් කළේ නෑ, නමුත් මේ කියන පුතාගෙත් පුතා ශ්‍රද්ධාවන්ත කෙනෙක්. තමන්ගෙ පියා ගැන හිතල බුදුන් වහන්සේ ප්‍රමුඛ මහා සංඝයා වඩම්මවල, ජීවත් වෙලා ඉන්න පියාට පුණ්‍යානුමෝදනාවක් කරන්න කියල ලොව්තුරා බුදුන් වහන්සේගෙන් ඉල්ලා සිටියා.

දැන් මේක විශේෂ සිද්ධියක්. ජීවත් වෙලා ඉන්න කෙනෙකුට පින් අනුමෝදනාවක් කරන්නයි ඉල්ලා සිටියෙ. ලොව්තුරා බුදුන් වහන්සේ ඒක කළා. අද බොහෝ අයගෙ මතයක් තියෙනවා, මේ මළගිය කෙනෙකුට විතරයි පුණ්‍යානුමෝදනාවක් කරන්න පුළුවන්, එහෙම නැත්නම් පින් දෙන්න පුළුවන් කියල. ජීවත් වෙලා ඉන්න කෙනෙකුට කොහොම පින් දෙන්නද ඒ පුද්ගලයම කරගත්තොත් මිසක් කියල මෙහෙම අදහස් ගන්නවා. මෙතන වචන දෙකක් තියෙනවා. එකක් පින් දීම, අනෙක පින් අනුමෝදන් වීම. තව විදිහකට කියනව නම්, පින් දෙනවට කියනවා පත්ති දාන කියල. පින් අනුමෝදන් වෙනවට කියනවා පත්තානුමෝදනා කියල. මොකක්ද මේ පත්ති කියල කියන්නෙ? පත්ති කියන වචනයට වඩා ප්‍රත්‍ය කියන වචනය තමයි අපි අහල තියෙන්නෙ. අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංඛාර වේ, සංඛාර ප්‍රත්‍යයෙන් විඤ්ඤාණ වේ.... මේ විදිහට ප්‍රත්‍ය කියන වචනය තමයි නිතර අහල පුරුදු. එතකොට ප්‍රත්‍ය දෙනවා, ප්‍රත්‍ය අනුමෝදන් වෙනවා කියලත් ගන්න පුළුවන්. ප්‍රත්‍ය කිව්වම ඒත් එක්කම නිතර භාවිතා කරන වචනයක් තමයි හේතු. හේතු - ප්‍රත්‍ය කියන මේ දෙක එකට භාවිතා වෙනවා. යම් කිසි ඵලයක් ගොඩ නගන්න නම්, ඵලයක් ලැබෙන්න නම් මේ දෙකම ඕන. හේතු - ප්‍රත්‍ය නිසයි ඵලය ගොඩ නැගෙන්නෙ.

හේතු කියන්නෙ හයකින් එතුණු කියන එක. ලෝභ, ද්වේශ, මෝහ,

අලෝභ, අද්වේශ, අමෝහ තමයි ඒ හය. මේ හයෙන් ප්‍රත්‍ය වීමට හේතු ප්‍රත්‍ය කියල කියනවා. මේ තමයි සූවිසි ප්‍රත්‍යයේ එන හේතු ප්‍රත්‍යය. හේතු හයත් ප්‍රත්‍යයන් තමයි. ප්‍රත්‍ය නොවන යමක් ලෝකයේ නෑ. එකක හේතුවක් තවත් එකක ප්‍රත්‍යයක්. ඒ ප්‍රත්‍යය තවත් එකකට හේතු වෙනවා. හේතු ප්‍රත්‍ය හැදෙන්නෙ එහෙමයි. උදාහරණ විදිහට සංඛාරවලට හේතුව තමයි අවිද්‍යාව. ඒකට ප්‍රත්‍යය තමයි අසත්පුරුෂ සේවනය. විඤ්ඤාණයට හේතුව සංඛාර. ඒකට ප්‍රත්‍යය තමයි අවිද්‍යාව. ඊළඟට නාමරූපවලට හේතුව විඤ්ඤාණය. ඒකට ප්‍රත්‍යය තමයි සංඛාර. මේ විදිහට එකක් ප්‍රත්‍ය වෙනකොට අනිකෙන් හේතු වෙනවා.

එතකොට අවිද්‍යා ප්‍රත්‍යයෙන් සංඛාර වේ කිව්වම, අවිද්‍යාව මොන ආකාරයෙන් ප්‍රත්‍ය වෙනවද කියල පැහැදිලි කරන්නෙ සූවිසි පට්ඨානයෙන්. ඒ ප්‍රත්‍ය 24 න් කීයක් හරි සම්බන්ධ වෙලා තමයි හේතු ප්‍රත්‍ය වෙන්නෙ. උදාහරණ විදිහට ගින්නෙන් බත් උයනව කියනවා. නමුත් වතුරෙන් බත් උයනව කියන්නෙ නෑ. හැබැයි ගින්නෙන් විතරක් බත් උයන්න බෑ. ඒකට තවත් ප්‍රත්‍ය වෙන දේවල් තියෙනවා. වතුර එක ප්‍රත්‍යයක් වෙනවා. වළඳ තවත් ප්‍රත්‍යයක් වෙනවා. හැබැයි ගින්න ප්‍රධාන කරල තමයි කතා කරන්නෙ. ඒක තමයි නායකත්වය ගන්නෙ. ඒ නිසා ගින්න තමයි අධිපති ප්‍රත්‍යය. ඊළඟට වතුර ඒකට නිශ්‍රය ප්‍රත්‍යය දෙනවා. වළඳ උපනිශ්‍ර ප්‍රත්‍යය දෙනවා. මේ විදිහට ප්‍රත්‍ය 24 න් ප්‍රත්‍ය වන ආකාරය විග්‍රහ කරන්නෙ සූවිසි පට්ඨානයෙන්. ඒ තමයි හේතු ප්‍රත්‍ය පැහැදිලි කරන්න තියෙන ඉහළම තැන.

එතකොට සූවිසි පට්ඨානයේ තියෙන හේතු ප්‍රත්‍ය මේකයි. හේතුවට අනුකූල ඵලයක් එනව කියන එකයි මේ හේතු ප්‍රත්‍ය කියන්නෙ. හේතුම් පටිච්ච සම්භූතං කියන තැන හේතු ප්‍රත්‍ය කිව්වෙ ඒකට. එතකොට පත්තිදාන කියන අවස්ථාවෙදි යම් කිසි ප්‍රත්‍යයක් දෙනවා. තමන් යමක් කරල ඒකෙ ප්‍රත්‍යය අනික් අයට දෙනවා. එතකොට හේතුවක් නැතිව ඒ අයට ඒ ප්‍රත්‍යය ලබන්න බෑ. යම්කිසි කෙනෙක් දානයක් දීල ඒ හේතුවෙන් පුණ්‍ය ඵලයක් ලබනවා. ඒ පුණ්‍ය ඵලය අනික් අයටත් පතුරුවනවා. අනෙක් අය ඒක දැකල සන්තෝස වුනොත් පත්තානුමෝදනාවක් වෙනවා.

උපමාවක් ගත්තොත්, කෙනෙකුට අඹ පැලයක් හදාගන්න ඕන නම් ඒකට අවශ්‍ය දේවල් තියෙනවා. මූලිකවම අවශ්‍ය දේ තමයි සාරවත් අඹ ඇටයක්. සාරවත් කිව්වෙ පැල කරන්න සුදුසු ශක්තිය තියෙන අඹ ඇටයක්. එතකොට අඹ පැලයක් හදාගන්න ඒ අඹ ඇටයට අවශ්‍ය ශක්තිය තියෙනවා. දැන් ඒ අඹ ඇටය නිකං මේසයක් උඩ හෝ කොහේ හරි අටුවක හෝ උරයක හෝ දාල තිව්වොත් පැල වෙයිද? නෑ. එහෙම පැල වෙන්නෙ නෑ. කොච්චර ශක්තියක් තිබුණත් සුදුසු තැනක රෝපණය කළේ නැත්නම් ඒ අඹ ඇටයෙන් පැලයක් හදාගන්න පුළුවන් කමක් නෑ. මේක ඕන කෙනෙක් අත්දැකීමෙන් දන්න දෙයක්. දැන් එහෙනම් මේක හිටවන්න සුදුසු තැන මොකක්ද? එක්කො පස් පුරවපු භාජනයක් වෙන්න පුළුවන්. එහෙම නැත්නම් සරු පසක් තියෙන පොළවක් වෙන්න පුළුවන්. අඹ පැලය නමැති ඵලය ගන්න නම් මේ කාරණා දෙකම සම්පූර්ණ වෙන්න ඕන.

1. නියම ශක්තිය සහිත අඹ ඇටය
2. සුදුසු පරිසරයක්, එහෙම නැත්නම් ඒ අඹ ඇටයට අවශ්‍ය පෝෂණය දෙන්න පුළුවන් පසක්.

දැන් අඹ පැලයක් ගන්න නම් අඹ ඇටයත් ඕන, පරිසරයත් ඕන. එහෙනම් අවශ්‍ය ශක්තිය තියෙන අඹ ඇටයට කියනවා හේතු කියල. ඒ ඇටය ඒ ශක්තිය උපයෝගී කරගෙන අඹ පැලයක් හැදෙන්න අවශ්‍ය කරන සුදුසු පරිසරයට කියනවා ප්‍රත්‍ය කියල. එහෙම නැත්නම් පත්ති කියල. දැන් කොච්චර සුදුසු පරිසරයක්, සාරවත් පසක් තිබුණත්, අවශ්‍ය බීජය නැත්නම් වැඩක් තියෙනවද? ඒ කියන්නෙ ප්‍රත්‍ය දුන්නට, ප්‍රත්‍ය තිබුනට හේතු නැත්නම් ඵලයක් හටගන්නෙ නෑ. ඒ වගේම තමයි කොච්චර හේතු තිබුනත් ප්‍රත්‍ය නැත්නම් ඒත් ඵලයක් හටගන්නෙ නෑ. කෙනෙකුට දිව්‍ය සම්පත් විඳින්න හේතු තියෙන්න පුළුවන්. ඒත් දෙව්ලොව උපන්නෙ නැත්නම්, ඒ ප්‍රත්‍ය නැත්නම්, පරිසරය නැත්නම්, ඒ සම්පත් ලැබෙන්නෙත් නෑ, භුක්ති විඳින්නත් බෑ. ඒ කියන්නෙ ඒ පුද්ගලය ඉන්නෙ මනුස්ස පරිසරයක, මනුස්ස ප්‍රත්‍ය තියෙන තැනක නම්, හැම තිස්සෙම ඇදිල එන්නෙ, ලැබෙන්නෙ මනුස්සයෙකුට සුදුසු දේවල්. පින් දෙන කොටත් ඒ වගේ. අපි පින් දෙන කෙනා ජීවත් වෙලා ඉන්නවද මැරිලද කියන එක නෙවෙයි අදාල වෙන්නෙ. ඒ පුද්ගලයට හේතු තියෙනවද කියන එක. මොකද අපි දෙන්නෙ ප්‍රත්‍ය මිසක් හේතු නෙවෙයි. අපි ප්‍රත්‍ය දෙනකොට ඒ පුද්ගලයට හේතු තියෙන්න ඕන ඒකෙන් ප්‍රතිඵලයක් ලබන්න.

කෙනෙක්ගෙ හිතේ මෙහෙම අදහසක් තියෙනවා. ''සංඝයා වහන්සේලාට දන් දීල වැඩක් නෑ. ඒ අයට මොකට දෙනවද? ඒ අයට හැම තිස්සෙම ලැබෙනවනේ ! ඔය ඕන තරම් පන්සල්වල ගොඩ ගහල තියෙන්නෙ ! මම දැක්කා ඕන තරම් කෑම බීම තියෙනවා, මොකට දෙනවද? දෙනව නම් කන්න නැති කෙනෙකුට දෙන්න ඕන. එක්කො හිඟන්නෙකුට, එහෙම නැත්නම් ළමා නිවාසයකට වගේ තැනකටයි දෙන්න ඕන.''

එතකොට ඒ පුද්ගලය නිතරම ගොඩ නගන්නෙ, හාමුදුරුවන්ට දන් දීල වැඩක් නෑ කියන ශක්තිය. ඒකම තමයි අධිපති වෙලා තියෙන්නෙ. ඒ කිව්වෙ ඒ සිතිවිල්ල තමයි හිතේ රජ කරන්නෙ. ඒ ශක්තියමයි ඒ පුද්ගලයට බල ගැන්විලා තියෙන්නෙ. ඔහු ගොඩනගන හේතු වෙන්නෙ, හාමුදුරුවන්ට දන් දීල වැඩක් නෑ කියන එක. දැන් ගෙදර අය සංඝයා වහන්සේලා වඩම්මවල දානයක් දීල මේ මනුස්සයට පින් දෙනවා. ඒ කිව්වෙ පත්ති දානයක් දෙනවා. දැන් ඒ මනුස්සයගෙ හිතේ තියෙන්නෙ මොනවද? එහෙම නැත්නම් ගොඩ නගල තියෙන හේතු, මේ දුන්න ප්‍රත්‍යයට ගැලපෙනවද? ඔහුට ඒ දුන්න ප්‍රත්‍යයෙන් සතුටට පත්වෙන්න පුළුවන්ද? ඔහුට ඒ පින්කමට සතුටු වෙන්න හේතු තියෙනවද? නෑ. ඔහුට ඒ ප්‍රත්‍යයෙන් ප්‍රයෝජනයක් ගන්න හේතු නැත්නම් ප්‍රත්‍ය දුන්නට වැඩක් නෑ.

ලෝකයේ අනුත්තර පින් කෙතක් වූ සංඝයාට දන් දීල වැඩක් නෑ කියන එක හරි බලවත් මිත්‍යා දෘෂ්ටියක්. ඒ දෘෂ්ටියේ ඉන්න කල් කොහොමත් ඒ වගේ පිනක් අනුමෝදන් වෙන්න බෑ. ඒ වගේම ඒ පින ලබන්නත් බෑ. මොකද ඒකට හේතුවක් ගොඩ නගල නැති නිසා. හරියට අඹ ඇටයක් අතේ තියාගෙන ඉන්න කෙනෙකුට නෙළුමක් හැදෙන්න ඕන කරන පරිසරයක් දුන්න වගේ දෙයක්. කිසිම ප්‍රයෝජනයක් ගන්න බෑ. දැන් කාරණය පැහැදිලියි. පින් දෙන කොට හෝ පින් අනුමෝදන් කරවන කොට ඒ පුද්ගලය ජීවත් වෙලා ඉන්නවද නැත්ද කියන එක නෙවෙයි වැදගත්. ඒකට වැදගත් වෙන්නෙ ඒ පුද්ගලයට ඒ පින ගන්න හේතු තියෙනවද නැද්ද කියන කාරණය. ඒ වගේම දැන් පැහැදිලියි කලින් කිව්ව අවස්ථාව. බුදුන් වහන්සේ ජීවත් වෙලා ඉන්න කෙනාට කරපු පුණ්‍යානුමෝදනාව.

ඉතින් ලොව්තුරා බුදුන් වහන්සේ මුලින්ම මේ ගාථාව දේශනා කළා.

පණ්ඩුපලාසෝව දානිසි
යමපුරිසාපි ච තං උපට්ඨිතා
උයෝගමුඛෙ ච තිට්ඨසි
පාථෙය්‍යම්පි ච තේ න විජ්ජති

සරල සිංහල තේරුම,

ඔබ නැට්ටෙන් ගිලිහී බිම වැටෙන්න තියෙන ඉදුණු පඬුවන් වූ කොළයක් වැනිය. යම දූතයෝත් දැන් ඔබ ළඟට අවුත් සිටිත්. ඔබ දැන් මැරෙන්නට ළඟය. ඔබ දැන් ඉන්නේ පිරිහීම් දොරටුවේය. පරලොවට යන ඔබට කුසල් නමැති මග වියදමකුත් නැත.

ලොව්තුරා බුදුන් වහන්සේ මේ මහළු මනුස්සයට මුලින්ම කළේ ඔහු ඉන්න තැන පෙන්වා දීම. ඔහු සාමාන්‍ය මනුස්සයෙක් විදිහට රත්තරන් ආභරණ හදාගෙන ජීවත් වුනා. ඔහුගෙ පියා වගේ පවුකාරයෙකුත් නෙවෙයි. ඒත් කරගත්ත පිනකුත් නෑ. හොඳටම වයසටත් ගිහින්. පිනක් කරගන්න පන්සලකට යන්න හෝ ඒ වගේ දෙයක් කරගන්න ශක්තියකුත් නෑ. හරියට නටුවෙන් ගැලවෙන්න ඔන්න මෙන්න කියල තියෙන වේලිච්ච කොළයක් වගේ. මේ කාරණය තමයි උන්වහන්සේ පෙන්නුවෙ. ඒ වගේම යම දූතයො ඇවිත් ඉන්නවා එක්ක ගෙන යන්න. මැරිල යන්න ඉන්න තැනත් පැහැදිලියි. කරගත්ත පිනකුත් නෑ. ලොව්තුරා බුදුන් වහන්සේ යම් දේශනාවක් කරන කොට, ඒ දේශනාව අහන කෙනාට දෙන්න ඕන හැඟීම උපරිමයෙන් ලැබෙනවා. එක්තරා දේශනාවක් භික්ෂූන් වහන්සේලාට කරත්දි උන්වහන්සේලා ලේ වමනෙ කරල වැටුන කියල ධර්මයේ සඳහන් වෙනවා. ඒ කියන්නෙ ඒ පාපයේ බරපතලකම, යන්න ඉන්න තැන, විඳින්න සිද්ධ වෙන දුක් කන්දරාව, ඒ හැඟීම් 100% ක්ම ඒ බණ අහන කෙනාට දෙන්න උන්වහන්සේට පුළුවන්.

මෙතනදිත් කළේ එහෙම වැඩක්. ඒ මහළු මනුස්සය ඒ මොහොතෙ කොච්චර නම් අසරණද කියල පෙන්නුවා. පිනක් කරගන්න කාලයකුත් නෑ, ශක්තියකුත් නෑ. ඒ වගේම කරගත්ත දේකුත් නෑ. හරියට ගමනක් යන්න ලෑස්තියි, යන්න වාහනේ ඇවිත් තියෙන්නෙ. ඒත් ගමනට අවශ්‍ය ආයිත්තම් මොකවත් නැති, මග වියදමට සල්ලිත් නැති, ඒවා හොයා ගන්න කාලයකුත් නැති කෙනෙකුට දැනෙන හැඟීම වගේ හැඟීමක් තමයි උන්වහන්සේ අර මහළු මනුස්සයට දුන්නෙ. ඒ මනුස්සයගෙ හිතේ මහා සංවේගයක් ඇති කළා. ප්‍රශ්නයක් ඇති කළා. දැන් මම මොකද කරන්නෙ ? ඉතින් ඒ ප්‍රශ්නයට තමයි උන්වහන්සේ මේ ගාථාව දේශනා කළේ.

සො කරොහි දීපමත්තනො
ඛිප්පං වායම පණ්ඩිතො භව
නිද්ධන්තමලෝ අනංගණෝ
දිබ්බං අරියභූමිමේහිසි

සරල සිංහල තේරුම,

ඔබ දැන් තමහට කුසල් නමැති පිහිටක් කර ගනුව. වහ වහා වෑයම් කරව. තමාට උවමනා කුසල් නමැති පිහිට සාදා ගැන්මෙහි සමත් වෙව. රාගාදී කෙලෙස් මළ දුරු කොට නිකෙලෙස් තැනැත්තෙක් වැ දිව්‍යමය ආර්ය බිමට පැමිණෙව.

මේ විදිහට කරගන්න දෙයක් නැතිව හිටපු ඒ මහළු මනුස්සයට ක්‍රමයක් පෙන්නුවා. මහා කුසලයක් සුළු මොහොතකින් කරගන්න හැටි පෙන්නුවා. අනුන් වෙනුවෙන් නෙවෙයි, තමන් වෙනුවෙන් කරගන්න කියලයි පෙන්නුවෙ. ඒ මොහොතේ ක්‍රමයක් හිත හිතා හිටපු කෙනාට, ආ මේ තියෙන්නෙ ගැලවෙන ක්‍රමයක් කියල පෙන්නුවම, කතා දෙකක් නැතිව ඒක පිළිගන්නවා. මොකක්ද පෙන්නපු ක්‍රමය. ආර්ය භූමියට එන හැටියි පෙන්නුවෙ. මොකක්ද මේ ආර්ය භූමිය කියන්නෙ? මොකක්ද එතන තියෙන ආරක්ෂාව? ධර්මයේ සඳහන් උපමා කතාවක් තියෙනවා. මහ පොළවෙ ගල් කැටවලින් කුඩු හදන කුරුල්ලෙක් ඉන්නවා. මහ පොලොව ආශ්‍රිතව තමයි මේ කුරුල්ලා වැඩිපුරම ඉන්නෙ. ගල් කැටවලින් හදපු කුඩුවක තමයි ඉන්නෙ. ආරක්ෂිත තැනක්. තමන්ගෙ පියාගෙන් උරුම වෙච්ච තැනක්. පියාගෙ භූමිය බාහිර උපද්‍රවවලින් ආරක්ෂාවක් තියෙන තැනක්. හරියට කියනව නම්, ඒ කුරුල්ලව ගොදුරු කරගන්න ඉන්න සතුන්ගෙන් ආරක්ෂා වෙන්න පුළුවන් තැනක්.

ඉතින් දවසක් මේ කුරුල්ලා එළියට ඇවිත් ඈතට පියාඹල ගියා. ඒ අතර තුර මේ කුරුල්ලව උකුස්සෙක් ඩැහැගත්තා. දැන් මරණයත් ජීවිතයත් අතර ඉන්න මේ කුරුල්ලට කියවුනා, මම පියාගෙ භූමියේ හිටිය නම් මට මේ අනතුර වෙන්නෙ නැහැනෙ කියල. උකුස්සට මේක ඇහිල ඇහුවා, ඒ කොහෙද ඒ පියාගෙ භූමිය, උඹ එතන හිටියත් මට උඹව අල්ල ගන්න එක මහ ලොකු දෙයක් නෙවෙයි කියල. ඉතින් මේ කුරුල්ලා අර ගල් කැටවලින් හදපු කුඩුව තියෙන තැන කිව්වා. උකුස්සා නැවතත් ඒ කුඩුව ගාවට ගෙනත් කිව්වා, උඹ මෙතන හිටියත් මම අල්ල ගන්නව කියල. ඉතින් කුඩුව ගාව ඉන්න කුරුල්ල අල්ලන්න කියල නැවතත් උකුස්ස කුරුමාණමක් අල්ලල පහලට පියෑඹුවා. උකුස්සා ළංවෙන කල් ඉඳල මේ කුරුල්ලා කුඩුව ඇතුලට රිංගුවා. උකුස්සට වේගය පාලනය කරගන්න බැරිව අර කුඩුවේ ගල් කැටවල පපුව වැදිල එතනම මළා.

මේක උපමා කතාවක්. උකුස්සා කියන්නෙ හරියට අපිට බාහිරව එන මාර පාක්ෂික දේවල් වගේ. ඒවට වටිනාකම් දෙන්න ගිහින්, ඒවට ඇලෙන්න ගිහින්, විරුද්ධව එන දේට ගැටෙන්න ගිහින් තමන්ම විනාස කර ගන්නවා. එතකොට මෙතන පියාගෙ භූමිය කියල උපමා කළේ සතර සතිපට්ඨානය. සිත, කය, වචනය සංවර කරගැනීම. පියාගෙ භූමිය, එහෙම නැත්නම් සතර සතිපට්ඨානය වඩන කෙනෙකුට අර බාහිර මාර පාක්ෂික බලවේග ගැන බය වෙන්න දෙයක් නෑ. හැම මොහොතෙම සිත, කය, වචනය රාග, ද්වේශ, මෝහවලින් සංවර කරගෙන ඉන්නෙ. දැන් ඒ භූමියට, බුද්ධ භූමියට, එහෙම නැත්නම් ආර්ය භූමියට එන මූලික අඩිතාලම තමයි ලොව්තුරා බුදුන් වහන්සේ මේ මහළු මනුස්සයට හදල දුන්නෙ. තුන් ලෝකයේම වැඩ වසන ඉහලම සත් පුරුෂයා ඒ මොහොතෙ හිටියෙ.

ඒ වගේම ධර්ම දේශනා කරන මොහොතක්. බණ අහන කෙනා ක්‍රමයක් හොය හොයා ඒ කියන කියන දේට නුවණ යොදන මොහොතක්. කිසිම දස අකුසලයක් හෝ ඒ අකුසලයන් කරවීම, අනු බල දීම හෝ වර්ණනා කිරීමකුත් නෑ. කොටින්ම සත් පුරුෂ සංසේවනය, සද්ධර්ම ශ්‍රවණය, යෝනිසෝමනසිකාරය සහ ධම්මානුධම්ම ප්‍රතිපදාව තියෙන මොහොතක්. සෝවාන් වෙන්න අවශ්‍ය කරුණු හතරම පිරුණු මොහොතක්. ඒ වගේම බණ අහන මොහොතක් කියන්නෙ සප්ත බොජ්ජංග ධර්ම හතම එකට වැඩෙන මොහොතක්. කිසිම භාවනාවකට ඒක සම කරන්න බෑ. ලොව්තුරා බුදුන් වහන්සේ නමකගෙන්, උන්වහන්සේගෙ ශ්‍රී මුඛයෙන් හේතුවක් නැතුව වචනයක් පිටවෙන්නෙ නෑ. ඒ හැම වචනයකම චතුරාර්ය සත්‍යය හැර වෙන යමක් නෑ. ඉතින් සියල්ලෙන් සම්පූර්ණ දේශනාවක්. මේ මහළු මනුස්සයා එතනදි සෝවාන් වුණා. කෙනෙක් සසරේ විඳින දුකක් ඇත්නම්, ඒ විඳින සියළු දුක්වලට වඩා වැඩියි සතර අපාගත දුක. ඒ මහා දුකෙන් අර මහළු මනුස්සය එදා ගැලවුණා, ආර්ය භූමියට ආවා.

*වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු සමග ධම්ම පද පාළිය - මල වග්ගය ඇසුරින් සකස් කළේ :*

**ෆික්රි ඉස්මයිල්**
පරිගණක ඉංජිනේරු - ගොතටුව
072-7536839

# ඉපදීම හෙවත් ලෝකයේ පහළ වීම

## ලෝකෝත්තර ඇසින්...

ඉපදීම කියන වචනය අපි නිතර අහල තියෙනවා. නිපදවීම, පහළ වීම, හට ගැනීම, ජාති, සම්භව ... ආදී නොයෙක් වචනවලින් ඒ කාරණය හඳුන්වනවා. මේ ඉපදීමත් සජීවී හා අජීවී කියල කොටස් දෙකක් තියෙනවා. මේ මොන ආකාරයේ ඉපදීමක් හෝ අහම්බෙන් සිද්ධ වෙන්නෙ නෑ. හැම ඉපදීමකටම හේතුවක් තියෙන බව ධර්මානුකූලව තේරුම් ගන්න ඕන.

හේතුවකින් පහළ වන රූපයන්ගේ පළමු පහළ වීම උපචය කියන නමින් හඳුන්වනවා. ඒ කියන්නෙ යමක් ගොඩ නැඟීම. පටන් ගත්ත තැන් පටන් ඒක ගොඩ නැගී නැගී යනවා. ළමයෙක්ගෙ උපතේ පටන් ගෙන තරුණ වයසට යන කල් තියෙන්නෙ ගොඩ නැඟීම. ඒ ගොඩ නැඟීම උපචය අවස්ථාව. ඒ කියන්නෙ උප්පාදනය වෙනව කියන එක. උපචය වුනාට පස්සෙ ඒ අවස්ථාව ඉක්ම යනවා. ගහක් කොළක් වුනත් වැඩෙන කාලය උපචය. වැඩුනට පස්සෙ මෝරන කාලයක් එනවා. ඒක සන්තති අවස්ථාව. ඊට පස්සෙ එන්නෙ ජරතා අවස්ථාව. අන්තිමට අනිච්ඡ තාවය හෙවත් විනාස වීම. කැමති සේ නෑ කියන කාරණයෙම එක ලක්ෂණයක් තමයි මේ. කැමති දෙයත් මොහොතකින් බිඳිල යනවා. නිත්‍ය නැති තැන අනිච්ඡ කියලත් යෙදෙනවා.

කිසියම් රූපයක් යම් ශක්තියකින් පහළ වුණා නම් ඒ සමගම ඒ රූපයේ පහල වූ ස්වභාවය බිඳිල යනවා. ක්ෂණයක් කියන ඉතාමත් කෙටි කාල මාත්‍රයක් තුළ හට ගැනීමත්, පැවැත්මත් (සන්තති අවස්ථාව), ජරපත් වීමත්, විනාසයත් (අනිච්ඡතාවයත්) කියන කාරණා හතරක් තිබුණත්, අපට ඒ වෙනස මස් ලේ ඇහින් බලා ගන්න බෑ. ඒ තරම් සියුම්, අධි වේගවත්. හටගත් රූප ක්ෂණයකින් වැනසුණත්, අපේ මස් ලේ ඇහැට නොපෙනෙන අංශු මාත්‍ර වූ රූප කලාප සම්පිණ්ඩනයක් වූ ඒ රූප, එතැන් පටන් ක්‍රමයෙන් අවිද්‍යමාන වෙනවා. ඒ කියන්නෙ හට ගැන්වීමේ ශක්තියෙන් ගිලිහිලා ගියාට පස්සෙ, ඍතු විපර්යාස ආදී බලපෑම්වලට ලක් වෙමින් දිර දිරා යන කොට ජරතා රූප දිස්වෙමින් ඒ රූප සම්පිණ්ඩනය සම්පූර්ණයෙන් දිරා යන කල්, නොයෙකුත් ආකාරයන් විද්‍යමාන කරමින් කෙළවර කරනවා.



මේ කාරණය උදාහරණයකින් තේරුම් ගන්න පුළුවන්.

පාන් ගෙඩියක් නිෂ්පාදනය කළා නම්, දැන් අපිට උණු උණුවේ තියෙන අලුත් පාන් ගෙඩියක් පේනවා. ඒක එහෙම පේන්න වුනේ, බිහි වුණේ, ශක්තියක් යොදල අවශ්‍ය ද්‍රව්‍ය එකතු කරල සකස් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන්. දැන් මේ පාන් ගෙඩිය නිකං තියෙන්න හැරියොත් මොකක් වෙයිද? ටික වෙලාවකින් ඒකෙ තිබිච්ච නැවුම් සුවඳ රස්නෙ ගතිය අඩු වෙලා යනවා. ඒ ඇයි? ඒක නිපදවන්න දුන්නු ශක්තිය දැන් ඒ තුළ ක්‍රියාත්මක නොවන නිසා. ශක්තිය යෙදෙව්වෙ පාන් ගෙඩිය නිපදවීමට නිසා, නිපදවුනාට පස්සෙ නැවතත් ඒ සඳහා කළ යුත්තක් නැති නිසා, දැන් සිද්ධ වෙන්නෙ පහළ වූ ජාතියකට හෙවත් නිපදවුණු දෙයකට උරුම වෙච්ච ක්‍රියාවලිය වන දුර්වල වෙලා විපරිණාමය වෙලා විනාසයට පත් වීම ක්‍රියාත්මක වීම.

දැන් නිවුණු පාන් ගෙඩියට මොකක් වෙයිද? වරුවක් යන කොට උදේ තිබිච්ච මුදු මොලොක් ගතිය, රස ගතිය වෙනස් වෙලා යනවා. මේ වෙනස් වීම අහවල් මොහොතෙ සිද්ධ වුනා කියල නිගමනය කරන්න බෑ. මොහොතක් නැර අඛණ්ඩව සිදු වෙච්ච ක්‍රියාවලියක ප්‍රතිඵලය විදිහට වරුවකින් පසු තත්ත්වයට ඒ පාන් ගෙඩිය පත් වෙලා තියෙන බව පේනවා. දැන් ඒ පාන් ගෙඩියට දින දෙක තුනක් හෝ හතරක් ගතවුනා කියල හිතුවොත්, දිනෙන් දින සිද්ධ වෙන වෙනස්වීම් පෙර පරිදිම මොහොතක් මොහොතක් පාසා වූ වෙනස්වීම නිසා සිද්ධ වෙන බව අපට පේනවා. දින හතරක් පහක් පමණ යන කොට කොච්චර නම් ආකාරයන් අපට ඒ පාන් ගෙඩිය තුළින් දකින්න ලැබෙනවද? හරියට සුපරීක්ෂාකාරීව දහස් අවස්ථාවක් බැලුවත්, දහස් ආකාරයක් දැක ගන්න පුළුවන් බව පැහැදිලියි. පුස් බැඳිල, පාට වෙනස් වෙලා, ඇකිලිලා.... ආදී වශයෙන් මස් ලේ ඇහැට පේන වෙනස්කම් වගේම නොපෙනෙන වෙනස්කම් රාශියකුත් ඒ තුළ තියෙනවා. නිෂ්පාදන මොහොතෙදි දැක්ක පළමු ආකාරය හැරුනම ඉතිරි සියලු ආකාරයන්ම අපි දක්කෙ හටගත් දෙයකට සිද්ධ වෙන විපරිණාමය නිසා.

දැන් අපි මේ විදියටම ලෝකය දිහා බැලුවොත්, හට ගැනීම පූර්ණ වූ අවස්ථාව විදිහට දක්කෙ ක්ෂණයක්. එතැන් පටන් තියෙන්නෙ විපරිණාමික දර්ශනයන්. අපි යම් කිසි ශරීරයක් දිහා බැලුව නම් අපට පේන්නෙ ☞

මොකක්ද? හැඩයි, රුවයි, ලස්සනයි, කැතයි, තලඑළලුයි ... ආදී වශයෙන් නිගමනයන්ට බහින්නෙ, ඒ මොහොතේ ඉන්න කෙනෙක් විදිහට අදහස් අරගෙන. නමුත් මේ විදිහට හමේ වර්ණ ස්වභාවය විදිහට අපි දැකල තියෙන්නෙ අලුතින් නිපදවෙන හමද, එහෙමත් නැත්නම් දිරමින් ගෙවෙමින් පවතින, ඉවතට යන, විපරිණාමයට පත් වෙලා වැනසෙන හමද ? හොඳින් බුද්ධිමත්ව හිතල බැලුව නම්, කිසිවිටකත් අලුතින් නිපදවෙන හමක් අපි දැකල නැති බව වැටහෙනවා.

මේ විදිහට ගහක් අරගෙන බැලුවත්, ගහේ පොත්තෙ වැඩීම කඳ සමග අලුතින් සිද්ධ වන අතරම, දිර දිරා විපරිණාම රූප විදිහට පිට කුරුට්ට තමයි අපට පේන්නෙ. කළු ගලක් දිහා බලන කොටත් උඩින් දිර දිරා කැබලි ගැලවෙමින් වර්ණය වෙනස් වෙමින් දිරාපත් වන විපරිණාම කොටසමයි අපට පේන්නෙ. ගෙයක් දිහා බැලුවත් පාසි බැඳෙමින් දිරන දුර්වර්ණ වන විපරිණාමයට යන අවස්ථාවමයි පේන්නෙ.

එහෙනම් ලෝකයේ මේ දකින්නෙ මොනවද? ශක්තියකින් උපදවන දේ මුලින්ම ඉපදෙනවා. ඊට පස්සෙ නිපදවූ වස්තුව අවිද්‍යමාන වෙනකල්ම, සම්මත නාමයෙන් කතා කරන්න බැරි වෙන කල්ම රූපය විපරිණාමය වෙනවා. නමුත් අපට නිතර පේන්නෙ මේ ඉපදෙන මොහොතේ රූප නෙවෙයි, ගෙවෙන දිරන විපරිණාම වන රූප. මේ විදිහට පේන්නෙ රූප එකක්ද, නැත්නම් විපරිණාම රූප වැලක්ද? කොයි මොහොතකවත් අපිට මේ රූප එකක් දකින්න බෑ? ඇයි? මේ එක රූපයක ආයුෂ අංශු මාත්‍රයක්. ඒ රූප මාත්‍රයක් ඇහින් බලල මෙනෙහි කරන්න පෙර ගෙවිල යනවා. එක තත්පරයක් තුළ ඇති වන මේ රූප මාත්‍ර කෝටි ගණනිනුත් කියන්න බෑ. රූප මාත්‍රය දැනෙන මොහොතෙම ඒක ගෙවිල අවිද්‍යමාන වෙලා අනික් විපරිණාම රූපයක් දිස්වෙනවා. එහෙනම් අපි දකින්නෙ මොනවද? **තත්පරයක් තුළත් අපට දැකීම විදිහට වැටහෙන්නෙ ගෙවී ගිය රූප මාත්‍රයන්ගෙ මතක සටහන්. ගෙවෙන රූප කලාප රටාවක් ඇසුරේ, මොහොතක මතක සටහන්.**

අපේ ඇහින් අතීතය කරා ගිහින්, ක්ෂණයකින් ගෙවිල යන රූපය බලන්න බෑ. ඇහැට රූපය ගැටෙන කොටම ඒ ස්පර්ශයත්, ඒකෙ වේදනාව හෙවත් දැනීමත්, හැඟීමත්, ඒ සමග එකතු වෙලා උපදින චක්ඛු විඤ්ඤාණයත්, එකිනෙකට ඇඳුණු පබලු පොටක් වගේ සුදුසු විදිහට යෙදෙන චෛතසික ධර්මත් පහල වෙලා, ඒ රූප කලාපයේ වැනසීමත් සමග අවසන් වෙනවා. ඒ අවස්ථාවෙදි ගත්තු අරමුණු පිළිබඳව නාම ගෝත්‍ර හෙවත් මතක සටහන් ගනිමින්, මනෝ විඤ්ඤාණයේ ඇති වන අතීත මතක සටහන් දකින ශක්තිය නිසා ඒවායේ ගති ස්වභාවය එකතු කරමින්, ඉදිරියට යන චිත්ත පරම්පරාව නිසා එවෙලෙම දකින ස්වභාවයක් විදිහට අපට දැනෙනවා.

මතක සටහන්වල ඇසට ගැටුණ රූපවලින් ගත් යමක් ඇත්ද, ''චක්ඛුංච පටිච්ච රූපේච උප්පජ්ජති චක්ඛු විඤ්ඤාණං'' ඇසට රූපයක් කැමැත්තෙන් බැඳෙන කොට චක්ඛු විඤ්ඤාණය පහල වෙනවා. මෙතනදි පටි කියන්නෙ බැඳීම. ඉච්ච කියන්නෙ කැමැත්ත. තවත් විදිහකට කියනව නම්, අන්‍යෝන්‍ය සහසම්බන්ධතාවයට සුදුසු දේ එකිනෙකට ගැලපී සිටීම. රහතන් වහන්සේටත් විපාක විඤ්ඤාණ තියෙන නිසා මෙතනදි වඩාත්ම ගැළපෙන්නෙ කැමැත්තෙන් බැඳීමට වඩා ගැලපී සිටීම කියන කාරණය. මොකද උන් වහන්සේට කැමැත්තෙන් බැඳීමක් නෑ. නමුත් ගැලපීම කියන එක තියෙනවා.

උදාහරණ විදිහට ඇහැට රූප ගැලපෙනවා. හැබැයි ශබ්ද, ගන්ධ ආදිය ගැලපෙන්නෙ නෑ. ඒ වගේම කනට ශබ්ද ගැලපෙනවා. නමුත් රූප, ගන්ධ ආදිය ගැලපෙන්නෙ නෑ. ඒ කියන්නෙ දැනෙන ස්වභාවය. ඒ අර්ථයෙන් මේ ගැලපීම පටිච්චයි. කැමැත්තෙන් බැඳෙනවා කියන්නෙත් ගැලපී සිටීම. ඒ නිසා වචනවල යෙදීම් අවස්ථානුකූලව තේරුම් ගන්න ඕන. ''තින්නං සංගති ඵස්සෝ'' මේ ඇසත්, රූපයත්, චක්ඛු විඤ්ඤාණයත් කියන තුන ගැලපීමේ ක්‍රියාවෙන් ස්පර්ශය ඇති වෙනවා. ''ඵස්ස පච්චයා වේදනා'' ඒ ස්පර්ශය නිසා වේදනාව හෙවත් දැනීම ඇති වෙනවා. මේ තමයි බුද්ධ වචනය. යම් හිතක් පහළ වෙන කොටම පෙර පසු නොවී ස්පර්ශ, වේදනා, සංඥා, චේතනා, ඒකාග්‍රතා, ජීවිතේන්ද්‍රිය, මනසිකාරය කියන චෛතසික ධර්ම සමග සුදුසු පරිදි තවත් චෛතසික ධර්මත් පහල වෙලා විඤ්ඤාණය භංග වෙන කොටම ඒ චෛතසික ධර්මත් භංග වෙනවා.

මෙතනදි ඒකාග්‍රතාවය කිව්වම චිත්ත ඒකාග්‍රතාවය එකක්. කායික ඒකාග්‍රතාවය තව එකක්. කයේ නිශ්චල බව කායික ඒකාග්‍රතාවයට අයිති වෙනවා. ඕනම වැඩ කටයුත්තකට ඒකාග්‍රතාවය කියල දෙයක් තියෙනවා. හිත යම් කිසි දේකට අවධානය යොමු වෙලා පිහිටිය නම් ඒකත් ඒකාග්‍රතාවයක්. ඒ වගේම නාම ජීවිතේන්ද්‍රියයි, රූප ජීවිතේන්ද්‍රියයි කියල දෙකක් තියෙනවා. නාම ජීවිතේන්ද්‍රියෙන් හිතක් ජීවත් කරවනවා. හිත ජීවත් කරවන්න නම් ඒකට චෛතසික ඕන. ගත ජීවත් කරවන්නෙ රූප ජීවිතේන්ද්‍රියෙන්. කන බොන ආහාර වැටෙන්නෙ කයට. ඒ සඳහා රූප ජීවිතේන්ද්‍රිය පවතිනවා. ඒ රූප ජීවිතේන්ද්‍රිය මුළු ශරීරය පුරාම ඇසුරු කර ගෙන පවතිනවා. නාම ජීවිතේන්ද්‍රිය කර්මජ කය ඇසුරු කර ගෙන වස්තු රූපයත් එක්ක පවතිනවා. කර්මජ කයත් රූප. ඒක ඇසුරු කරගෙන තමයි නාම ජීවිතේන්ද්‍රිය පවතින්නෙ. රූපයයි නාමයයි 2 එකතු වෙන්නෙ නෑ. වෙන වෙනම යෙදෙන්නෙ. ඒ කියන්නෙ විප්පයුක්ත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍ය වෙන්නෙ.

ජනක යන්ත්‍රයකින් විදුලිය උත්පාදනය කරනව වගේ වස්තු රූපයේ නිර්මාණයන් තමයි විහිදෙන්නෙ. එතකොට ජනක යන්ත්‍රය විදුලි බුබුලට සම්බන්ධයි. රැහැන් දිගේ විහිදෙන ශක්තිය වෙනම සම්බන්ධයි. අපේ ශරීරයෙත් නාම ජීවිතේන්ද්‍රිය ක්‍රියාත්මක වෙන්නෙ විදුලියක් වගේ. ස්නායු පද්ධතිය රැහැන් පද්ධතියක් වගේ එක පැත්තකින් සම්බන්ධයි. ඊළඟට අතරින් පතර විහිදිලා හැම තැනම වටේට ඔරා වළල්ලක් තියෙනවා. ඒවා විවිධාකාර හැඩතලයන්ගෙන්, වර්ණයන්ගෙන් ශක්තියක් බවට පත්වෙනවා. නාම ජීවිතේන්ද්‍රියෙන් රූප ජීවිතේන්ද්‍රිය හැම තිස්සෙම හැඩගස්සනවා. මේ නාම ජීවිතේන්ද්‍රිය දිවැසකට හැර ඒක අති සියුම් නවීන සූක්ෂම උපකරණයකටවත් අහුවෙන්නෙ නෑ. එතකොට ඒ කර්ම, චිත්ත දෙක තමයි නාම ජීවිතේන්ද්‍රිය කියන්නෙ. ඒක කර්මජ රූප, චිත්තජ රූප කියන දෙක ඇසුරු කර ගෙන තමයි පවතින්නෙ.

☞

ඊළඟට මන ඉසි කරන එක තමයි මනසිකාර කියන්නෙ. මන කියන්නෙ යම් කිසි මිනුම් දණ්ඩක් අරගෙන මැන ගැනීම. මොකද ඒකට අවශ්‍ය දේවල් එකතු කර ගන්න. අහවල් එක මෙහෙමයි, මේ හැඩයි කියල මිනිස් මිනුමක් තියෙනවා. යමක් ගොඩ නගන්න නම් ඒක ඉසි කර කර හිත් තියන්න ඕන. ඉසිකාර කියන්නෙ ගොඩ නගනවා. උදාහරණයක් විදිහට මනුස්සයෙක් හිතින් මලක් හදනවා. ඒ මල ගොඩ නැගෙන්න ඉස්සෙල්ලම මල කියන සංඥාව එන්න ඕන. ඒ සංඥාවට අනුව හිත් තියනවා. ඉස්සෙල්ලම රූපයක් හිතට ගන්න එක තමයි කරන්නෙ. හිත් වැඩි කරල ඒ රූපයට අවශ්‍ය ප්‍රමාණයට තියනවා, ඒ කියන්නෙ මන ඉසිකාර කරනවා, හිත් ඉසි කරනවා, මැන මැන ඉසි කරනවා, හැම තැනම තියල පතුරුවනවා. ඒක හිතේ ස්වභාවයක්.

මේ කියන්නෙ සතර මහා භූතයන්ගෙන් හැදෙන රූප නෙවෙයි, ඒ සතර මහා භූතයන්ගෙන් හැදෙන රූපවල පිටපතක්. ස්පර්ශ වෙච්ච දේකට වේදනා සංඥා එනවයි කියන්නෙ ඒ ස්පර්ශ වස්තුව නෙවෙයි. අපේ මනසෙ හැදෙන එකක්. අපි එක වතාවක් යම් කිසි රූප ස්පර්ශයක් ගත්තොත්, ඊළඟට ඒකෙන් නාම ධර්මයක් හැදෙනවා. එතකොට අර ස්පර්ශ කරපු බාහිර රූපය වෙනම තියෙනවා. ඒක බිඳී බිඳී යනවා. මනසින් නාමය අල්ල ගත්තට පස්සෙ දැන් බාහිර එකත් එක්ක සම්බන්ධයක් නෑ.

සතිපට්ඨාන සූත්‍රයේ හොඳින් පෙන්වා තියෙන්නෙ, ඇස මුල් කර ගෙන හටගත් චක්ඛු විඤ්ඤාණය කොතැනකවත් නොයා ඇසේම හටගෙන ඇසේම පැවතිලා ඇසේදිම විනාස වෙන බව. හැබැයි මෙතනදි ඇසේ හට ගන්නව කියන්නෙ ඇස මුල් කර ගෙන හට ගත්ත නම් ඒ ඇස මුල් කර ගත්තු හිත. ඇසත් එක්කමයි ඒ හිතත් සම්බන්ධ වෙන්නෙ. සංඥාව ගන්නවත් එක්කම ඒක හැදෙනවා. මේ කියන්නෙ අර කලින් වගේ බාහිර මස් ලේ ඇස නෙවෙයි. ඇසේ තියෙන ප්‍රසාද රූප. ඒ නිසා ඇස කිව්වම ඒ කාරණය මොකක්ද කියල ඉස්සෙල්ලම විග්‍රහ කර ගන්න ඕන.

සංයුක්ත නිකායේ එන <u>සමුද්‍ර සූත්‍රයේ</u> ඇස මුහුදට උපමා කරල තියෙනවා. ඒ කියන්නෙ කොච්චර දම්මත් ඉවර කරන්න බැරි මුහුද වගේ. කොච්චර රූප ගෝචර වුනත් මුහුදක් වගේ ඉවරයක් නෑ. හැබැයි ඇසත් එක්ක බලද්දි මුහුදත් පුංචි ජලාශයක් වගේ. ඇස ඊටත් වඩා අප්‍රමාණයි. කොච්චර රූප ගත්තත් ඉඩ ඇහිරීමක් වෙන්නෙ නෑ. මතක සටහන් විදිහට තැන්පත් වෙනවා. මතක් කරල පසුව ගන්නත් පුළුවන්. ඒ අනුව ඇස කියන්නෙ පුංචි ගුලියක් නෙවෙයි කියල පෙන්වනවා. හැබැයි මස් ලේ ඇස කියන්නෙ නිකං ඇතුල් කරන දොරක් / ද්වාරයක් විතරයි. ඒ ඇස ගැන නෙවෙයි මේ කියන්නෙ. ඒ විදිහටම කන මුහුදක්, නාසය මුහුදක් කියල පෙන්වනවා. එතකොට විඤ්ඤා-ණයකින් තොරව යම් තැනක චෛතසික පවතිනවයි කිව්වොත් ඒක ධර්මානුකූල වෙන්නෙ නෑ. එහෙනම් මතක සටහන් කියන්නෙ මොනවද?

මේ සම්බන්ධයෙන් අද පවතින්නෙ මේ වගේ මතයක්. ලෝක සම්මත විද්‍යාඥයින්ගෙ මතයක් ගෙන හැර පාමින් ස්කන්ධ සංස්ථිති නියමය කියන සම්මතයක් ඉදිරිපත් කරමින්, හටගත් දෙයක් නැති වෙනවයි කියන්නෙ එහි මූල ධාතු නැති නොවී, වෙනත් ආකාරයකට පරිවර්තනය වීමක් මිසක් නැති වීමක් නෙවෙයි කියන මතය තමයි අද දක්වන්නෙ. මේක රූප ධර්ම සමග සසඳන කොට සතර මහා භූතයන්ට පරිවර්තනය වන බව බුදුන් වහන්සේත් පෙන්වා දීල තියෙනවා. නමුත් විඤ්ඤාණය මේ රූප ධර්ම ක්‍රියාවලියට ඈඳන්න බෑ. ඒක හරියට ගහක සේයාව ඡායාරූපයකට ගත්ත වගෙයි. ඡායාරූපයේ ගහේ කෑල්ලක්වත් නෑ. ඒක වෙනම වර්ණ සංකලනයක්. ''විඤ්ඤාණ පච්චයා නාම රූපං'' විඤ්ඤාණ ප්‍රත්‍යයෙන් නාම රූප වෙනවා. මේ නාම රූපවල තියෙන්නෙ මොනවද? ආකාර, නිමිති, උද්දේස, ලිංග, ප්‍රඥප්ති පිළිබඳ විඤ්ඤාණය හෙවත් දැනීම් ස්වභාවය. ආකාර කියන්නෙ යමක ආකාරය හෙවත් හැඩරුව. නිමිති කියන්නෙ විවිධාකාරයෙන් නිර්මාණය වන දේවල්. උද්දේස කියන කොට යමක් උදෙසා යන්න හැඟෙනවා. මෙතන ලිංග කියන්නෙ ස්ත්‍රී පුරුෂ නෙවෙයි. ඒ ඒ වර්ග හෙවත් වෙන් කිරීම. උදාහරණ විදිහට පොල් කියන්නෙ එක වර්ගයක්. පුවක් කියන්නෙ තවත් වර්ගයක්. මේ තමයි ලිංග. ප්‍රඥප්ති කියන්නෙ ලෝක සම්මතයෙදි ඒ ඒ දේට පනවා ගත් නම්.

ඊළඟට මනෝ විඤ්ඤාණය සමග නාම ගෝත්‍ර නමින් නොදිරන ශක්තියක් ඉහත කියපු නාම රූප නිසා මතු වෙලා එනවා. ඒකට මනෝ විඤ්ඤාණ ධාතු ශක්තිය කියලත් කියනවා. ''නාම ගොත්තං නජීරතී'' කියල සංයුක්ත නිකායේ (1) 80 පිටුවේ එන **නජීරතී සූත්‍රයෙන් කියන්නෙ සත්ත්වයන්ගෙ රූපය දිරන බවත්, නාම ගෝත්‍ර හෙවත් මතක සටහන් නොදිරන බවත්. උදාහරණ විදිහට අපේ මහ බෝසතාණන් වහන්සේ එදා දීපංකර බුදුන් වහන්සේ පාමුල සුමේධ නමින් විවරණ ගත් බවත්, ඒ විදිහට විවරණ ගත් ආකාරය එයින් කල්ප ගණනාවකට පසු බුදු වෙලත් නැවත සිහි කර ගන්න පුළුවන් වුණා. නමුත් ඒ විවරණ ගත් අවස්ථාවෙ ඇති වෙච්ච නාම ගෝත්‍ර හෙවත් මතක සටහන් දිරල තිබුණ නම් එහෙම මතක් කර ගන්න බෑ.**

මේ නිසා ලෝකයේ හටගත් සියල්ලම දිරනව කිව්වොත් ඒක ධර්මයට ගැළපෙන්නෙ නෑ. හැබැයි හටගත් එකක්වත් කැමති විදිහට පවත්වන්න බෑ කිව්වොත් ඒක නම් ධර්මයට එකඟයි. නාම ගෝත්‍ර හෙවත් මතක සටහන් පවා අපි කැමති විදිහට සිහි කරන්න බෑ. කැමති විදිහට පවත්වන්නත් බෑ. ඒවා දිරුවෙ නැති වුණාට අපට ඕන හැටියට, ඕන වෙලාවට මතක් කර ගන්නත්, අමතක කරන්නත් බෑ. මේ එක ධර්මයක්වත් කැමති විදිහට පවත්වන්න බෑ. අපි කැමතියි දැන් එන දෙයක් තියා ගන්න. ඒත් ඒක අමතක වෙලා ගෙවිල අතීතයට යනවා. නමුත් සටහන් වෙනවා. හැබැයි සටහන අමතක වෙනවා. ඒකට කැමති නෑ. එතකොට අලුත් එකක් හොයා ගන්නවා. ඒකත් ගෙවිල යනවා. ඒ විදිහට හදන හදන එක ගෙවෙන කොට නැවතත් අලුත් කරන්න වෙනවා, අලුතින් නිපදවන්න වෙනවා. ඉතින් මේ කැමති සේ නොපවතින ස්වභාවය නිසාමයි අපට දුක එන්නෙ. මේ නාම ගෝත්‍ර අයිති වෙන්නෙ ධර්ම කියන කොටසට. සබ්බේ ධම්මා අනත්තාති - සියලු ධර්ම අසාරයි කියල, මේවත් අනාත ධර්ම විදිහට බලන්න කියල පෙන්වා තියෙනවා.

(ඉතිරි කොටස ලබන කලාපයෙන්)

*වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*

**නීතිඥ චන්දන සිරිවර්ධන**


# ලොව සැමට එක සේ පොදු අනිච්චතාව 2

දුක්පත් පොහොසත්, බාල මහළු, ලොකු පොඩි, උස් මිටිකම් ... කිසිවක් නැතිව කාටත් එක සේ පොදු අනිච්චතාවයේ තවත් සැඟවුණු පැතිකඩක් තමයි මේ විස්තර කරන්නෙ. සාරාසංඛ්‍ය කල්ප ලක්‍ෂයක් පාරමිතා ධර්ම පූර්ණ කරමින් සියලු මාර බල පරදා තුන් ලෝකයම ජය ගත් ලොව්තුරා බුදුන් වහන්සේ විසින් ස්වයංභූ ඥානයෙන් දැන හෙළිදරව් කළ මේ අනිච්චතාවය හෙවත් කැමති සේ නොපැවතීම කියන ධර්මතාවයට, උන් වහන්සේටත් ඒ විදිහටම මුහුණ දෙන්න සිද්ධ වීම මේ ධර්මතාවයේ පොදු බව මොනවට කියාපාන අවස්ථාවක්. එතකොට අසම සම බුදු පියාණන් වහන්සේටවත් මේ ලෝකය කැමති සේ තිබිල තියෙනවද ? අසම සමයි කියන්නෙ උන් වහන්සේට සම කරන්න පුළුවන් ජගතෙක් මේ තුන් ලෝකයේ කොහේවත් නෑ. තවත් බුදු පියාණන් වහන්සේ නමකටම විතරයි සම වෙන්නෙ. එතකොට බුදු වෙන්න පෙර බෝධි සත්වයන් වහන්සේගෙ ප්‍රාර්ථනාව වුනේ මොකක්ද ?

බුද්ධෝහං බෝධයිස්සාමි
මුත්තෝහං මෝචයේ පරේ
තින්නෝහං තාර යිස්සාමි
සංසාරෝගෝ මහබ්භයා

ඒ කියන්නෙ මම බුදු වෙනවා, අන්‍යයන්ටත් අවබෝධ කරවනවා, මම මිදෙනවා, අනෙක් සියළු සත්වයන්වත් මුදවනවා, මම එතෙර වෙලා මේ සංසාර සාගරයෙන් අනිත් අයත් එතෙර කරවනවා, මේ සංසාර ඕගය මහා භයානකයි කියන කාරණය. ඉතින් උන් වහන්සේ පිරිනිවන් පෑවෙ ලෝක සත්වයින් සියල්ල දුකින් මුදවලද ? එහෙම මිදෙව්ව නම් අපි අද ඉන්න විදිහක් නෑ. මොකද එහෙනම් අපිත් නිවන් දැකල පිරිනිවන් පාල තියෙන්න ඕන. එහෙනම් බෝධි සත්ව ප්‍රාර්ථනාව ඒක වුනත්, බුදු වුනාට පස්සෙ තමයි උන් වහන්සේගෙ මහා ඥානවලින් ලෝකය දිහා බලන කොට දැක්කෙ, මේ ලෝකයේ ඉන්නෙ මොන වගේ පාපකාරී අදහස්වලින් පිරිච්ච, රාගයෙන් රත් වෙච්ච, ද්වේශයෙන් දැවිච්ච, මෝහයෙන් මුලා වෙච්ච සත්වයෝද කියල. එතනින් එතෙර කරන්න පුළුවන් ඉතා ස්වල්ප දෙනෙක් විතරයි කියල දැක්කා.

ඉතින් උන් වහන්සේ, පුළුවන් අයට මග කියල දීල ලෝකෙන් එතෙර වෙන්න සැලැස්සුවා. හැබැයි බෝධි සත්ව කාලයේ උන් වහන්සේගෙ කැමැත්ත වුනේ සියල්ලෝම සංසාර රෝගයෙන් මුදවන්න. ඒක තමයි උන් වහන්සේගෙ මහා කරුණාව. නමුත් හේතු හදාගෙන ඇවිත් තියෙන පිරිස එතෙර කරන්න පුළුවන් වුනා මිසක්, සියලු සත්වයන්ම එතෙර කරන්න පුළුවන්කමක් නෑ. ඒ කාරණය උන්වහන්සේම මහ පොළවෙන් පස් පිඩක් නිය පිටට අර ගෙන උපමාවකින් මේ විදිහට පෙන්වනවා. මගේ නිය පිට තියෙන පස් ප්‍රමාණය හා සමාන සත්ව ප්‍රමාණයක් තමයි මේ දහම් අවබෝධ කරල සසරින් එතෙර වෙන්නෙ, මහ පොළවෙ පස් හා සමාන අනෙක් සියලු සත්වයෝම සසර ගමන යනවා. එතකොට උන්වහන්සේ



මග කියල දෙනව විතරයි. තම තමන් නුවණින් වටහගෙන මිදෙන්න ඕන.

දෙව්දත් ථෙර ගල් පෙරළල බුදු පියාණන් වහන්සේගෙ ශ්‍රී පාදය තුවාල වෙලා, ඉමහත් වේදනාවෙන් යුතුව සීහ සෙයියාවෙන් සැතපුනා කියල ධර්මයේ සඳහන් වෙනවා. එතකොට බුදු පියාණන් වහන්සේ ඒකට කැමති වුනාද ? නෑ. ඒත් එහෙම වුණා. නැවතත් දෙව්දත් ථෙර සංඝභේද පාප කර්මය කරල 500 ක් භික්ෂූන් වහන්සේලා අරගෙන වෙනම පොහොය කළා. උන් වහන්සේ ඒකට කැමති වුණාද? නෑ. සැරියුත් හාමුදුරුවන්ට කිව්වා, ඒ අයට බණ කියල නැවත එක්කරගෙන එන්න කියල. මොකද ඒ 500 නමටම මග ඵලවලට පත් වෙන්න හේතු වාසනා තියෙන බව දැකල දයානුකම්පාව නිසයි එහෙම කිව්වෙ.

අන්තිමට දෙව්දත් ථෙර කර ගත්තු ආනන්තරීය පාප කර්මවලින් අවීචි මහා නරකාදියේ ගිහින් ඉපදුණා. උන් වහන්සේ ඒකට කැමති වුනාද? නෑ, පුළුවන් නම් ගොඩ දානවා. තවත් අවස්ථාවක අන්‍ය පරිබ්‍රාජකයින් පිරිසක් එකතු වෙලා සුන්දරී පරිබ්‍රාජිකාව යොදා ගෙන බුදුන් වහන්සේ ඇතුළු සංඝයා වහන්සේලාට අපහාස කළා. ඒකට කැමති වුනාද? නෑ. හැබැයි ඒකත් සිද්ධ වුණා. බුදු පියාණන් වහන්සේත් කර්ම 12 කින් විපාක ලෙස ආපු කරදර සහ ලෙඩ රෝගවලින් පීඩා වින්දා. කොන්දෙ අමාරුවක් තිබුණා. පිරිනිවන් පාන්න වුනෙත් ලෝහිත පක්කන්දිකා කියන රෝගයෙන් පිඩා විඳල. ඒ කියන්නෙ හැම තිස්සෙම හේතු ඵල ධර්මතාවය ක්‍රියාත්මක වුණා. ඉතින් මේ ලෝකයේ පහල වන අසම සම උත්තමයටවත් මේ ලෝකය කැමති සේ නැත්නම් අපි ගැන කවර කතාද?

උපමාවක් කියනව නම්, යම් කිසි මනුස්සයෙක් මහ දවාලෙ ගල් වැඩ පළක ගල් කඩනවා. ඇඟට දාහය දැනෙනවා, ඒත් සිසිලස බලාපොරොත්තු වෙනවා. මහ අව්වෙ ගල් කඩ කඩ ඉන්නවා. අව්වෙ තැම්බෙනවා මදිවට කය වෙහෙසෙනවා, මහන්සියත් එනවා. අනේ මට ටිකක් නිකං ඉන්න ඇත්නම්! මෙහෙම හිතන කොට පොඩි විවේක අවස්ථාවක් ලැබෙනවා. එතකොට හරි ගියාද? කැමැත්ත සම්පූර්ණයෙන් ඉටු වෙලාද? අව්වෙ ඉන්නෙ පුළුවන්කමකට නෙවෙයි. හෙවණකට යන්න ඇත්නම්! මෙහෙමත් හිතෙනවා. එතැනම ටකරං මඩුවක් තියෙනවා. දැන් එතැනට රිංග ගන්නවා. අර මහ ගිනි අව්වෙන් ටික වෙලාවකට අහක් වෙනවා. හැබැයි ඒත් කැමැත්ත සම්පූර්ණද? මෙතනත් හරි රස්නෙයි, හෙවණ තියෙන ලොකු ගහක් යටට යන්න ඇත්නම් කියල හිතෙනවා. එතකොට ගහක් යටට යන්න ලැබෙනවා. කැමැත්ත ඉටු වුනාද ? දැන් මොකක්ද කියන්නෙ ? රස්නෙ අඩු වුනාට එතනත් ඉන්න ☞

අමාරුයි. ඊළඟට හිතෙනවා, වායු සමනය කරපු සීතල කාමරයකට යන්න ඇත්නම් කියල. ඒ වගේම කාමරයකට යන්නත් අවස්ථාව ලැබෙනවා. දැන් හරිද? ඇඟ පුරා හරි දූවිල්ල, දාඩිය දාල ගඳයි, නාල පිරිසිදු වෙන්න ඇත්නම් කියල හිතෙනවා. ඒකත් ලැබුණා. දැන් හරිද ? ඒත් එක විදියකට එක තැනක ඉන්න බෑ. ටික වෙලාවක් හිටගෙන ඉන්න කොට කකුල් රිදෙනවා. ඉඳගෙන ටික වෙලාවක් යන කොට ඇඟ හිරි වැටිල කොහේ හරි රිදෙනවා. මේ කය හරි වදයක්.

දැන් මේ විදිහට කැමැත්ත ඉටුවුනායි කියල හිතාගෙන එකින් එකට යනවා. හැබැයි ගිහින් බැලුවම කැමැත්ත ඉටු වෙලා නෑ. ඉටු වෙලා කියල රැවටිලා ඉන්නෙ. මගේ වැඩේ හරි කියල ගිහින් බැලුවම වැඩේ හරි නෑ, තවත් ප්‍රශ්ණ තියෙනවා. ඊළඟට මොකද හිතෙන්නෙ ? යම් කිසි විදිහකින් දහමක් ගැන අවබෝධයක්, උනන්දුවක් තියෙන කෙනෙක් නම් මේ විදිහටත් හිතාවි. මෙහෙම කරදර දෙන ඕලාරික කයක් නැත්නම් ! මේ කයේ වේදනා දැනෙන්නෙ නැත්නම් ! ඊළඟට කය දැනෙන්නෙ නැති, හිත විතරක් දැනෙන මානසිකත්වයකට හෙවත් ප්‍රථම ධ්‍යාන සමාපත්තියට පත් වෙනවා. දැන් කය නිදහස්. කයේ වේදනා දැනෙන්නෙ නෑ. දැන් කොහොමද ? මේ සිතිවිලි නැගි නැගී එන එක මහ වදයක්, ඒ වගේ සිතිවිලි නැගෙන්නෙ නැත්නම් ! එහෙනම් එතැනත් කැමැත්තට තිබිල නෑ.

දැන් විතර්ක විචාර අත හැරල ප්‍රීති සුඛ ඒකාග්‍රතා සහිත දෙවැනි ධ්‍යානයට සම වදිනවා. එතැනට ගිහින් බලනවා. මේ නැගි නැගී එන ප්‍රීතියත් මහ වදයක්නෙ ! මේ ප්‍රීතිය නැත්නම්, සුඛ ඒකාග්‍රතා විතරක් තිබුණ නම් කොච්චර ශාන්තද, ප්‍රනීතද ? එතකොට කැමැත්ත ඉටු වෙලා නෑ. සුඛ, ඒකාග්‍රතාවයට පත් වුණා. ඊළඟට ප්‍රීතිය අත හැරල තුන්වැනි ධ්‍යානයට පත් වෙනවා. දැන් ප්‍රීතිය නැගෙන්නෙ නෑ. හැබැයි දැන් හරිද? සුඛය හරි වදයක්. ඇඟ කිළිපොලා ගෙන මේ සුඛය දැනෙනවා. ඊළඟට සුඛය නැතුව උපේක්ෂා ඒකාග්‍රතාවය විතරක් තිබුණ නම් කියල හිතෙනවා. එතකොට එතනත් කැමැත්තට නැති එකක්මයි තිබිල තියෙන්නෙ.

ඊළඟට සුඛය අත හැරල 4 වන ධ්‍යානයට පත් වෙනවා. දැන් එක එක උපේක්ෂා සහගත සංඥ එනවා. ඒකත් හරි වදයක්. මේ වගේ සංඥ එන්නෙ නැත්නම් කොච්චර හොඳද ? එහෙම එකක් තියෙනවද ? එකම ආකාස සංඥව තියෙන ආකාසානඤ්චායතන අරූප සමාපත්තියට සම වදිනවා. දැන් විවිධ සංඥ එන්නෙ නෑ. වැඩේ හරිද කියල බැලුවම පේනවා, මෙතනත් අනන්ත ආකාසයත් එක්ක මනස විහිදුවල, හරි වෙහෙසක් තියෙනව කියල. මොකද එකට බැඳිල ඉන්නෙ. හැබැයි ඒක දකින්නෙ එතනදි. දැක්කම වැටහෙනවා, මේ අනන්ත ආකාසය මනසින් අත හැරිය නම් කොච්චර නිදහස්ද කියල. එහෙම හිතල ආකාසය මනසින් අත් හරිනවා. දැන් හිත විතරයි වෙන සම්බන්ධයක් නෑ. ඒ කියන්නෙ විඤ්ඤාණංචායතනයට ගියාට පස්සෙ විඤ්ඤාණය එක්ක විතරයි සම්බන්ධය තියෙන්නෙ. දැන් හරිද? නෑ. මේ වෙර වීරිය යොදල විඤ්ඤාණය ප්‍රසාරණය කරගෙනනෙ ඉන්නෙ කියල වැටහෙනවා. ඒකත් වෙහෙසක්. බලාපොරොත්තු ඉෂ්ට වෙලා නෑ. කැමති සේ නෑ. එතැනදි වැටහෙනවා, මේකත් අත හැරිය නම් ශාන්තයි, ප්‍රනීතයි කියල. ඒ උත්සාහය වීරිය අත්හැරියම විඤ්ඤාණංචායතනයේ ඉඳල ආකිඤ්ඤාණංචායතනයට පත් වෙනවා.

දැන් වැටහෙනවා, මෙතනත් මොහොතක් ගානෙ දැනීම නිපදවනව කියල. නිපදවල නිපදවල තැන්පත් කරල එක මට්ටමකට ප්‍රසාරණය කරන එකයි කරන්නෙ කියල දකිනවා. එතකොට තවමත් වෙහෙස තියෙනවා. වෙහෙසට කැමති නෑ. ඒකෙනුත් නිදහස් වෙන්න ඕන. ඒකෙන් නිදහස් වුනාම දැන් කෙළවර වෙන්න යනවා. දැනීම අඩුවෙලා අඩුවෙලා ගිහින් දැනීම නැත්තටම නැතිවෙන්න යනව දැනෙනවා. එතකොට දැනීම නැති වුනොත් ජීවිතය ඉවරයි කියල හිතෙනවා. මේ තමයි නේවසංඥානාසංඥායතනය. ජීවිතයට ආසයි. මොකද කරන්නෙ ? ජීවිතය පවත්වන්න නම් දැනීම ප්‍රසාරණය කරන්න ඕන. නැවතත් උත්සාහය වීරිය නගල දැනීම ප්‍රසාරණය කරනවා. දැනීම නැගිල එනවා. හැබැයි නවත්වගෙන ඉන්න හිතෙන්නෙ නෑ. බර උස්සනව වගේ නැගිල එනවා. නමුත් බර උස්ස ගෙන ඉන්නව වගේ නැගිල ආපු එක තියාගන්න කැමැත්තක් නෑ. බර උස්සන වෙහෙස එකක්. උස්සල තියාගෙන ඉන්න වෙහෙස තව එකක්. ඒ වගේ මනස ප්‍රසාරණය කරන දුක එකක්. හිර කරගෙන ඉන්න එක තව දුකක්. එක දුකක් අහක් කළාට පස්සෙ ප්‍රසාරණය කරන දුක තියෙනවා. හැබැයි හිර කරගෙන ඉන්නෙ නැති නිසා ගෙවිල යනවා. නැවතත් ප්‍රසාරණය කරනවා. ගෙවිල යනවා. මේ විදියට දිගටම ප්‍රසාරණය කරනවා, ගෙවිල යනවා. න+ඒව+සංඥා - නේවසංඥ (එහි සංඥාවක් නෑ), න+අසංඥා - නාසංඥ (අසංඥත් නෑ). ඒ කියන්නෙ සංඥාත් නෑ, අසංඥත් නෑ. හරියට නැත්තෙත් නෑ ඇත්තෙත් නෑ වගේ දෙයක්. මොකද සංඥා තිබුනට ඒ විදිහට තියා ගන්න බෑ. සංඥාව ගොඩ නැගෙනවා, නවත්වන්න බෑ ගෙවිල යනවා. එතකොට ගෙවෙන සංඥාවක් තියෙන නිසා එකාකාරීව පවතින්නෙ නෑ. තියෙන සංඥාව ගෙවිල ඉවර වෙන කොටම නැවතත් ඇති කරනවා. එතකොට තියෙනවා. නේවසංඥානාසංඥායතනයට පත්වුනාම එහෙම තමයි. ඒ තමයි අන්තිම ලෞකික සමාපත්තිය.

ඊළඟට ජීවත් වෙන්න උත්සාහය වීරිය නගන්න ඕන කියල එතනදි වැටහෙනවා. ජීවත් වෙන්න ආසාව තියෙන තාක් කල් දැනීම ගොඩනගන්න ඕන. උත්සාහය වීරිය නැවැත්තුවොත් ජීවිතය ඉවරයි කියල මෙතනදි වැටහෙනවා. කැමැත්ත නම් උත්සාහයක් වීරියක් නැතිව දැනීම පවත්වන්න. නමුත් ඒ විදිහට කැමැත්තට ලැබෙන්නෙ නෑ. මානසික උත්සාහය වීරිය මත ගොඩ නගන නිසා තමයි දැනීම තියෙන්නෙ. ඒක වෙහෙසයි, ගොඩ නගන ගොඩ නගන එක මුකුත් ඉතිරි නොකර ගෙවිල යනවා. හරයක් ඉතුරු වෙන්නෙ නෑ. එහෙනම් මොකක්ද මේ කරන වැඩේ ? අන්තිම මොහොතෙ හරයක් නැති දේකට දුක් විඳිනව නේද කියල දකිනවා. එතනට ගියාට පස්සෙ මොකද කරන්නෙ, ඒ උත්සාහය වීරිය නතර කළාම දැනීම නිරෝධ වෙනවා. ඒ තමයි සංඥා වේදයිත නිරෝධය.

නව අනුපූර්ව සමාපත්තියෙන් නිරෝධ සමාපත්තියට යනවා. දැනීම හා සම්බන්ධයක් එතැන නෑ. ඒත් සදාතනිකද ? නෑ. ටික වෙලාවක් යන කොට නැවත දැනීම ගොඩ නැගෙනවා. කර්ම විපාකයෙන් නැවතත් මෙහෙයවල දැනීම ගොඩ නගනවා. නැවත නැවතත් උත්සාහ කරල නිරෝධයට සමවදින්න පුළුවන්. ඒත් කර්ම ශක්තිය තියෙන කල් නැවතත් දැනීම ගොඩනගල දෙනවා. ඉවරයක් නෑ. මේ තත්වය සදාතනික වුනා නම්, අන්න එතැන දුකෙන් නිදහස්. ඒ තමයි ලෝක සත්වයා උත්සාහය වීරිය 100% ක්ම අත් හැරපු තැන. කිසි දුකක් නෑ. ලෝකය ඇතුලෙ තියෙන සියල්ල නැති තැන, ලෝකයක් පනවන්න බැරි තැන. ඒ තමයි නිවන. අන්න ඒක ලබාගෙන අනුපදිසේස නිර්වාන ධාතුවෙන් පිරිනිවන් පාන දවසට තමයි පූර්ණ නිදහස ලැබෙන්නෙ කියල දැන ගන්නවා. අනුපදිසේස නිර්වාන ධාතුවෙන් පිරිනිවුනට පස්සෙ කය පිළිබඳ, හිත පිළිබඳ කිසිවක් සම්බන්ධ නැත්නම්, සියලු කැමති සේ නොපවතින දේවල් අවසානයි, විඳපු දුක අවසානයි කියල ☞

වැටහෙනවා. චේතෝ විමුක්තිය තුළින් නිවන් දකින්නෙ ඒ විදිහට.

ඒ වෙනකල් මොකද කරන්නෙ ? පෘතජ්ජන මට්ටමේ ඉන්න තාක් කැමති සේ ලැබුන කියල රැවටෙනවා. හැබැයි ලෝකයේ කිසි දෙයක් කැමති සේ ලැබිල නෑ. කැමති තැනට ගිහින් බැලුවට පස්සෙ එතැන කැමති සේ නෑ. කැමති සේ නැති දේකට තමයි මට ඒක ලැබුණ කියල ලෝක සත්වයා උද්දාමයට පත්වෙන්නෙ. මේක දැක්ක දාට වටහ ගන්නවා, ලෝකයේ කිසිම දෙයක් කැමති සේ නෑ කියල. මේ දහම තේරුම් ගන්න කල් ලෝක සත්වයා රැවටෙනවා.

එතකොට කැමති සේ නෑ කියන්නෙ ඇයි ? ''කැමති සේ තියෙන දේවල් ලෝකයේ තියෙනවනෙ. මම බලාපොරොත්තු වෙච්ච දේවල් මට ලැබුණා. බලාපොරොත්තු සඵල වුනානෙ !'' මෙන්න මේ මුලාවට රැවටෙනවා. හේතු ඵල විදිහට සිද්ධ වුණ, කැමති සේ නොලැබුන යමකට කැමති සේ ලැබුන කියල රැවටෙනවා. අපි මේ අනන්ත සංසාර ගමනක් අර ගෙන යන්නෙ මේ කාරණය වටහ ගන්න බැරි නිසා. හැබැයි කල්‍යාණ මිත්‍රයෙක් මුණ ගැහිල ඒක කියල දුන්නට පස්සෙ අවබෝධය ලබාගත්ත නම්, අනන්ත දුක් විඳගෙන ආපු සසර ගමන නවත්වන්න පියවර ගන්නවා.

බුදු පියාණන් වහන්සේ එක් අවස්ථාවක උපමාවක් අරන් මෙහෙම පෙන්වනවා. අසූචි වළක ඉන්න පණුවෙක් ලොකු අසූචි පිඬක් උඩට නැගල කියනවලු, ඔන්න බලාපල්ල මට කැමති සේ ලැබිල තියෙනව කියල. අන්න ඒ ආකාරයෙන් තමයි මේ කාම භෝගී ජීවිතයට බැහැල ඉන්න ලෝක සත්ත්වයා කාම වස්තු ලැබුනම උද්දාම වෙන්නෙ. ලොකු අසූචි පිඬවල් වගේ ඒව තියෙනව මිසක් දුකින් නිදහස් තැනක් ලෝකයේ නෑ. මහණෙනි, **මේ නිය පිටට ගත්ත පස් පිඩ පමණවත් කැමති සේ පවත්වන්න පුළුවන් තැනක් ලෝකයේ තියෙනව නම්, නිවනක් ගැන දේශනා කරන්න බුදුවරු ලෝකයට පහළ වෙන්නෙ නෑ, ලෝකය තුළම ඉඳගෙන ආස්වාද විඳින්න කියනව කියල බුදුන් වහන්සේ දේශනා කරනවා. හැබැයි එහෙම කිසිම තැනක් මේ ලෝකයේ නෑ.** නමුත් අවිද්‍යාව නිසා ලෝක සත්වයා නිගමනය කරනවා, ලෝකය හරි වටින, කැමති සේ පවත්වන්න පුළුවන් තැනක් කියල. මට මේ දේ ලැබුනා, වැඩේ හරි කියල හිතනවා. හැබැයි අවශ්‍ය දේ ලැබුනට පස්සෙ හිතල බැලුවොත් වැටහෙනවා, ඒවා කැමැත්තට නෑ, රැවටිලා විතරයි කියල. එතකොට ඔප්පු වෙනවා ඒක මුලාවෙන් ගත්ත අදහසක් විතරයි කියල.

ඒ කියන්නෙ යම් තැනක රූප ඇත්ද, වේදනා ඇත්ද, සංඥා ඇත්ද, සංඛාර ඇත්ද, විඤ්ඤාණ ඇත්ද, ආයාසයෙන් ගොඩ නගන ඒවා මිසක්, සැපයි කියල බොරුවට රැවටෙනව මිසක්, සාර වටින යමක් ඒ තුළ නෑ. අනිච්ච, දුක්ඛ, අනත්ත වශයෙන් ආදීනව වටහ ගත්තම පේනවා, දුකින් පිරිච්ච ලෝකයක් මිසක් වෙන එකක් නෑ කියල. ආස්වාදය කියන්නෙ දුකට ඇඳල දාන, අපිම හිතෙන් ගොඩ නගාගත් මායාවක් විතරයි කියල අවබෝධ කර ගත්තම යථා භූත ඥාන දර්ශනය පහළ වෙනවා. භූතයේ හෙවත් බොරුවේ යථා ස්වභාවය වටහ ගන්නවා. ආස්වාදය තරම් භයානක දෙයක් ලෝකයේ තවත් නෑ. ඒකට රැවටිලා ඉන්න තාක් කල් ලෝක සත්වයාට දුකින් මිදීමක් නෑ. මේක වටහ ගත්ත දාට ලෝකය සමග තියෙන සියලු බැඳීම් ඉක්මවනවා, නිවන් දකිනවා.

ලෝකයේ තියෙන යමකින් නිවන පනවන්න බෑ. යම් තැනක රූප නැත්ද, වේදනා නැත්ද, සංඥා නැත්ද, සංඛාර නැත්ද, විඤ්ඤාණ නැත්ද ඒ තැන තමයි නිවන. නිවනට ගිය කෙනෙකුත් නෑ. නිවනින් ආපසු එන කෙනෙකුත් නෑ. හැබැයි නිවන තියෙනවා. සත්ත්ව මාත්‍රයකින්වත් පනවන කිසිම දෙයක් නැත්ද, එතැන නිවන තියෙනවා. සත්ත්වත්වය හා බැඳිල ඉන්න කල් ලෝකය තුළමයි ඉන්නෙ. සත්ත්වත්වයත් එක්ක දුක තියෙනවා. ඒ කියන්නෙ කැමති සේ නැති පැවැත්මක් තියෙනවා. සත්ත්වත්වය කෙළවර කරපු දාට සියලු දුක් අවසානයි. කැමති සේ පවත්වන්න බැරි, කැමැත්ත ඉෂ්ට නොකරන සියල්ලෙන් නිදහස්. කැමති සේ පවත්වන්න බැරි දෙයක් යම් තැනක නැත්ද, එතැන නිවන. ඒ කියන්නෙ නිවනට පත් වෙනවා.

මෙතනදි ''යම් තැනක'' කියන වචනය හඳුන්වාදීමේ පහසුවට නිවන විස්තර කරන්න ගත්තට, පෙන්වන්න පුළුවන් තැනක් / ස්ථානයක් නෑ. නිවන කිව්වම ඒකට තැනක් / ස්ථානයක් නෑ. පංචස්කන්ධය නැති තැන, ධාතු 6 නැති තැන, ආයතන නැති තැන, පටිච්ච සමුප්පාදය උදාවීම නැති තැන ... මේ සියල්ලම නිවන් දැකල පිරිනිවන් පැවට පස්සෙ තත්ත්වය හඳුන්වන්න යොදා ගන්න පුළුවන්. එතකොට අත්ති තදායතනං - එහෙම ආයතනයක් ඇත කියල නිවනට කිව්වත්, ඒ ආයතනය සළායතනවලට අයිති නෑ. සළායතන නිරෝධයි. නිවන් ආයතනය තියෙනවා. නමුත් තියෙනවා කිව්ව ගමන් ''ඇත'' කියන සංඥාවට වැටිල දෘෂ්ටි ගත වෙන්න පුළුවන්. ඒ වගේම නැත කියල කියපු ගමන්, ''නැත'' කියන දෘෂ්ටියට වැටෙන්න පුළුවන්. ඒ කියන්නෙ ඇත, නැත කිව්වොත් නැවතත් සාස්වත / උච්ඡේද කියන දෘෂ්ටි දෙකට වැටෙන්න පුළුවන්. ඒ නිසා ඒ දෙකම නොකියා අත්ති තදායතනං කියල කියනවා.


එහෙම ආයතනයක් ඇත කිව්වම නිවන් පූර්ණ කළාට පසුවයි, පිරිනිවන් පෑමෙන් පසුවයි එන තත්ත්වය අවස්ථා 2 ක්. නිවන පූර්ණ කරන්නෙ ජීවත් වෙලා ඉන්න කොට. පිරිනිවන් පෑවට පස්සෙ ඒ තත්ත්වය ගැන කතා කරන්න වචන නෑ, වචන පද ඉක්මෙව්වා. තත්ත්වය මොකක්ද කියල ප්‍රමාණ කරන්න මිනුම් දණ්ඩක් නෑ. නමුත් නිවන් පූර්ණ කරල ජීවත් වෙලා ඉන්න කොට ඒ ඉන්න තත්ත්වය මොකක්ද කියල දන්නවා. අන්න ඒ පූර්ණ කරපු නිවනට ඇතුලත් වුනා කියන්නෙ අරිහත් ඵලය. කෙළෙස් පරිනිර්වානය නිසා දාහයක් නෑ. ඒක දකිනවා. හැබැයි කෙළෙස් පිරිනිවන් පෑවට පංචස්කන්ධය තවම තියෙනවා. එතකොට එන්නෙ සෝපාදිසේස නිවන. ඒ කියන්නෙ ස්ව උපධි සහිතයි. වෙනත් විදිහකින් කියනව නම් පංචස්කන්ධය නිසා උපදින දුක සහිතයි. අත්ති තදායතනය කියන්නෙ පිරිනිවන් පානකල් ඉන්න කාල සීමාවට. ඒ කාලය තුළ තමන්ට දැනෙනවා, පෙර තිබිච්ච රාගය, ද්වේශය, මෝහය දැන් නැති බව. ඒ ස්වභාවය දකිනවා. නිරෝධය දකිනවා. අන්න ඒ කාල සීමාවෙදි නිවන කියල ආයතනයක් තියෙනවා. සෝවාන්, සකෘදගාමී, අනාගාමී අයටත් මේ අත්ති තදායතනය කියන එක ඒ ඒ අයගෙ මට්ටමින් තියෙනවා. මොකද යම් කිසි මට්ටමකින් ලෝකය පිළිබඳ බලාපොරොත්තු අත් හැරිය බව දන්නවා. ඒක අත්ති තදායතනයට අයිතියි. ඒ ඒ මට්ටමින් කෙළෙස් පරිනිර්වාණය වුනාට පස්සෙ එහෙම ආයතනයක් තියෙනව කියන එකයි මේ කියන්නෙ. පිරිනිවන් පැවට පස්සෙ අත්ති තදායතනය කියල පෙන්වන්න පුළුවන් තැනක් නෑ. එතකොට නිවන ගැන කතා කරන්න වචන නෑ. ඒ තමයි අනුපාදිසේස නිවන. ස්කන්ධ පරිනිර්වාණයෙන් පස්සෙ උපධි අනුසයක්වත් නෑ.

*වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*

**චතුර හිඳුරංගලගේ**
**නුගේගොඩ**

**අභයරතනාලංකාරය - 52**

# පුණ්‍ය සෘද්ධි ගැන තවත් ඇසූ පිරූ තැන්...



*(පසුගිය කලාපයෙන් - විවිධ වූ පුණ්‍ය සෘද්ධි සම්බන්ධයෙන් සත්‍ය අත්දැකීම්...)*

**- වහරක අභයරතනාලංකාර හිමි**

මේ කාලයේ බොහොම දුර්ලභ නමුත් ඉඳ හිට අහන්න ලැබෙන පුණ්‍ය සෘද්ධි සම්බන්ධයෙන් අභයරතනාලංකාර හිමියන් ලැබූ අත්දැකීම් කිහිපයක් ගැන විස්තර පසුගිය කලාපයෙන් ඉදිරිපත් කළා. දූන් ඉදිරිපත් කරන්න යන්නෙත් ඒ සම්බන්ධයෙන් උන් වහන්සේට දූන ගන්න ලැබුණු තවත් අත්දැකීම් කිහිපයක් ගැන විස්තර. හැබැයි මේ සමහර අත්දැකීම් උන් වහන්සේගෙම නොවුනත්, උන් වහන්සේට බොහොම විස්වාසවන්තව පිළිගන්න පුළුවන් ආකාරයට ලැබුණු තොරතුරු ඔස්සේ තමයි ඉදිරිපත් කරන්නෙ. ඒ කියන්නෙ යම් කිසි තොරතුරක් කෙනෙක් නිකම්ම කිව්ව පළියටවත්, පොතක පතක තිබ්බ්ච පළියටවත් කියන ඒවා නෙවෙයි. උන් වහන්සේගෙ පටිභාන ඥාන ශක්තියෙනුත්, මේ අත්බවයෙදි ලබාගත් සත්‍ය අත්දැකීම් ඔස්සේත්, සමාධියට ගෝචර වූ පෙර අත්බැව්වල සිද්ධි ඇතුළු තවත් හැකියාවන්ගෙනුත් තහවුරු කරල, ඒ වගේ දේවල් ඇත්ත වශයෙන්ම සිද්ධ වෙන්න පුළුවන් කියල හැඟෙනව නම් තමයි මේ කරුණු ඉදිරිපත් කරන්නෙ. පසුගිය කලාපයෙන් විස්තර කරපු සිද්ධිවලට සමගාමීව උන් වහන්සේට දූන ගන්න ලැබ්ච්ච තවත් පුණ්‍ය සෘද්ධියක් ගැන විස්තරයක් තමයි මේ.

ඒ කාලෙ අපේ ගම් පළාතෙ හිටපු බොහොම වැඩිහිටි කෙනෙක්ගෙන් මට අහන්න ලැබ්ච්ච, අවුරුදු 150 කට විතර එහා වෙච්ච සිද්ධියක් තමයි මේ. ඒකත් ඔය මහ කන්ද, ලෙනගල කියන අපේ ගම් පළාතට කිට්ටු ප්‍රදේශයටම තමයි අහු වෙන්නෙ. ඒ පැත්තෙ එක්තරා මනුස්සයෙක් ඇල් හේනක් වගා කරල තියෙනවා. ඉස්සර ඇල් හේනක් වගා කරපු එක්තරා ක්‍රමවේදයක් තිබුණා. ඇල්හේන වගා කළාට පස්සෙ ඒ ගොවියා පිරිත් කියාගෙන, මෛත්‍රී භාවනාව කර ගෙන ගෙදරවත් යන්නෙ නැතිව, සිල් වතකින් වගේ එක්තරා බ්‍රහ්මචාරී ගුණයකින් පැළට වෙලා ඉන්නවා. ඒ වගේම ඒ ඇල් හේනෙ ගොයම් කපල සියල්ල ඉවර කර ගෙන එනකල් කාම මෛථුනයක යෙදෙන්නෙත් නෑ, ස්ත්‍රීන්ගෙ මුහුණවත් බලන්නෙ නෑ. ඒ විදිහට තමයි ඒ කාලය තුළ හේන බලා කියා ගෙන ඉන්නෙ. ඉතින් මේ කියන විදිහට තමයි ඒ මනුස්සයත් ඇල් හේන් වගාව සිද්ධ කළෑයි කියන්නෙ. එතකොට ඒ ගෙදර බිරිඳ ලබු කැටයකට වතුරයි, බත් මුලයි ගෙනත් ඔහු මූණ ගැහෙන්නෙ නැතිව හේනෙ වැටක එල්ලනවා. ඊට පස්සෙ ඒ වැටේ එල්ලල තියෙන යකඩය ටාං ටාං ගාල සද්ද කරල යන්න යනවා. යම් කිසි වෙලාවක් ගිහින්, තමන්ගෙ බිරිඳ ගියා කියල දූන ගත්තට පස්සෙ, අර මනුස්සය ඇවිත් බත් මුලයි, වතුර එකයි අර ගෙන යනවා. එහෙම තමයි ඒ කාලය තුළ ජීවිතය ගත කළේ.

ඉතින් මේ කියන මනුස්සය ඔය විදිහට තමන්ගෙ ඇල් හේන වගා කරල අන්තිමට බලන කොට බලාපොරොත්තු වෙච්ච විදිහට ගොයම් පැහිල, පාගන කොට මහ විසාල අස්වැන්නක් ලැබිල තියෙනවා. ඒ වැඩිපුර අස්වැන්න කොහොඹයා ගෙනත් දෙනව කියල තමයි කියන්නෙ. කොහොඹ යකා, කොහොඹ දෙවියො කියලත් කියනවා. කොහොඹ කංකාරිය කියල ශාන්ති කර්මයක් / නැටුමක් තියෙන්නෙත් ඔය කොහොඹ දේවතාවො මුල් කර ගෙන. ඒක කොහොඹ දේවතාවො ප්‍රසාදයට පත් කරන්න ඉදිරිපත් කරන එකක්. ඉතින් මේ ගොවි මහත්තය ගොයම පාගල මනින්න බලන කොට, ගොඩ ගොඩ ගාල මහ ලොකු හඬක් වී ගොඩ ඇතුලෙන් එනවලු. එන්න එන්නම වී වැඩි වෙවී ගැස්සි ගැස්සි හෝ ගාල මළු ටික පිරෙනවලු. ඒ කාලෙ අද වගේ ගොයම් පාගන්න ට්‍රැක්ටර් තිබුණෙ නෑ. එක්කො හරක් දාල පෑගුවා, එහෙම නැත්නම් මිනිස්සු පයින්ම තමයි පෑගුවෙ. ඉතින් ඔහොම ගොයම් පාගල ඉවර වෙලා බැත ගනිනවා කියල එකක් තියෙනවා. ඒ කියන්නෙ ගොයම් කොළේ ගහල පාගල සුද්ධ කරල වී ටික ගොඩ ගහල මනිනවා. අන්න ඒ වී ගොඩෙන් තමයි මේ සද්දය එන්නෙ. එතකොට වී ගොඩ ගහල ඉවර වුනාට පස්සෙ තමයි වී ටික මනින්නෙ. මේ ගොවි මහත්තයත් ඒ විදිහට වී ටික මනින්න ලෑස්ති වෙන කොට තමයි මේ සිද්ධිය වෙලා තියෙන්නෙ. වී ගොඩත් එක්ක පොළව යටින් අර වගේ සද්දයක් ඇවිත්, වී මතු වෙනවා. හැබැයි එන දිහාවක් හොයන්න නෑ. දූනෙන්නෙ වී ගොඩ ගැස්සෙනව විතරයි. ගැස්සි ගැස්සී වී ගොඩ මහත් වෙනවා.

ඉතින් මේ මනුස්සයත් තිබ්බ්ච තරම් සේරම ගෝනි අරගෙන ඒවට පුරව ගත්තලු. අන්තිමට ඒ ගෝනි ටික මදි වෙලා තවත් ගෝනි ගේන්න එහාට මෙහාට දුවන කොට එක මනුස්සයෙක් මූණ ගැහිල කිව්වලු, ගමටම බෙදන්න පුළුවන්නෙ මෙහෙම ලැබෙනව නම් කියල. ඊට පස්සෙ බලන කොට අර වී ගොඩ දෙපාරක් විතර හෝස් හෝස් ගාල නතර වුනාලු. අර පුරව ගත්ත වී ටික විතරයි. එතනින් එහාට නෑ. ඒ කියන්නෙ ඒ ලැබීම එතැනින්ම නතර වුණා. හැබැයි මනුස්සය මේ ක්‍රමවේදය දූන ගෙන අනුගමනය කළා නෙවෙයි. වැඩි අස්වැන්නක් ගන්න බලාපොරොත්තුවෙන් අත් හදා බැලීමක් විදිහට තමයි කරල තියෙන්නෙ.

ඉතින් මේ වගේ අවස්ථාවකදි ගෝනි හොය හොයා එහෙ මෙහෙ දුවන්නෙ නෑ. ඒක එක තැනක ඉඳන් කරන්න ඕන දෙයක්. තියෙන ගෝනි ටික ඉවර වුනා නම්, ක්ෂණිකවම ගෝනියක අඩිය ලිහල එක පැත්තකින් වී ටික අරගෙන අනිත් පැත්තට තල්ලු කරන්න ඕන. එහෙම තල්ලු කළාම තවත් කෙනෙක් ඉඳල ඒ තල්ලු කරපු වී ටික එහාට ☞

ඇද ඇදා ගන්න ඕන. ඒ ගත්ත කොටස කාටවත් අදින්න බෑ, අතුරුදන් කරන්න බෑ. ඒ විදිහට ඇති වෙන කල් අර ගෙන අනිත් පැත්තට තල්ලු කරන්න ඕන. එතකොට අනිත් පැත්තෙන් ගන්න වී ටික එකතු කර ගත්තට පස්සෙ නැවත ඒක අල්ලන්න යන්නෙ නෑ. ඉතින් මේ වැඩේ හරියටම කරන්න නම් දෙන්නෙක්වත් ඉන්න ඕන. නිහඬව කතා නොකර තමයි කරන්නත් ඕන. එහෙම නැතිව තැන් තැන්වල දුවන්න ගිහින් කවුරු හරි අර වගේ වචනයක් කිව්වොත් ඒ ලැබීම එතැනින්ම නතර වෙනවා. ඒ විදිහට ලැබෙන්න තිබ්බ වී ටිකත් කොහොඹයා ගෙනියනව කියල තමයි කියන්නෙ. ඒ කියන්නෙ බහිරව දේවතා වගේ කොට්ඨාසයක්. ඒ අයත් මොනව හරි පුණ්‍ය සෘද්ධියක් තියෙන අය. දෙන්නෙයි, ගන්නෙයි දෙකම කරන්නෙ ඒ කොහොඹයා කියන දේවතාවා.

එතකොට මේ වැඩේ නිහඬවම කරන්නත් හේතුවක් තියෙනවා. මොකද එහෙම කළාම අදහස් වෙනස් වෙන්නෙ නෑ. යම් අදහසක් / චේතනාවක් තිබුණ නම් ඒක වෙනස් නොවී ඒකට අනුකූලවම පිහිටනවා. නමුත් කතා කරන කොට අදහස් වෙනස් වෙනවා. ඉතින් අර විදිහට කතා කරන කොට ඒ හඬ ඇහෙන දේවතාවො මොන වගේ අදහස් ගන්නවද කියල අපි දන්නෙ නෑ. සමහර විට අර වගේ දෙයක් කිව්වම සාපයක් වුනා වෙන්නත් පුළුවන්. දාහ සහගතව හිතේ ඉරිසියාවකින් කිව්ව නම් එහෙම වෙන්න පුළුවන්.

ඉතින් මේ විදිහට වගා කරන විධිමත් ක්‍රමවේදයක් එදා තිබුණා. නමුත් අද අස්වැන්න අඩු වෙන්න ප්‍රධාන වශයෙන් හේතු වෙලා තියෙන්නෙ, අද ඉන්න මිනිස්සු ඔය වගේ ක්‍රම ගණන් ගන්නෙ නැති නිසා. ඉස්සර හිටපු මිනිස්සු අස්වැන්න නෙලා ගත්තෙ අද වගේ නෙවෙයි. ඒ කාලෙ කුඹුරු වපුරල සියල්ල කරල ඉවර වෙලා, නිදහස් වෙලාවක තමයි කපා ගත්තු ගොයම පාගන්නෙ. එතකොට ඒ ගොයම් කොළේ එතකල් පැත්තක ගොඩ ගහල තියෙනවා. ඉතිරි වැඩ ටික කෙරෙන කල් ඒක ඔහේ තියෙන්න අරිනවා. කොච්චර වැස්සත් ඒක තෙමිල විනාස වෙන්නෙ නෑ. ඊට පස්සෙ වී බිස්ස කියල එකක් උඩින් හදනවා. එතකොට වටේට වතුර වැටිල වැස්සත් අහකට යනව මිසක් කපා ගත්තු ගොයමට මුකුත් හානියක් වෙන්නෙ නෑ. සත්තු කන්නෙත් නෑ. එහෙම තිබිල සති 3 - 4 ක් විතර ගියාට පස්සෙ තමයි ගොයම පාගන්නෙ.

ඒ කියන්නෙ ගොයම කපා ගත්තට පස්සෙ, නැවතත් කුඹුරු වපුරල සියල්ල කරල ඉවර වෙලා තමයි අර කපා ගත්තු ගොයම පාගන්නෙ. එතකොට ගොයම් කොළේ තිබ්බ වී ඇටත් නිකම්ම ගැළවිලා වැටෙනවා. අමුතුවෙන් පාගන්න මහන්සියකුත් නෑ. ගොයම් මිටිය නිකං ගසල ගන්න කොට ඇට ටික වැටෙනවා. ඒක වී බිස්ස ඇතුලෙ ගොඩ ගැහෙනවා. එතකොට ආයාසයෙන් පාගන්න තියෙන්නෙ බොහොම ටිකයි. ඒකෙන් වැඩේ තවත් ලේසියි. ඒක ඉස්සර තිබ්බ සිරිතක්. අද යල මහ කන්න දෙකම තමයි එදා ඒ විදිහට කාල පරතරයක් නැතිව කළේ. පිරිසක් ගොයම් කපල කොළේ ගහන ගමන්, තවත් පිරිසක් කුඹුරු කොටන්න පටන් ගන්නවා. කුඹුරු කොටල සී සාල වී වැපුරුවට පස්සෙ තමයි අර ගොයම් කොළේ පාගන්න පටන් ගන්නෙ. එතකොට වැඩේ බොහොම ලේසියි. කාලයත් ඉතිරි වෙනවා. දෙකම එක



සැරේට සිද්ධ කෙරෙනවා. දැන් වගේ ගොයම් කපල පුරන් වෙන්න කාලයක් තියන්නෙ නෑ. නමුත් දැන් කරන ක්‍රමයට කන්න දෙකෙන් එකක් වැඩ කරනවා. එහෙම නැත්නම් එක කන්නයක් වැඩ කරන කොට කල් පනිනවා. කල් පැන්නම හරියට අස්වැන්න ගන්න අමාරුයි. එදා තිබ්බ ක්‍රමය තමයි නියම ක්‍රමය. ශෂ්‍ය මාරුව වගේ එක එක වී වර්ග වෙනස් කර කර තමයි වී වැපිරුවෙ. පළවෙනි සැරේ මා වී නම් අනිත් සැරේ හීනටි වපුරනවා. එක වතාවක් වැඩි මහල් වී වැපිරුවොත් ඊළඟ වතාවෙ බාල වී වර්ගයක් වපුරනවා. ඉස්සර මිනිස්සු කුඹුරු කරල තියෙන්නෙ ඒ විදිහට.

ඒ කාලෙ අද වගේ හොරු හිටියෙත් නෑ. ගොයම් ගොඩ කොච්චර කල් තිව්වත් කවුරුවත් හොරකම් කරගෙන ගියේ නෑ. අද නම් ඉතින් එහෙම තිව්වොත් හෙට වෙද්දි ඉවරයි, ඔක්කොම උස්ස ගෙන ගිහින් තියෙන්නත් පුළුවන්. එහෙම කාලයක් තමයි දැන් තියෙන්නෙ. නමුත් ඉස්සර මිනිස්සු එහෙම නෑ. කොච්චර නම් සුද්ද ඇතිව අවංකව ජීවත් වුණාද ? ඒ නිසා තමයි පුදුම ලැබීමක් තිබිල තියෙන්නෙ. ඒ සම්පත් නැති වුනේ මිනිස්සුන්ගෙ තියෙන ඊර්ෂ්‍යාව, ක්‍රෝධ, මාන, වෛර, පළිගැනීම් ලෝභ, දෝස, මෝහ මුල් කර ගෙන හට ගැනීම නිසා. එහෙම නොවුන නම් ඉතින් අදත් මහා සම්පත්තියක් එක්ක සශ්‍රීකව තමයි මිනිස්සු ජීවත් වෙන්නෙ. ලෙඩ රෝග කරදර කියලත් මුකුත් නෑ. සමගියෙන් සමාදානයෙන් බොහොම හොඳට හිටපු උදවිය තමයි අද මේ තත්ත්වයට පත් වෙලා තියෙන්නෙ. අද ඒව විනාස වෙලා ගිහින් විවිධාකාර මිත්‍යා දෘෂ්ටිවලට බැහැල අමනුස්සයො වට කර ගෙන ඉන්නෙ. ඊට පස්සෙ ඒ අමනුස්සයින්ගෙ තියෙන අදහස් මනුස්සයින්ට දෙන්න පටන් ගත්තම මනුස්සයො විනාස වුණා. චාරිත්‍ර වාරිත්‍ර සුචරිත සියල්ලම නැති වෙලා ගියා. විවිධාකාර ලෙඩ රෝග බෝ වුණා. අන්තිමට රටයි, ජාතියයි, සංස්කෘතියයි ඔක්කොම විනාස වෙලා ගියා.

ඕව සියල්ලටම හේතුව මනුස්සයින්ගෙ තියෙන දුෂ්චරිත නිසා ඒවට කැමති අමනුස්ස පිරිස් සම්බන්ධ වීම. එතකොට ඒ අමනුස්සයො ගුප්ත ලෝකවලින් මේ ලෝකයට නොයෙක් විස බීජ ගෙනත් දානවා. උන්ට ඒ වගේ දේවල් බොහොම පහසුවෙන් කරන්න පුළුවන්. නමුත් ඒව කොහොම එනවද කියල දන්නෙ නැති වුනාම අහවල් එකෙන් හට ගත්ත කියල විවිධාකාර මත දෙනවා. නමුත් විස බීජ ගේන මට්ටමේ අමනුස්සයො ඕන තරම් ඉන්නවා. ඒ අයත් ඒව නිකම්ම ගේනවත් නෙවෙයි. මිනිස්සුන්ගෙ දුෂ්චරිත වැඩ පිළිවෙල නිසාම තමයි ඒ වගේ දේවල් කරන්න පරිසරය හැදිල තියෙන්නෙ. මේ ගඳ සුවඳ මට්ටමට එනකල් සණීභවන වෙච්ච විස බීජ ගෙනත් දාන්න පුළුවන් අමනුස්සයො ඉන්නවා. විවිධ වෛරස් වගේ විස බීජ කිසි අමාරුවක් නැතිව ගෙනත් දාන්න පුළුවන්. ඒවායින් ලෙඩ රෝග බෝ කරන්න පුළුවන්. දැන් දැන් එන හඳුනා නොගත් රෝග කියන්නෙත් බොහෝ කොටම ඔය අමනුස්සයො ගෙනත් දාන විස බීජ නිසා ඇති වන රෝග. ඒවාට කොච්චර බෙහෙත් හේත් කළත් තුරන් වෙන්නෙ නෑ. මොකද මිනිස්සුන්ගෙ වැඩ පිළිවෙල නිසා. ඒව ඉවත් කරන්න තියෙන ධර්මානුකූල ක්‍රම, ගුප්ත ක්‍රම අද ඉන්න බොහෝ දෙනෙක් දන්නෙ නෑ. එක්කො පිළිගන්නෙ නෑ. ඒව හරියට කරන කෙනෙක් හිටියත්, උගත් කියන පිරිස් එකතු වෙලා මිත්‍යා දෘෂ්ටිකයො කියල ඒ අයට පහර ගහන එක තමයි අද ☞

කරන්නෙ. නැත්නම් අදත් මේ ගුප්ත ලෝකෙ ඉන්න අමනුස්ස කොටස් ලෙඩ රෝග ඇති කරන හැටි දකල ජල නන්දන පිරිත, ආටානාටිය සූත්‍රය වගේ ධර්මානුකූල ක්‍රමවලින් ඒව ඉවත් කරන්න පුළුවන් දක්ෂ අය ඉන්නවා.

විශේෂයෙන් පිළිකා හැදෙන්නෙ අමනුස්සයො මුල් කර ගෙනමයි කියන කාරණය පෙන්වල, ඒ අමනුස්සයො ඉවත් කරල පිළිකා හොඳ කරන්න පුළුවන් අයත් ඉන්නවා. පිරිත් සූත්‍ර දේශනා අර ගෙන රෝගියා වටේට පිරිත් නූල් ඇදල, 108 වතාවක් විතර සෙත් කරල ඒ අමනුස්සයො ඉවත් කරන ක්‍රමවේද අදටත් තියෙනවා. එහෙම කරල දොස් කපල ඒ අය වෙනම සුද්ද කරල, අර ඇති වෙච්ච තුවාලවලට පොඩි පොඩි බේත් හේත් කළාම නැවතත් හට නොගන්නම ඒ රෝග සනීප කරන ක්‍රම තියෙනවා. ඒවත් සෙත් වතුර, පිරම්ඩ් වතුර වගේ විශේෂ ක්‍රමවලින් තමයි සනීප කරන්නෙ. වෛද්‍යවරු හොඳ කරන්න බෑ කියල පැත්තකට දාල තිබ්බ ලෙඩ්ඩුත් ඒ විදිහට අර ගෙන සනීප කරන්න පුළුවන් අය අදටත් ඉන්නවා. නමුත් ඒව ප්‍රසිද්ධ වෙන්න දෙන්නෙ නෑ. මිථ්‍යා දෘෂ්ටි, බොරු වැඩ කියල ඒවට පහර ගහනවා. මොකද මුදල් හදල් තියෙන ලෝක සම්මතයේ උගත් කියන සමහර පිරිස්, තමන්ගෙ තාන්න මාන්න රැක ගන්න විවිධාකාර මාධ්‍ය අල්ල ගෙන ඉන්නෙ. ඒ අයගෙ පැවැත්මට තමයි ඒක කරන්නෙ. පාරම්පරිකව ආපු මෙච්චර වටිනා වෙද හෙදකම්, සාස්තර ක්‍රම ඒකෙන් විනාශ කරන්න උත්සාහ කරනවා. මොකද අද ඉන්න මිනිස්සුත් බොහෝ කොටම පිළිගන්න පුරුදු වෙලා ඉන්නෙ, රටේ ලෝකයේ උගත් කියල සම්මත අය විවිධ ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍යවලින් කරන ප්‍රකාශ. නමුත් ඒ වගේ මාධ්‍යවලින් ප්‍රසිද්ධ නොවුනත්, තමන්ගෙ අධ්‍යාත්මික ශක්තියකින්, පාරම්පරිකව ප්‍රගුණ කරපු ක්‍රමයකින් ලෙඩ රෝග සනීප කරන්න පුළුවන් අය, ඒ වගේම වස විස ගහන්නෙ නැතිව විවිධ කෙම් ක්‍රම, ගුප්ත ක්‍රම පාවිච්චි කරල බොහොම සශ්‍රීකව ගොවිතැන් බත් කරන්න පුළුවන් අය අදටත් ඉන්නවා.

ඉතින් මේ වගේ දේවල් ගැන මිනිස්සු මීට වඩා දැනුවත් වෙලා, ඒ වගේ ක්‍රම නැවත අනුගමනය කළොත් තමයි මේ තියෙන මහා පීඩිත තත්ත්වයෙන් ගොඩ එන්න පුළුවන් වෙන්නෙ. නැත්නම් ඉතින් බොහොම ලේසියට කෙටි ක්‍රම හොයන්න ගිහින් අන්තිමට වස විස නිසා නහින්න තමයි වෙන්නෙ. **දැනටත් මිනිස්සු කන බොන ආහාරවලට එකතු කරන වස විසවලින්ම තමයි ලෙඩ වෙලා ආයුසත් අඩු වෙලා අඩු වයස්වලින් මැරෙන්නෙ. ඒ වගේ වස විස පාවිච්චි කිරීමේ කර්ම විපාක ඇතුළු භයානක පැතිකඩවල් පෙන්වා දීල, මනුස්සයින්ගෙ අධ්‍යාත්මය වැඩෙන්න ක්‍රම පෙන්වා දෙන අය බොහොම අඩුයි.** ඒ නිසා මේ මතු වෙච්ච පැරණි ක්‍රම ටිකෙන් හරි, පුළුවන් විදිහට ප්‍රයෝජන ගන්න මනුස්සයො කටයුතු කරන්න ඕන.

ඒ වගේම මේ පුණ්‍ය සෘද්ධි ගැන කතා කරන කොට, බුද්ධ සාසනයේ තියෙන බලවත් බව පෙන්වන එක්තරා සිද්ධියක් මට පෞද්ගලිකවම අත් දකින්න ලැබුණා. එතැනදි මම මේ වැඩ ඉන්න අරිය චින්තාශ්‍රම බෞද්ධ විහාරස්ථානය ගොඩ නගන මුල් කාලයේ සාසනික ආධාර වශයෙන් ලැබිච්ච මුදල් පරිත්‍යාග පිළිබඳ ප්‍රශ්නයක් මුල් කර ගෙන තමයි ඒ සිද්ධිය වුණේ. ඒ කියන්නෙ සාසනයේ දියුණුව වෙනුවෙන් මේ ස්ථානය ගොඩ නගල කටයුතු කරන්න පින්වතුන් විසින් විවිධ අවස්ථාවල විවිධාකාරයෙන් සාසනික වශයෙන් මුදල් පරිත්‍යාග කරනවා. ඒ මුදල් පරිත්‍යාග ලැබෙන කොට, ඒ සම්බන්ධයෙන් කටයුතු කරන මහත්වරු ඒවා කොළයක සටහන් කරල ගැනල තමයි අන්තිමට මගේ අතට දෙන්නෙ. පින්වතුන් සාසනය කෙරෙහි බොහොම ශ්‍රද්ධාවෙන් දෙන මුදල් පරිත්‍යාග නිසා මමත් ඒවා කෙස් ගහටම අඩුවක් නොවෙන්න ගැනල පරිස්සම් කරල ඒ සාසනික කටයුතුවලටම යොදවනවා. පුංචි මුදලක් එහෙ මෙහෙ වුනත් මට ඒක දැනෙනවා. ඒ ලැබිච්ච සාසනික ආධාරවලින් තමයි එදා බොහොම පොඩියට පටන් ගත්තු මේ පූජනීය ස්ථානය, භික්ෂූන් වහන්සේලා ඇතුළු විසාල පින්වතුන් පිරිසකට පින් දහම් කටයුතු කර ගන්න පුළුවන් විදිහට අද සකස් වෙලා තියෙන්නෙ.

ඉතින් මේ කියන ප්‍රශ්නයෙදි මුලින් ඔය විදිහට ලැබිච්ච මුදල් පරිත්‍යාග ප්‍රමාණයකට වෙච්ච දෙයක් නැතිව ගියා. දළ වශයෙන් ලක්ෂ 5 - 6 ක විතර මුදල් පරිත්‍යාග ප්‍රමාණයක් හොයා ගන්න බැරි තත්ත්වයට අස්ථානගත වෙලා තිබුණා. ඒ කියන්නෙ මගේ අතට දීපු සටහන්වල එකතුව බැලුවම, ඊට වඩා අඩු මුදල් ප්‍රමාණයක් තමයි ගැනල බලද්දි තිබුණෙ. නමුත් පැහැදිලිවම දන්නවා, ඊට වඩා වැඩි මුදල් පරිත්‍යාග ප්‍රමාණයක් සාසනික ආධාර වශයෙන් පින්වතුන්ගෙන් ලැබිච්ච බව. මොකද ඒ මුදල් ආධාර පින්වතුන්ගෙ නම් ගම් එක්කම සටහන් කරල තියෙනවා. හැබැයි මේ සිද්ධිය වුනේ, දැන් ඒ සම්බන්ධයෙන් කටයුතු කරන පින්වතුන් ඒ කටයුතුවලට සම්බන්ධ වෙන්න පෙර. ඒ නිසා දැන් ඒ කටයුතු කරන පින්වතුන් මේ සිද්ධියට සම්බන්ධ නෑ. ඒ අය ගැන වැරදි අවබෝධයක් ඇති කර නොගන්නයි එහෙම කිව්වෙ.

ඉතින් ඔය සිද්ධිය වෙලා එක්තරා කාලයක් ගත වුණා. ඒ අතරත් පින්වතුන් විවිධාකාරයෙන් සාසනික ආධාර කරල යනවා. පසළොස්වක පෝය, මාසෙ පෝය වගේ දවස්වලට පින්වතුන් විශේෂයෙන් එන නිසා වැඩිපුර සාසනික ආධාර කරනවා. ඒ අතර තවත් පින්වතුන් ඒ වැඩ කටයුතුවලට සම්බන්ධ වුණා. ඔහොම ගිහින් ඊට පස්සෙ ලැබෙන සාසනික මුදල් ආධාරත් අර විදිහටම ගැනල බැලුවම, සටහන්වලට වඩා රුපියල් 50,000/-, 75,000/- වගේ වැඩි ආධාර ප්‍රමාණයක් තිබුණා. සමහර දවස්වල සටහන්වල තියෙන ගණනටත් වඩා වැඩි මුදල් ප්‍රමාණයක් ගණින කොට තියෙනවා. ඒ කියන්නෙ ඒ සම්බන්ධයෙන් කටයුතු කරන පින්වතුන් දෙතුන් දෙනෙක් විතර එකතු වෙලා, ඒ මුදල් දෙතුන් වතාවක් විතර ගැනල පොතක වෙනම සටහන් කරල, ඒ සටහනත් එක්කම මුදල් ටික රබර් පටියකින් ඔතල මගේ අතට බාර දෙනවා. හැබැයි මම අර ගෙන ගණින කොට අර සටහන්වල තියෙන මුදල්වලට වඩා වැඩි ප්‍රමාණයක් එතන තියෙනවා. මමත් දෙපාරක් විතර ගැනල බලනවා. ඒත් මුදල් වැඩිපුර තියෙනවා. ඒ මහත්වරු මගේ අතට දෙන ගාන නෙවෙයි ගැනල බලන කොට තියෙන්නෙ. මගේ අතට එන කොට තමයි ඒ විදිහට මුදල් වැඩි වෙන්නෙත්. කවුරුවත් මට දැනුම් දෙන්නෙවත් නෑ කාගෙවත් සල්ලි අඩු වෙනව කියලවත්. කොහොම හරි ඔය විදිහට විවිධ අවස්ථාවල විවිධ මුදල් ප්‍රමාණයන් වැඩි වෙලා, මාස 8 ක් 10 ක් විතර යන කොට වැඩිපුර ලක්ෂ 6 ක් විතර ලැබිල තිබුණා. ඒ කියන්නෙ අර කලින් නැති වෙච්ච ප්‍රමාණය පියවෙන කල්ම ඒ මුදල් ලැබුණා. කොයි ක්‍රමයකට හරි හිඟ වෙච්ච මුදල ලැබුණා. කාගෙන් කොහෙන් ආවද කියන්න දන්නෙ නෑ. හිඟ වෙච්ච මුදල පියවෙන්නම ආවා. මමත් දන්නෙ නෑ මොන හේතුවකින් ඒක වුනාද කියල. ඒ වගේම ඒ අඩුව පිරවුනාට පස්සෙ නැවතත් වැඩිපුර ආවෙත් නෑ. ඒකෙත් විශේෂත්වයක් තියෙනවා.

ඉතින් මේ ගැන අපිට හිතන්න තියෙන්නෙ, යහපත් සේ ලැබුණු සාසනික දේවල් නිකරුනේ විනාශ කරන්න බෑ කියල. සාසනයට හිමි දේ අහිමි කරන්න බෑ, කොහොම හරි කැරකිලා ආපහු එනවා. ඒ වගේම අහිමි දෙයක් බලෙන් එන්නෙත් නෑ. ඒ සිද්ධිය මමම අත්දැක්කා. ඒ සම්බන්ධයෙන් කටයුතු කරපු ඒ මහත්වරුන්ටත් ඒ අත්දැකීම තියෙනවා.

සටහන

**නීතිඥ චන්දන සිරිවර්ධන**

# පුණ්‍යානුමෝදනාවකදී අයුතු ලාභ ලබන මිත්‍යා දෘෂ්ටික අමනුස්සයින්ගෙන් වන හිරිහැර වළක්වා ගැනීම....

පුණ්‍යානුමෝදනාවක් නිවැරදිව සිද්ධ කරන ආකාරය මීට පෙර අවස්ථා කිහිපයකදිම මේ සඟරාවෙ දීර්ඝ වශයෙන් විස්තර කරල තියෙනවා. නමුත් පසු කාලීනව වහරක අභයරතනාලංකාර හිමියන්ට පෞද්ගලිකවම අත්දකින්න ලැබිච්ච අමනුස්ස හිරිහැර නිසා ඒ වගේ පුණ්‍යානුමෝදනාවක් යම් ආකාරයක වෙනස් කිරීමකට ලක් කරල සිද්ධ කිරීමේ වැදගත්කම, අනිත් අයගේ දැන ගැනීම පිණිස උන් වහන්සේ මේ විදිහට හෙළිදරව් කළා.

පුණ්‍යානුමෝදනාවක් කරන කොට ආයුස, වර්ණය, සැපය, බලය, පටිභාන ඥානය කියන මේ කාරණා 5 ත් ලැබෙන්න කියල තමයි අනුමෝදන් කරන්නෙ. එතකොට එත්තාවතාව අම්මේහි ...., ඉදං වෝ ඥාති නං හෝතු .... ආදී වශයෙන් කියන ගාථා කියල මළගිය ඥාති ප්‍රේත අමනුස්ස කොටස් ඇතුළු සියලු සත්වයින්ම මේ කාරණා පහෙන් සුඛිත මුදිත වෙත්වා කියල පැන් වඩල අනුමෝදන් කරනවා. හැබැයි අපි නොදන්නවට අපේ සමහර මියගිය ඥාතීන් මිත්‍යා දෘෂ්ටිවල ඉන්නෙ. ඒ වගේම අපි ඇසුරු කරන සමහර අමනුස්සයොත් මිත්‍යා දෘෂ්ටිවල ඉන්නෙ. අපි අර විදිහට කියල පින් දුන්න ගමන් ඒ මිත්‍යා දෘෂ්ටික අමනුස්සයො බල ලබනවා. හැබැයි එහෙම ලබාගත්තට පස්සෙ උන්ගෙ කිසිම අණක් ගුණක් නෑ. උන් ඒකෙන් බලවත් වෙලා අර විදිහට පින් දීල බල දුන්නු අයටම පහර ගහනවා. ඒකෙන් අයුතු වැඩ කරනවා. සමහර වෙලාවට පින් දුන්නු අයට පස්ස පෙන්නලත් යනවා. ඒක අපි නොදකින පැත්තක්. මොකද සබ්බ සම්පත්ති සිද්ධියා, සුඛිතා හොන්තු ඥාතයෝ කියල කිව්වම උන් ගන්නෙ ඒකෙ ලෞකික අර්ථයෙන් කාම සම්පත්තියක් / කාම සුවයක්. උපාදාන කරන්නෙ කාම සුවයක්. ඒ වචන වැරදියට අල්ල ගන්නවා.

මොකද සුඛය කියල කිව්වට අපි ඒක ලෞකික ලෝකෝත්තර කියල වෙන් කළේ නෑ. ඒ නිසා මේ සුඛය කියන කොටත්, සබ්බ සම්පත්ති සිද්ධියා කියන කොටත් ලෞකික සැප සම්පත් සියල්ලම අයිතියි. ඒ කියන්නෙ ඒ ලෞකික සැපය, කාම සුවය විඳින්න එපා කියන එක නෙවෙයි, උන් ඒ කාම සුවය බලාපොරොත්තු වෙලා ඒක ලැබුනම ඒකෙන් මිත්‍යාචාර කරනවා, අයුතු ප්‍රයෝජන ගන්නවා. ඒක කරන්නෙ අපි අර ලබා දුන්නු බලය අරගෙන. අපි කියන සැපය, බලය උන් යොදා ගන්නෙ නරක දේවල්වලට.



ඒ තමයි දෘෂ්ටි ගතිකයන්ගෙ හැටි. එතකොට අර පින් දෙන අයගෙ හෝ පින් අනුමෝදනාව කරන හාමුදුරුවන්ගෙ සම්පත් / බලය දකිනවා. එහෙම දැකල ඒවා තමන්ට අයිති කර ගන්න, වහල් කර ගන්න, උන්ට ඕන හැටියට පාලනය කරන්න, බලහත්කාරයෙන් ගන්න බලනවා. මේ වගේ කරදර එන්න පටන් ගන්නවා.

මොකද ඒ ගුප්ත ලෝකවල අමනුස්සයින්ටත් කන්න බොන්න අඳින්න සම්පත් මැවි මැවී එනකොට, මුන්ට මෙච්චර තියෙනව අපිට නැනෙ කියල පින් දෙන අය කෙරෙහි ඉරිසියාවක් හටගන්නවා. පුන්‍යානුමෝදනාව කරන භික්ෂූන් වහන්සේ කෙරෙහිත් ඉරිසියාවක් හටගන්නව කියන්නෙ උන්ගෙ මිත්‍යා දෘෂ්ටියේ හැටි. උදාරණ විදිහට කවුරුහරි දානපතියෙක් නැති බැරි අය අතර නොමිලේ ආධාර මල්ලක් බෙදා දෙනකොට, මල්ල පිටින්ම හොරකම් කරගෙන දුවන්න බලන අයත් ඔය අතර ඉන්නවා. තවත් තියේනම් ඒ දානපතිය මරල හරි ගන්න බලන අයත් ඉන්නවා. මිත්‍යා දෘෂ්ටික අමනුස්සයින් කියන්නෙත් ඔය වගෙ ජාතියක්.

ඒ නිසා ඒ අයට පින් දෙන කොට වෙනත් ක්‍රමයක් අනුගමනය කරන්න වෙනවා. සබ්බේ භූතා ...., සබ්බේ ඥාති පේතා ... ආදී වශයෙන් කියන කොට මේ කියන මිත්‍යා දෘෂ්ටික සියල්ලම අහුවෙන නිසා තමයි ඒ ගැටළුව එන්නෙ. මොකද අපි ඒ කාරණය නොදැන තමයි මුලදි පින් ...මෝදන් කළේ. එතකොට මම මේ ... අත්දැකීමකට මුහුණ දීල තිබුනෙ නෑ. ... ගුප්ත ලෝකයේ විසාල අමනුස්ස ...ක් ඒකට නැඹුරු වෙලා ඒකෙන් මහ ...යක් ලැබුවා. සබ්බේ භූතා ... ආදී ...යන් සියලු අමනුස්ස කොටස් ...වන්න කිව්වම මිථ්‍යා දෘෂ්ටික ...ස්සයොත් ඕකට අහුවුණා. උන් ...න් බල ලබාගෙන අපේ බලය මැඩ ...වන්න ක්‍රියාත්මක වෙන්න පටන් ගත්තා. ඒකෙන් මට මහ කරදරවලට මුහුණ දෙන්න වුණා. ඒක මෑත කාලීන අත්දැකීමක්. මීට කලින් මේ වගේ අත්දැකීමක් ලබල තිබුනෙ නෑ. මොකද මෙච්චර කාලයක් දීපු පින්වලින් අමනුස්සයින්ගෙ බලය ක්‍රමයෙන් වැඩි වේගෙන ඇවිත් අන්තිමට සීමාවත් ඉක්මවා ගියාට පස්සෙ තමයි මට ඒක දැනුනෙ. කොච්චර ඉක්මෙව්වද කියනව නම්, ලෝක පාලක දෙවියන්ගෙ බලයත් ඉක්මෙව්වා. ඒ කියන්නෙ මේ මිත්‍යා දෘෂ්ටික ඥාති අමනුස්සයින් රෑ දවල් දෙකේම අපි අස්සෙම රිංග ගෙන කට දිහා බලාගෙන, දෙන හැම එකක්ම ගන්න පටන් ගත්තා. ලෝක පාලක දෙවියන් වුනත් ඒ බලය ගන්න හැම තිස්සෙම ඇහුම් කන් දෙන්නෙ නෑ. මොකද අමනුස්සයො වටවෙලා ඉන්නකොට අඳුරුයි. දෙවියන්ට ගැලපෙන්නෙ නෑ. දෙවියන් දුරස්ව හිටියත් සම්බන්ධ වෙන්න ඉඩ තියන්නෙ නෑ. මනුස්සයින්ට යහපතක් කරන්න ඉඩ දෙන්නෙ නෑ. උන් විවිධ අදහස් දානවා. දෙවියො සෙත් කිරණ එවන්න පෙර උන්ට පුළුවන් විස කිරණ/ විස බීජ ගෙනත් ☞

දාන්න. උන්ගෙ බල වැඩි වුනාම ඒක තමයි වෙන්නෙ. සමහර වෙලාවට උන් දෙවියන්ටත් කුණුහරුපෙන් බනිනවා. විශේෂයෙන් අසුර කොටස් දෙවියන්ට බනිනවට කැමතියි. ඉතින් දෙවියො කියන්නෙ ගහමරා ගන්න යන අය නෙවෙයි. ඒ නිසා දෙවියන්ට වඩා අමනුස්සයො තමන් ඉන්න තැන ඉඳගෙන බලවත් වුනා. ඒ කියන්නෙ පලයන් කිව්වත් යන්නෙ නෑ. ගහල පන්න ගන්නත් බෑ. කියන එකක්වත් ගණන් ගන්නෙ නෑ. ඉතින් මොනව කරන්නද? තල්ලු කරන්න පෙරලන්න බෑ. බලය ඒ තරම් වැඩියි. අමනුස්සයින්ට පින් දීල බේරෙන එක ලේසි වැඩක් නෙවෙයි, හරි භයානක වැඩක් කියල ඒකෙන් මට පැහැදිලිවම වැටහුණා.

එතකොට මේ මිත්‍යා දෘෂ්ටිකයන්ට මුලින් බල නෑ. බල දුන්නට තියා ගන්න බෑ. අපි නිතර නිතර බල දෙනකොට තමයි උන් බලවත් වෙලා අපිට කරදර කරන්නෙ. බල නොදී ඉන්න කොට උන්ගෙ බල පිරිහෙනවා. මොකද ඒක බලෙන් ගන්න බෑ. දුන්නොත් විතරයි බල ලබන්න පුළුවන්. දුන්න ගමන් අර වගේ නීච වැඩ කරනවා. උන් කරන දහ ජරා වැඩ සියල්ලම අපේ පිට දානවා. දැන් ඔය පින් අනුමෝදනා කටයුතු එකක්වත් කරන්න ඕන නෑ, ඕව ඇති කියල උන්ගෙ මිත්‍යා දෘෂ්ටියෙන් ඔහොමත් අදහස් දෙනවා. ඒ ගතිය අහක් කරන්න බෑ. ඒ කියන්නෙ මේකෙ වටිනාකම නොදන්න නිසා. උදාහරණ විදිහට තාත්ත කෙනෙක් රස්සාවක් කරල පුතාට හරි හම්බ කරල දෙනවා. හැබැයි පුතාට මොළයක් නැත්නම්, ඒ හම්බ කරන රස්සාව ගැන තැකීමක් නෑ. ඌට ඕන හම්බ කරන එක කකා ඉන්න විතරයි. දුන්නු දෙයක් කනව මිසක් රස්සාවට හෙණ ගැහිල ගියත් ඌට ගානක් නෑ. අන්න ඒ වගේ තමයි මෙතනදිත්. පින් දෙන කොට ඒ සමහර අමනුස්සයින්ට තේරුම් ගන්න බෑ මේ අහවලාගෙන් අහවල් ක්‍රමයට තමයි තමන්ට පින් ලැබෙන්නෙ කියල. අපිත් එකයි උඹත් එකයි, අපේ බලය තමයි උඹ ළඟ තියෙන්නෙ, අපි නිසා උඹ ඉන්නෙ .... ඔය වගේ අදහස් තමයි උන් ගන්නෙ.

ඉතින් ඉන්න තැන බල වැඩිවෙන එකයි වෙන්නෙ. යහපත් පැත්තට හැදෙන අමනුස්සයෙක් ඉන්නව නම් ඒ ඉතාම කලාතුරකින්. එතකොට මේ විදිහට පහර ගහන්නෙ උන්ගෙ බල නැගෙන කොට. උදාහරණ විදිහට හිඟන්නෙක් තුවක්කුවක් නැතිව හැරමිටියෙන් වෙඩි තියන්න දඟලුවට වෙඩි තියන්න බෑ. හැබැයි උගේ අතට තුවක්කුවක් ලැබුනොත් මොනවා කරයිද ? ඒ වගේ දෙයක් තමයි මෙතනදිත් සිද්ධ වෙන්නෙ.

මේ හේතුව නිසා කලින් අපි අත් හැරල දාල තිබිච්ච ආකාසට්ටාච භුම්මට්ටා ... කියන ගාථාවත් පින් අනුමෝදනාවකදි ගන්න වෙනවා. ඒ ගාථාව කියන කොට අහසේ වසන්නා වූ, පොළවේ වසන්නා වූ, මහා සෘද්ධිමත් වූ දේව කොට්ඨාස ඇත්ද, ඒ සියල්ලෝම මේ පින් අනුමෝදන් වෙත්වා, චිරාත් කාලයක් ලෝකයේ සාසනය ආරක්‍ෂා වෙත්වා කියන අදහස එනවා. එතකොට එත්තාවතාව අම්මේහි, ඉදං මේ ඥාති නං හෝතු ... කියන ගාථා දෙක නොගෙන සිංහලෙන් මේ විදිහට කියන්න ඕන. **යම් කිසි මිත්‍යා දෘෂ්ටික ඥාති බලවේග හෝ අමනුස්ස බලවේග හෝ කවුරු හරි ඇත්නම් ඒ අයට දස අකුසල් දුරු කර ගන්නත්, දස කුසල් වඩන්නත්, දස පුණ්‍ය ක්‍රියා කරන්නත්, ඒ වගේම සම්‍යක් දෘෂ්ටික සුගති අත්බැව් ලබන්නත් මේ පුණ්‍ය කුසල ආශිර්වාදය හේතු වාසනා වේවා! හේතු වාසනා වේවා! හේතු වාසනා වේවා!** මේ විදිහට සිංහලෙන් කියනවා.

මේ විදිහට කිව්වම අපි වළක්වන්නෙ ඒ අමනුස්සයින්ගෙ නරක කොටස විතරයි. ඒකට අනුබල දීමක් වෙන්නෙ නෑ. ඒ නිසා මේ පින් අනුමෝදනාවකදි මිත්‍යා දෘෂ්ටික අමනුස්සයො කපා හරින්නෙ නෑ. නමුත් **සමහරු, මිත්‍යා දෘෂ්ටික අමනුස්සයින්ගෙන් තමන්ට හිරිහැර කරදර වුනයි කියල ඒ අයගෙන් පළි ගැනීමේ චේතනාවෙන් ඒ අය සම්පූර්ණයෙන්ම කපා හැරල පින් නොදී ඉන්නවා. ඒක ගැළපෙන්නෙ නෑ. එහෙම අය කවද හරි මැරිල ඒ අමනුස්ස ලෝකවලට ගියොත්, තමන්ට නොසලකා හැරීම නිසා ඒ අයටත් ඒ ලෝකවල ඉන්න අමනුස්සයින්ගෙන් හිරිහැර විඳින්න සිද්ධ වෙනවා. එහෙම වෙච්ච අවස්ථා තියෙනවා. ඒ නිසා ඒකෙ බරපතලකමත් තේරුම් ගන්න ඕන.**

දැන් මේ විදිහට සිංහලෙන් කියල ඊළඟට ආකාසට්ටාච කියන ගාථාව කියල චිරං රක්ඛන්තු ලෝක සාසනං කියල අවසන් කරනවා. අන්තිමට ඉමිනා පුඤ්ඤ කම්මේන .... ඉදං මේ පුඤ්ඤං ආසවක්ඛයා .... කියන ගාථා දෙකත් ගත්තට ගැටළුවක් නෑ. මොකද ඒවායින් කරන්නෙ, මේ පුණ්‍ය කර්මයෙන් බාල සමාගමයක් නොවේවා.... නිවන් දක්නා ජාති දක්වා සත්පුරුෂ සමාගමක්ම වේවා... මේ පුන්‍ය ශක්තිය සියලු ආශ්‍රව ක්‍ෂය කරන්න හේතු වාසනා වේවා.... ආදී වශයෙන් යහපත් ප්‍රාර්ථනාවක්. ඒ විදිහට පින් දුන්නම කවුරුවත් කපා හැරෙන්නෙ නෑ. සියලු සත්වයෝම අහු වෙනවා. එතකොට හේතු වාසනා තියෙන අය ගන්නවා. ඒ වගේම යම් ඥාතියෙක් දේවත්වයේ ඉන්නව නම්, දේවානාගා මහිද්ධිකා .... කියන කොට ඒ අයටත් ඒ පින ලැබෙනවා. හේතු වාසනා නැති අයට ලැබෙන්නෙ නෑ. අවශ්‍ය අය මග හැරෙන්නෙත් නෑ. එතකොට අර අනවශ්‍ය මිත්‍යා දෘෂ්ටිකයන්ගෙ බල නැති වෙලා යනවා. හේතු වාසනා තියෙන අය ඉන්නව නම් යහපත් පැත්තට එල ලබනවා.

බොහෝ කොටම මේ මිත්‍යා දෘෂ්ටික බලවේගවල යක්‍ෂ, අසුර කොටස් තමයි ඉන්නෙ. දේවා නාගා මහිද්ධිකා .... කියන කොට මහා සෘද්ධිමත් දේව නාග කියල තමයි අර්ථය එන්නෙ. එතකොට යක්‍ෂ, අසුර කොටස් ඒකට අහු වෙන්නෙ නෑ. නාග කියන්නෙ නායකයො කියන අර්ථයෙන්. නමුත් නාග ලෝකය ගත්තත් ඒත් ගැටළුවක් නෑ. ඒ අය මිත්‍යා දෘෂ්ටිකයින්ට අයිති වෙන්නෙ නෑ. ඊළඟට පුඤ්ඤංතං අනුමෝදිත්වා කිව්වම, මේ පින් අනුමෝදන් වෙත්වා කියලයි කියවෙන්නෙ. ලබත්වා කියල කියවෙන්නෙ නෑ. අනුමෝදන් වීමයි, ලැබීමයි අතර ලොකු වෙනසක් තියෙනවා. මොකද නිකං දෙන එක ලැබුනට, අනුමෝදන් වීම තමන්ම කරගන්න ඕන. නමුත් මිත්‍යා දෘෂ්ඨිකයින්ට ඒක කරගන්න බෑ. ඒ නිසා ආකාසට්ටාච ... ගාථාව කිව්වොත් ඒ යක්‍ෂ, අසුර වගේ අමනුස්ස කොටස් අහුවෙන්නෙ නෑ. නමුත් අර ගාථා දෙකෙන් කිව්වොත් ඒ අයත් අහු වෙනවා.

එහෙම නැත්නම් අර මුලින් කියපු ගාථා 2 විතරක් ගන්නෙ නැතිව, දානයක් දෙන වෙලාවට සම්පූර්ණ තිරෝකුඩ්ඩ සූත්‍රයම අරගෙන පැන් වඩල පුණ්‍යානුමෝදනාව කරන්න ඕන. හැබැයි තිරෝකුඩ්ඩ සූත්‍රයේ තියෙන්නෙ ඉදං වෝ ඥාති ... ගාථාව විතරයි. ඒ නිසා එත්තාවතාව ... කියන ගාථාව ගන්න අවශ්‍ය නෑ. මුළු සූත්‍රයම අර ගන්නෙ නැතිව කොටසක් විතරක් අරගෙන පුණ්‍යානුමෝදනාව කරන කොට තමයි අර වගේ ගැටළු එන්නෙ. මොකද කොටසක් විතරක් අර ගත්තම මේ ගාථාවල තියෙන සුඛිතා හොන්තු .... සබ්බ සම්පත්ති සිද්ධියා ..... ආදී වශයෙන් කියන කොටස් තමයි අමනුස්සයො වැරදි විදිහට අල්ල ගන්නෙ. එතකොට සියල්ලම අහු වෙනවා. අනුමෝදන් නොවී අපි දෙන සම්පත් / බලය විතරක් ගන්නවා. නමුත් පැන් වැඩීමත් එක්ක සම්පූර්ණ තිරෝකුඩ්ඩ සූත්‍රයම ගත්තම ඒ විදිහට කොටසක් විතරක් අල්ල ගන්න බෑ. ඒ නිසා තිරෝකුඩ්ඩ සූත්‍රය අනුව පින් දීම කරනව නම් ඒක සම්පූර්ණයෙන්ම කියල මියගිය ඥාති අමනුස්සයින්ව සම්බන්ධ

කරල, ආකාසට්ටාච කියන ගාථාවෙන් දේවතා කොට්ඨාසවලට පින් දුන්නම ගැටළුව ඉවරයි.

ඒ කියන්නෙ තිරෝකුඩ්ඩ සූත්‍රයත් හැම තිස්සෙම පාවිච්චි කරන එකක් නෙවෙයි. මියගිය ඥාති හිතමිත්‍රාදීන් වෙනුවෙන් දානයක් දීල පැන් වඩන වෙලාවක, කොටසක් විතරක් නොගෙන මේ සූත්‍රයේ තියෙන කොටස් 13 ම අරගෙන පින් දුන්නම ගැටළුවක් නෑ. මොකද ඒ සූත්‍රයේ සියල්ලම පැහැදිලි කරල තියෙනවා. එතකොට වැරදියට අදහස් ගන්න බෑ. මිථ්‍යා දෘෂ්ටික අමනුස්සයින්ට ආයුස, වර්ණය, සැපය, බලය, ඥානය කියන පහ පිහිටාවා කියන එකයි වැරැද්ද. ඒක අමතරව දෙන දෙයක් නිසා මිත්‍යා දෘෂ්ටිකයන්ට පින් දෙන කොට ඒ ගැන නොකිය ඉන්න ඕන.

එතකොට මේ ගාථා දෙකෙන් ඉදං වෝ ඥාති ... කියන ගාථාව විතරයි ත්‍රිපිටකයේ තියෙන්නෙ. අනිත් ඒවා දාන් තියෙන ත්‍රිපිටකයේ නෑ. හැබැයි ත්‍රිපිටකයේ නැති වුනාට ඒ ගාථා වුනත් වැරදි නෑ. අර විදිහට අනුමෝදන් කළාම අමනුස්ස කරදර එන එකයි ගැටළුව. ඒක ගාථාවල වැරැද්දක් නෙවෙයි. අපි කරන ක්‍රමයේ වැරැද්දක්. මුල් කාලෙත් තිරෝකුඩ්ඩ සූත්‍රයම ගත්ත මිසක් කොටසක් විතරක් අරගෙන පින් වැඩුවෙ නෑ. නමුත් පසු කාලීනව තැනින් තැන කොටස් අරගෙන පින් වඩන්න ගත්තම තමයි ඔය ගැටළුව ආවෙ. ඉතින් මම වැඩි හොඳටයි කියල ඔය විදිහට අනුමෝදන් කළාම, අන්තිමට උන්ගෙ බලය වැඩි වෙලා මගේ බල සීමාව ඉක්මෙව්වා. මම බල පිහිටවපු නිසයි එහෙම වුණේ. අන්තිමට උන් බලවත් වෙලා මාව මෙල්ල කරන්න ගත්තා. එකෙක් නෙවෙයි මහ විසාල සංඛ්‍යාවක්. ඉතින් උන් සියල්ලම එකතු වුනාම මට කර කියා ගන්න දෙයක් නැතිව ගියා. මේක මට විතරක් නෙවෙයි, දැනට තේරෙන්නෙ නැති වුනාට අනිත් භික්ෂූන් වහන්සේලාටත් ගිහි පින්වතුන්ටත් සිද්ධ වෙන්න පුළුවන්.

හැබැයි ඒ පැරණි ක්‍රමයට පින් දීල සමහර විට ඒ වගේ කරදර නොඑන්නත් හේතුවක් තියෙනවා. මොකද ඒ දෙන පින් බලය උන්ට අරගෙන බලවත් වෙන්න තරම් ප්‍රබල නැත්නම් ගැටලුවක් නෑ. තමන් දියුණු කරපු අධ්‍යාත්මික ශක්තිය වැඩිනම් තමයි ඒ වගේ මහ බලයක් නගන්න පුළුවන් වෙන්නෙ. එතකොට තමයි අමනුස්සයන්ටත් බල ලැබෙන්නෙ. ඉතින් මේ කාලය වෙන කොට අධ්‍යාත්මික ශක්තිය විශාල වශයෙන් දියුණු කරපු අය අඩු නිසා ඒ විදිහට කළැයි කියල හැමෝටම ඒ වගේ අමනුස්ස කරදර එන්නෙ නෑ. ඒ වගේ අය කරන පින් දීම්වලින් අර වගේ විසාල පුණ්‍ය ශක්තියක් අමනුස්සයින්ට ලැබෙන්නෙ නෑ. නමුත් අර වගේ මහා පුණ්‍යානුමෝදනාවක් එක්ක ආයුස, බලය, වර්ණය, සැපය.... කියන මේවා පිහිටාවා කියල අධිෂ්ඨාන කළාම ඒ ශක්තිය කෝටි ප්‍රකෝටි ගණනින් බලවත් වෙලා ඒ අයට ලැබෙනවා.

මෙතනදි අපේ තියෙන ශක්තිය තමය අපි දෙන්නෙ. උදාරණ විදිහට යම්කිසි රෝගියෙකුට බාහිරින් බෙත්හේත් දීල කිරණ ශක්තිය දෙනව වගේ. එහෙම දුන්නට පස්සෙ ඒ රෝගියාට ඒක ලැබෙනවා. හැබැයි එහෙම බෙත් කිරීමත් / ශක්තිය දීමත් හැම කෙනෙකුටම එක වගේ කරන්න බෑ. ඒකට යම් දක්ෂතාවයක් / හැකියාවක් තියෙන්න ඕන. ඒ හැකියාව විවිධ පුද්ගලයන් අනුව අඩු වැඩි වෙන්න පුළුවන්. ඒ අනුව තමයි ඒ රෝගියාගෙත් සෞඛ්‍යය යථා තත්වයට පත්වෙලා නිරෝගි වෙන්නෙ. මේ වගේ තමයි අපි පුන්‍ය ශක්තිය දෙනකොට මිත්‍යා දෘෂ්ඨික අමනුස්සයින්ට අනුමෝදන් වෙන්න බැරි වුනාට, ඒ දෙන ශක්තිය ලැබෙනවා. මොකක් හරි හිමිකමක් තියේනම් තමයි එහෙම ලැබෙන්නෙත්. අනන්ත සසරේ අපිත් එක්ක ආපු පිරිස බලද්දි, එහෙම මොනව හරි හිමිකමක් තියෙන නිසාම තමයි ඒවා ඒ අයට ලැබෙන්නෙත්. අපේ තියෙන මනුස්සකමට අපි ඒක කළාට මේ කියන සමහර අමනුස්සයින්ට ඒක ගානක්වත් නෑ. සමහර එවුන් කන්න දුන්නු අතත් සපා කනවා. ඒවට ඉතින් සසරෙදි අපි අතින් සිදුවෙච්ච කර්ම විපාකත් බලපානවා.

ඒ නිසා මේ වගේ ගැටළු අද ඉන්න හැමෝටම නොඑන්න පුළුවන්. නමුත් දාන් මේ නිවන් දකින දහම මතු වෙන කාලයේ ඒ වගේ අධ්‍යාත්මික වශයෙන් බල නගන භික්ෂූන් වහන්සේලා සහ ගිහි පින්වතුන් ඉන්න නිසා, අර විදිහට අනුමෝදන් කළොත් ඒ අමනුස්සයො ඒ බලය ඉක්මවා ගිහින් ඉදිරියේදි ඒ අයටත් ඒ වගේ ගැටළු මතු වෙන්න පුළුවන්. නිතරම ඒ වගේ පින් දහම් කරල මහා පුණ්‍යානුමෝදනා එක්ක පින් දෙන අයට ඒ වගේ කරදර එන්න පුළුවන්. ඒ නිසා මේ ක්‍රමය දාන ගෙන ඉන්න එක හැමෝටම හොඳයි. එහෙම නැතිව මේ පැරණි ක්‍රමයට පින් දෙන්න එපා කියනව නෙවෙයි. ඒ විදිහට කළොත් මේ වගේ කරදර එන්න පුළුවන් නිසා ප්‍රවේසම් වෙන්න කියන එකයි මේ කියන්නෙ. ඒ නිසා අර අළුත් විදිහට පින් අනුමෝදනාව කළාම ඒ අමනුස්සයින්ට වැරදි වැඩ කරන්න ඒ බලය තියා ගන්න බෑ. පිරිහිලා යනවා.

මම අන්තිමට අමනුස්සයින්ගෙ නරකට පිහිටපු බලය දුරු වේවා කියල අධිෂ්ඨාන කළාම ඒවා අඩුවෙලා අර තිබිච්ච කරදර ලිහිල් වෙලා ගියා. මම මේක දාන ගෙන ඒ ක්‍රමය අනුගමනය කළාම අන්තිමට පූර්ණ වශයෙන්ම ඒ කරදර සුද්ධ වෙලා ගියා. අමනුස්සයින්ගෙ වැරදි පාලන ක්‍රමය බිඳ වැටුණා. අපේ සාසනික කටයුතුවලට විරුද්ධව නැගිච්ච නිසා ඒක ඒ අයටම සාපයක් වුණා. අර නගා ගත්තු සැපය, බලය අනිත් පැත්තට වැටුණා. සම්‍යක් දෘෂ්ටික කොටස් විතරක් ඒවායින් නිසි ප්‍රයෝජන ගත්තා.

එතකොට ඇත්තටම මේ ක්‍රමයට පින් දෙන කොට, අනුමෝදන් වෙන්න බැරි අයට අපි ඇඟිලි ගහන්න යන්නෙ නෑ. ඒක ඒ අය කර ගත්තු කර්ම විපාකවල හැටි. ඒකට අපිට කරන්න දෙයක් නෑ. අපේ ණය ගෙවන්න අපේ කොටස අපි දෙනවා. ගන්න බැරි නම් කරන්න දෙයක් නෑ. අර විදිහට සිංහලෙන් පින් දීමේ වාක්‍ය කිව්වම අපේ ණයක් තියේ නම් ඒක ගෙවෙනවා. මොකද මෙතනදි මිත්‍යා දෘෂ්ටිකයො පින් අනුමෝදන් වීමක් නෙවෙයි වෙන්නෙ. අපි යම් කිසි බලයක් දීල ඒක පිහිටාවා කිව්වම ඒක පිහිටා සිටීමක් වෙන්නෙ. එතකොට ඒ අමනුස්සයින්ගෙ ප්‍රිය මනාපය අනුව තමයි ඒක පාවිච්චි කරන්නෙ.

උදාහරණ විදිහට අපි නැති බැරි මනුස්සයෙකුට කන්න බොන්න කියල සල්ලි කීයක් හරි දෙනවා. හැබැයි ඒ මනුස්සය ඒකෙන් කසිප්පු බොන්න ගත්තොත්, කුඩු ගහන්න ගත්තොත් ඒකට අපිට කරන්න දෙයක් නෑ. ඒක ඒ මනුස්සයගෙ වැඩක්. ඒක ප්‍රයෝජනයට ගන්නෙ ඒ මනුස්සය කැමති විදිහට. මේ වගේ තමයි මේ කියන සමහර අමනුස්සයොත් උන්ගෙ තියෙන සසර හිමිකමකට සම්පත් ලැබුනත් ප්‍රයෝජන ගන්නෙ අයුතු විදිහට..

සාසනයට දානයක් දුන්නත් ආයුස, වර්ණය, සැපය, බලය, පටිභානය කියන කාරණා 5 ලැබෙන්න කිව්වම, උන් අනුමෝදන් නොවී ඒ සැපය, බලය විතරක් ගන්නවා. අපි දෙන කොට ඒකෙන් කොටසක් ඒ අයට ලැබෙනවා. සමහර වෙලාවට උන් හිතන්නෙ ඒක උන්ගෙම බලයක් කියල මිසක් කාගෙන්වත් ලැබිච්ච දෙයක් කියල නෙවෙයි. අපි ඒ දීම ශක්තිමත් කළාම ඒ අයගෙ බල තවත් වැඩි වෙනවා. හැබැයි සතුටු වෙලා සාධු කියන්නෙ නෑ. නමුත් දෙන එක ලැබෙනවා. ඒ කියන්නෙ පත්තිදානය. සුදුසු අය විතරක් අනුමෝදන් වෙලා මිත්‍යා දෘෂ්ටිකයො අපි දෙන එක අරගෙන අපිටම පහර ගහනවා. අනුමෝදන් ☞

# අභිධර්ම පිටකය බුද්ධ දේශනාවක් නොවේද?

තථාගතයන් වහන්සේ හතළිස් පස් වර්ෂයක් පුරා දේශනා කොට වදාළ 84,000 ක් ධර්මස්කන්ධය ධර්ම විනය නමින් හඳුන්වනවා. ''ආනන්ද මයා ධම්මෝච විනයෝච දේසිතෝ පඤ්ඤත්තෝ සෝ වෝ මමච්චයේන සත්ථා'' කියන මහා පරිනිබ්බාන සූත්‍ර පාඨයෙන් ඒ බව සනාථ වෙනවා. මෙයින් පෙන්වා තියෙන්නෙ ආනන්දය, මා විසින් ධර්මය දේශනා කළේය, විනය පනවන ලද්දේය, මගෙන් පසු එම ධර්ම විනය ඔබලාට සාස්තෘ කෘත්‍යය සිදු කරයි කියන කාරණය.

ධර්ම විනය වශයෙන් සඳහන් වෙන්නෙ ත්‍රිපිටකයේ නොයෙක් බෙදීම් ක්‍රමයක්. මේ ධර්ම විනය ගත්තම ත්‍රිපිටක බුදු වදන් අඩංගු වෙනවා. ඒක අභිධර්මය, සූත්‍ර දේශනාවලින් වෙන් කර දක්වීමක් මිසක්, ධර්ම ශබ්දයෙන් අභිධර්මය ඒ තුළ ඇතුලත් වෙන්නෙ නෑ කියල කියන්න බෑ. විනය පිටකයේ අභිවිනය කියල කොටසකුත් තියෙනවා. **විනය කියන වචනය තුළ අභිවිනය කියල කොටසක් තියෙනව වගේම, ධර්මය කියන වචනය තුළ අභිධර්මය කියල කොටසකුත් තියෙන බව පිළිගන්න ඕන.** විනය කියන ශබ්දයෙන් අභිවිනය කියල කොටසක් නෑ කියල පිළිගත්තොත්, ඛන්ධක පරිවාර කියන විනය පිටකයේ කොටසුත් බැහැර කරන්න සිද්ධ වෙනවා.

අභිධර්මය කියන්නෙ බුද්ධ ඥානයටම විෂය වෙච්ච අති සියුම් පරම ගම්භීර ස්කන්ධ, ආයතන, ධාතු, ඉන්ද්‍රිය, චතුරාර්ය සත්‍යය, පටිච්ච සමුප්පාදය, පට්ඨානය, චිත්ත, චෛතසික, මාර්ග ඵල, නිර්වාණ.... ආදී ධර්මයන් මාතෘකා වශයෙන් විභාග කොට වදාල විශිෂ්ට පරමාර්ථ ධර්මය. මේ පරම ගම්භීර පරමාර්ථ ධර්මය ස්වයංභූ ඥානයෙන් තත්වාකාරයෙන් අවබෝධ කර ගෙන දේශනා කරන්න සමත් වෙන්නෙ, අති දීර්ඝ කාලයක් පූර්ණ කළ මහා පාරමිතා බලයෙන් ලැබූ සර්වඥතා ඥානය තියෙන ලොව්තුරා බුදුන් වහන්සේලා විතරයි. ඒක ලෝකයේ වෙන කිසිම සාස්තෘවරයෙකුට කරන්න බෑ. තථාගතයන් වහන්සේ නමක් ලෝකයට පහළ වීමෙන් ඒ පරම සත්‍යය මතු කරල දුන්නට පස්සෙ, ශ්‍රාවකයන්ට තම තමන්ගෙ ප්‍රඥාවේ ප්‍රමාණයට වටහා ගන්න පුළුවන්. සූත්‍ර පිටකයේ තියෙන කරුණුවලින් බොහොමයක් අභිධර්ම පිටකයෙත් තියෙනවා. නමුත් ඒ මාතෘකා දේශනාවන් සූත්‍ර පිටකයේ වැඩිපුර බෙදල විස්තර කරල නෑ. බුද්ධ වචනය පිළිබඳ පූර්ණ සියුම් දැනුමක් ලබා ගන්න පුළුවන් වෙන්නෙ, අභිධර්මයේ බෙදල දක්වල තියෙන කරුණු අවබෝධ කර ගැනීමෙන්.

තථාගතයන් වහන්සේ ඇසළ පුර පසළොස්වක පොහොය දිනකදි තීර්ථකයන්ගෙ මානය දුරු කරන්න සැවැත් නුවර ගණ්ඩබ්බ රුක් මුලදි යමක මහා ප්‍රාතිහාර්ය පාල, අතීත බුදු පියාණන් වහන්සේලාගෙ චාරිත්‍රයට අනුව බුද්ධත්වයෙන් හත් වෙනි වස ගත කරන්න තව්තිසා දෙව් ලොවට වැඩියා. එතැන පරසතු රුක් මුල පණ්ඩුකම්බල ☞

---

වෙන්න කිව්වට එහෙම වෙන්නෙත් නෑ. මොකද ඒ අයගෙ ගති ගුණය මිත්‍යා දෘෂ්ටිකයි. ගුණ හීනයො වෙලා ඉන්නෙත් මිත්‍යා දෘෂ්ටිය නිසා. ඒක වෙනයි, තමන්ගෙ ලැබීම වෙනයි. එතකොට අපි පින් දෙන ක්‍රමය නිසාමයි උන්ට ඒ බල ලැබෙන්නෙ. ඒ කියන්නෙ බල පිහිටාවා කිව්වොත් ඒක අපි කරන එකක් නිසා ඒක පිහිටල උන්ට ලැබෙනවා. හැබැයි අනුමෝදන් වෙත්වා කිව්වොත් ඒක ඒ අයගෙ වැඩක් නිසා ඒක කර ගන්නෙ නෑ. එතකොට සුදුසු, හේතු වාසනා තියෙන අය විතරක් අනුමෝදන් වෙනවා. එහෙම සමහර කොටස් අනුමෝදන් වෙච්ච ගමන් දේවත්වයට පත් වෙනවා, නිදහස් වෙනවා.

එතකොට මේ අමනුස්සයො, ඥාති ප්‍රේතයො සියල්ලම මිත්‍යා දෘෂ්ටික කියනව නෙවෙයි, කොටසයි එහෙම අය ඉන්නෙ. අන්න ඒ කොටසේ ස්වභාවය තමයි මේ කිව්වෙ. එහෙම අය හිටියොත් සහ අර වගේ විසාල බලයක් නැගුවොත් තමයි ඔය වගේ කරදර එන්නෙ. ඉතින් පරලොව හිටපු මගේ ඥාතීන් වැඩි හරියක් ඔය කියන ජාතියේ අන්තිම කාලකණ්ණි අය. ඒ ගැන නොසලකා මමත් දයානුකම්පාවෙන් මහ විසාල ශක්තියක් නගල දුන්නා. ඒකයි එහෙම වුණේ. නමුත් අපට ඒ වගේ අය හැමෝටම ඉන්නවද නැත්ද, ඒ ශක්තිය නගන්න හැමෝටම පුළුවන්ද කියල හරියටම කියන්න බැරි නිසා, මේ පුණ්‍යානුමෝදනා කටයුත්ත බොහොම පරිස්සමට කරන එක කාට කාටත් හොඳයි. ඒ නිසා කිසිම අවස්ථාවක මිත්‍යා දෘෂ්ටික කොටස්වලට බල නගන්න හොඳ නෑ. සම්‍යක් දෘෂ්ටික අයට බල නැගුවට ගැටළුවක් නෑ. සම්‍යක් දෘෂ්ටික දිව්‍ය බ්‍රහ්මාදී තැන් පටන් සම්‍යක් දෘෂ්ටික සියලු දෙවිදේවතාවුන්ට ඒ විදිහට කියන්න ඕන. මිත්‍යා දෘෂ්ටික කියන වචනය ඒකට සම්බන්ධ කර ගන්න හොඳ නෑ. එහෙම කරන්න ගියොත් අපි කරපු දෙයින් අපිටම කරදර එන්න පුළුවන්.

ඉතින් හේතුව හරියට දන්නෙ නැති වුනාට ගෙවල්වල පින් දෙන්න එපා කියන්නෙත් ඔය හේතුව නිසා. මොකද මේ පින් දෙන ක්‍රම සියල්ලම ආචාර්ය වාද අනුව හදා ගත්තු විවිධ ක්‍රම නිසා, ගුප්ත ලෝකය දකින්න ක්‍රමයක් තිබ්බෙච නැති නිසා, ඒවායේ ක්‍රියාත්මක වීම කොහොමද කියල දැන ගෙන හිටියෙ නෑ. එහෙම නැතුව අර නියම ක්‍රමයට පින් දීම කරනව නම් ගෙදරදි පින් දුන්න කියල ගැටළුවක් නෑ. බුද්ධ පූජාවක් තියල පින් අනුමෝදන් කරන කොටත් මේ ක්‍රමයට කර ගත්තම ගැටළුවක් නෑ. එතකොට අයුතු දේවල් නැතුව අනිත් ලැබිය යුතු සියල්ල ලැබෙනවා. එහෙම නැතිව පාපී අමනුස්සයො එක්ක ඕනවට වැඩිය සෙල්ලම් කරන්න යන්න හොඳ නෑ. පුළුවන් තරම් ප්‍රවේසමෙන් අනුමෝදනාව කරන්න ඕන.

ඉතින් සමහර විට කෙනෙක් අපිට දොස් කියන්න පුළුවන්, එදා වෙන විදිහකට පින් දීම ගැන කියල අද තවත් විදිහකට කියනව කියල. ඇත්ත වශයෙන්ම එහෙම කිව්ව තමයි. නමුත් මේ පින් අනුමෝදන් කිරීමෙදි අපෙන් ඒ වගේ අඩුපාඩුවක් වුනා නම් අපි ඒක පිළිගන්නවා. දොස් කිව්වත් අපි ඒක වසන් කරන්නෙ නෑ. එදා අනුමෝදන් කරන කොට ගුප්ත ලෝකය ගැන එහෙම පුළුල්ව අත්දැකීමක් නොතිබ්බෙච නිසයි කාටත් පොදුවේ ආයුස, වර්ණය, සැපය, බලය, පටිභානය කියන මේ පහ ලැබිල සුඛිත මුදිත වෙත්වා කියල, පින් දීම වටිනව කියල හිතාගෙන ඒ විදිහට කළේ. නමුත් ඒ විදිහට පොදුවේ පින් දෙන්න ගියාම අමනුස්සයින්ගෙන් මෙහෙම කරදර එනව කියල මෑතකදි තමයි අත්දැකීම් ලැබුවෙ.

**සටහන:**

**නීතිඥ චන්දන සිරිවර්ධන**

සෛලාසනයේ වැඩ හිඳල, තමන්ගෙ මෑණියන් විදිහට දෙව් ලොව ඉපදිලා හිටපු මාතෘ දිව්‍ය රාජයා මූලික කර ගෙන දස දහසක් සක්වල දෙව් බඹුන්ට කුසලා ධම්මා, අකුසලා ධම්මා, අබ්‍යාකතා ධම්මා ... ආදී වශයෙන් මාස 3 කින් දේශනය නිම කරන්න පුළුවන් ප්‍රමාණයට හකුළුවල අභිධර්මය දේශනා කළා.

දෙව් ලොව අභිධර්මය දේශනා කරන තථාගතයන් වහන්සේ, දේශනය නොනැවතී පැවතීම සඳහා ඒ ධර්මාසනය මත බුදු රුවක් මවල, ඒ බුදු රුව මෙතෙක් ධර්ම දේශනා කෙරේවායි අධිෂ්ඨාන කරල, පිණ්ඩපාතයේ වැඩීම... ආදී කටයුතු සඳහා දිනපතා මනුස්ස ලෝකයට වැඩම කළා. මේ කාරණය සමහර දෙවිවරු දැන ගත්තා. සමහර දෙවිවරු දැන ගෙන හිටියෙ නෑ. මනුස්ස ලෝකයට වඩින තථාගතයන් වහන්සේ උතුරුකුරු දිවයිනෙන් පිඬු සිඟා අරගෙන අනවතත්ථ විල් තෙරට වැඩල පැන් පහසු වෙලා (ස්නානය කරල), දත් වළඳල, දිවා විහරණයට සඳුන් වනයට වැඩියා. දම් සෙනෙවි සැරියුත් මහ රහතන් වහන්සේ දිනපතා තථාගතයන් වහන්සේ බැහැ දකින්න එතැනට වැඩම කරනවා. බුදුන් වහන්සේ ඒ ඒ දිනවල දෙවියන්ට දේශනා කරපු අභිධර්මය, මෙගොඩ ඉඳන් අත දිගු කරල මහ සයුර පෙන්වනව වගේ ඉතා කෙටි වචන ස්වල්පයකින් මාතෘකාව දේශනා කරනවා.

සිවුපිළිසිඹියාපත් - සැරියුත් මහ රහතන් වහන්සේට ඉතා කෙටියෙන් දේශනා කරපු ඒ ධර්මය, න්‍යායන් සියයෙන්, න්‍යායන් දහසින්, න්‍යායන් දස දහසින් අවබෝධ කර ගන්න සමත් වෙනවා. උන් වහන්සේ තථාගතයන් වහන්සේගෙන් අහගත්තු මාතෘකා දේශනය භික්ෂූන්ට ඉගෙනීමට, දැරීමට ප්‍රමාණවත් වන ආකාරයෙන් විස්තර කරල, ඒ ඒ දිනවලදි අතවැසි භික්ෂූන් 500 කට දේශනා කළා. තථාගතයන් වහන්සේ මාස 3 කින් අභිධර්ම දේශනය අවසන් කරන කොට ඒ භික්ෂූන් 500 දෙනාම අභිධර්මිකයෝ බවට පත් වුණා. එතකොට අද පවතින අභිධර්ම පිටකය කියන්නෙ සැරියුත් මහ රහතන් වහන්සේ දේශනා කරපු ඒ අභිධර්මය. (අභිධම්ම වාචනා මග්ගෝ සාරිපුත්ත ථේරෝ පභවෝ) ඒක තථාගතයන් වහන්සේගෙන් ලබපු න්‍යායන් අනුව දේශනා කරපු එකක් නිසා බුද්ධ දේශනයක් හැටියටම පිළිගන්නවා.

සියලු මහ බෝසත්වරුන්ගෙ බුදු වන අත්බැවේ මෑණියන්, බෝසත් කුමරු ඉපදිලා දින 7 කින් කළුරිය කරල තව්තිසා දෙව් ලොව ඉපදීම ධර්මතාවයක්. හැම බුදුවරයෙක්ම තමන්ගෙ මෑණියන් වන ඒ දෙව්පුත් මුල් කර ගෙන අනිකුත් දෙව් බඹුන්ට අභිධර්මය දේශනා කිරීමත් ධර්මතාවයක්. මේ නිසා සූත්‍ර පිටකයෙන් පවා සනාථ වෙන අභිධර්මය, බුද්ධ දේශනාවක් නෙවෙයි, පසුකාලීනව සකස් කර ගත්ත එකක් කියල සමහරු ප්‍රකාශ කළත් ඒක හේතු යුක්ති නැති ප්‍රලාපයක් විතරයි. මේ වගේ අති සූක්ෂම චිත්ත චෛතසික විග්‍රහයක් කරන්න ලොව්තුරා බුදුවරයෙකුට හැර වෙන කෙනෙක් මේ මිහිපිට ඉන්න විදිහක් නෑ. තථාගතයන් වහන්සේ සර්වඥවරයෙක් කියල ඔප්පු කරන්න තියෙන හොඳම සාක්ෂිය තමයි පරම ගම්භීර අභිධර්ම දේශනාව.

අභිධර්මයේ සියුම් විග්‍රහයන් හැමෝටම අවබෝධ කර ගන්න බෑ. ඒක ගෝචර වෙන්නෙ ප්‍රඥා අධික උතුමන්ට. බුදුන් වහන්සේ ජීවමාන කාලයේ



කොච්චර මහ රහතන් වහන්සේලා වැඩ හිටියත්, අභිධර්මය තථාගතයන් වහන්සේගෙන් අහල දැන ගන්න සාරිපුත්ත මහ රහතන් වහන්සේම වැඩියෙ, ප්‍රඥාවන්ත භික්ෂූන් අතරින් උන් වහන්සේ අග්‍ර වූ නිසා. සැරියුත් මහ රහතන් වහන්සේ ඇසුරේ හිටපු අතවැසි භික්ෂූන් වහන්සේලාත් ප්‍රඥාවන්තයෝ. ඒ නිසාම තථාගතයන් වහන්සේගෙන් අහගත් අභිධර්ම මාතෘකාව (උද්දේසය) විස්තර කරමින් සැරියුත් මහරහතන් වහන්සේ ඒ භික්ෂූන්ටත් දේශනා කළා.

ඈත අතීතයේ ධර්ම සංගායනා යුගයේ පටන් අද දක්වාම, අභිධර්මය බුද්ධ දේශනාවක් නෙවෙයි, පසු කාලීනව සකස් කර ගත් එකක්, පළමු සංගායනාවට ඇතුළත් නොවූ එකක් .... ආදී වශයෙන් විරුද්ධව මත ප්‍රකාශ කරන අය බොහොමයක් ඉන්නවා. වර්තමානයෙත් ගිහි පැවිදි දෙපාර්ශවය තුළම අභිධර්මයට විරුද්ධව මත ප්‍රකාශ කරන අය ඉන්නවා. අභිධර්මය විතරක් නෙවෙයි, අද සමහර අසපුවාසී භික්ෂූන් සූත්‍ර පිටකයේ බුද්දක නිකායේ කොටසුත් බුද්ධ දේශනා නෙවෙයි කියල ඉවත් කරල තියෙනවා. ඒක ශ්‍රී සද්ධර්මයට ඉතා අනතුරුදායක තත්ත්වයක්.

පළවෙනි ධර්ම සංගායනාවෙදි අභිධර්ම පිටකයක් තිබුණෙ නෑ කියල සමහරු කිව්වත්, විනය පිටකයට අයත් චුල්ලවග්ග පාළියේ පළවෙනි ධර්ම සංගායනාව විස්තර කරන පංචසතික ඛන්ධකයේ මේ විදිහට සඳහන් වෙනවා.

උපාලි විනයං පුච්ඡි
සුත්තන්තානන්ද පණ්ඩිතං
පිටකං තීණි සංගීතිං
අකංසු ජිනසාවකං

උපාලි තෙරුන්ගෙන් විනය විචාළේය. පණ්ඩිත වූ ආනන්ද තෙරුන්ගෙන් සූත්‍ර විචාළේය. මෙසේ බුද්ධ ශ්‍රාවකයෝ පිටක 3 ම සංගායනා කළාහුය.

මේ සූත්‍ර පිටකයේ බුද්ධක නිකායට අභිධර්මය ඇතුළත් බව සැලකිය යුතුයි. මේ විදිහට එකට තිබ්බ්ච්ච දහම් කොටස් තුන් වන ධර්ම සංගායනාවෙදි වෙන් කරල ත්‍රිපිටකය විදිහට සංග්‍රහ වුණා.

සමහර අභිධර්ම විරෝධීන් ඉහත උද්දාන ගාථාව, පසුව එකතු කරපු එකක් කියල ප්‍රතික්ෂේප කරනවා. නමුත් ඒක කවදා කවුරුන් විසින් ඒ විදිහට එකතු කරපු එකක්ද කියල ඒ අය කියන්නෙ නෑ. පළවෙනි ධර්ම සංගායනාව තුළ ත්‍රිපිටකයම සංග්‍රහ වෙච්ච බව සනාථ කරන්න, සංගීතිකාරක මහ රහතන් වහන්සේලා ඒක සංගීති විස්තරයට ඇතුළත් කළා. සංගීතිකාරක කියන්නෙ සංගායනාවක් සිද්ධ කරන්න දායකත්වය දුන් කියන අර්ථය. පළවෙනි ධර්ම සංගායනාවට සිවුපිළිසිඹියාපත් මහ රහතන් වහන්සේලා 500 නමකුත්, දෙවන සංගායනාවට 700 නමකුත්, තුන්වන සංගායනාවට 1000 නමකුත් සම්බන්ධ වුණා. ඒ නිසා ඒ සියලු දෙනාම සංගීතිකාරක මහ රහතන් වහන්සේලා. සංගායනාවටම කියන තවත් නමක් තමයි සංගීතිය කියන්නෙ.

ත්‍රිපිටක පාළියේ එන උද්දාන, පෙයියාල, වග්ග, නිපාත, සංයුක්ත, පණ්ණාසක, පිටක, නිකාය, ප්‍රකරණ ආදිය ධර්ම සංගායනා කරපු මහ රහතන් වහන්සේලා විසින්ම එකතු කරපු ඒවා

බව සත්‍යයක්. ඒ නිසා උද්දාන ගාථාවේ දක්වෙන ත්‍රිපිටක සංගීතිය ඒ විදිහට පවත්වපු බව පිළිගන්න බෑ කියල කීම මුලා අදහසක්. **තමන්ගෙ වාදය ඔප්පු කර ගන්න ප්‍රමාණවත් සාධක නැති වෙන කොට, ප්‍රකටව පෙනෙන සත්‍යය පවා ප්‍රතික්ෂේප කිරීම විතණ්ඩවාදීන්ගෙ ලක්ෂණයක්.**

තථාගතයන් වහන්සේ විසින් අභිධර්මය දේශනා කළේ දෙවියන්ට, ඒ නිසා ඒක මිනිස්සුන්ට අවශ්‍ය දෙයක් නෙවෙයි කියල සමහරු කියනවා. දෙවියන්ට විතරක් නෙවෙයි, අභිධර්මය සැරියුත් හාමුදුරුවන්ටත් දේශනා කළ බවත්, උන් වහන්සේ අතවැසි භික්ෂූන්ට දේශනා කළ බවත් සඳහන් වීමෙන් ඒ කාරණය සාවද්‍ය බව ඔප්පු වෙනවා. සංයුක්ත නිකායේ දේවතා සංයුක්තයේ සියලු දේශනාත්, මිනිස්සුන්ට අතිශය ප්‍රයෝජනවත් මහා මංගල වගේ සූත්‍ර දේශනාත් දෙවියන්ට වදාළ දහම් න්‍යායන්. ඒ වගේම මාර සංයුක්තය, බ්‍රහ්ම සංයුක්තය, යක්ඛ සංයුක්තය, සක්ඛ සංයුක්තය ආදී සංයුක්ත නිකායේ දේශනා මිනිස්සුන්ට වදාළ දහම් කොටස් නෙවෙයි. හැබැයි එහෙම නොවුනයි කියල ඒවා මිනිස්සුන්ට ප්‍රයෝජනවත් නෑ කියල කියන්න පුළුවන්ද ?

බුදුන් වහන්සේ වදාළ සෑම ධර්මස්කන්ධයක්ම විවේක නිශ්‍රිත, විරාග නිශ්‍රිත, නිරෝධ නිශ්‍රිත, වොස්සග්ග පරිනාමී කියන කරුණු 4 න් යුක්තයි. දෙවියන්ට දේශනා කළත්, මිනිස්සුන්ට දේශනා කළත්, ඒ සියලු දහම් දෙව් මිනිසුන්ටම නිවන් අවබෝධ කර ගන්න ප්‍රයෝජනවත්. දෙවියන්ට සහ මිනිස්සුන්ට වෙන වෙනම නිවන් දෙකක් නෑ. හැමෝටම තියෙන්නෙ එකම නිවන. හැම දෙනාම නිවන් දකින්න ඕන චතුරාර්ය සත්‍ය දහම් අවබෝධ කිරීමෙන්. ඒකට වෙන මගක් නෑ. දෙව් මිනිස් කාටත් තියෙන්නෙ එකම නිවන නිසා, හැම දෙනාම නිවන් ලබන්න ඕන එකම ක්‍රමයෙන් නිසා, දෙවියන්ට වෙනම ධර්මයකුත් මිනිස්සුන්ට වෙනම ධර්මයකුත් නෑ. තථාගතයන් වහන්සේගෙ සකළ ධර්මයම දෙව් මිනිස් හැම දෙනාටම සාධාරණයි. සත්ථා දේව මනුස්සානං කියල තථාගතයන් වහන්සේ සියලු දෙව් මිනිසුන්ටම සාස්තෘ බව බුදු ගුණ පාඨයෙත් සඳහන් වෙන්නෙ ඒ නිසා. මේ අනුව අභිධර්මය දෙවියන්ට මිසක් මිනිස්සුන්ට අවශ්‍ය නැති බව කීම, නොදැනීමෙන් කියන්නක් බව වටහා ගන්න ඕන.

නිවන් දකින්න අභිධර්මය අවශ්‍ය නෑ කීමත්, අභිධර්ම විරෝධීන්ගෙ තවත් මතයක්. ඒක එහෙම නම් මාතෘ දිව්‍ය රාජයා සෝතාපන්න වුනේ අභිධර්මය අහල නෙවෙයිද ? ඒ දේශනාව අහපු තවත් කොච්චර නම් දෙව් බඹුන් මගඵල සාක්ෂාත් කරන්න ඇත්ද ? ඒ ඒ පුද්ගලයන්ගෙ ප්‍රඥාවේ තරමට යම් යම් ධර්ම විග්‍රහයන් ගෝචර වෙනවා. ආසයානුසය ඥානයෙන් තථාගතයන් වහන්සේ ඒ සියල්ල දන්න නිසා පුද්ගලයන්ට ගැළපෙන, පහසුවෙන් අවබෝධ කරගන්න පුළුවන් ධර්ම න්‍යායන් දේශනා කරනවා. ඒ නිසා නිවන් දකින්න අභිධර්මය අවශ්‍ය නෑ කියල කීම සම්පූර්ණ සත්‍යයක් නෙවෙයි.

**මුල්ම කාලයේ අභිධර්මය තිබුණද, නිවන් දකින්න අභිධර්මය ඕනද කියල අහන තවත් පිරිසක්, අභිධර්මය**



**පහළ වුනේ බොහෝ පිරිසක් නිවන් දක්කට පසුවයි කියල තවත් මතයක් ඉදිරිපත් කරනවා. ඒ කතාව එහෙම කියනව නම්, බුද්ධ සාසනය පහළ වෙලා විසි අවුරුද්දක් ගියාට පස්සෙ තමයි විනය පැනෙව්වෙ. එතකොට විනය පනවන්න පෙරත් නිවන් දකපු අය හිටිය නම්, විනය ඕනත් නෑ කියල කෙනෙකුට තර්කයක් ගේන්න පුළුවන්. ඒ වගේ කිසි තේරුමක් නැති තර්කවාද තමයි අභිධර්මය සම්බන්ධයෙන් ගේන්නෙත්.**

මෙතනදි නිවන් දකින්න අභිධර්මය වෙනම දන ගන්න අවශ්‍ය නෑ කියන කාරණය ඇත්ත වුනත්, මේ අභිධර්ම විරෝධීන් හුඟ දෙනෙක් ඒකෙන් අදහස් කරන්නෙ ඒ කාරණය නෙවෙයි. අභිධර්මය බුද්ධ දේශනාවක් නෙවෙයි, පසුව එකතු කරපු එකක් කියල තමයි ඒ අය කියන්නෙ. එතකොට නිවන් දකින්න අභිධර්මය අවශ්‍ය නෑ කියන කාරණය නෙවෙයි, බුද්ධ දේශනාවක් වන අභිධර්මය ප්‍රතික්ෂේප කිරීම තමයි බරපතල වෙන්නෙ.

අනෙක ස්කන්ධ, ධාතු, ආයතන, පටිච්ච සමුප්පාදය කියන ඒවා මූලිකවම අයිති වෙන්නෙ අභිධර්මයට. එතකොට ඉස්සෙල්ලම ස්කන්ධ මුල් කර ගෙන තමයි බුදුන් වහන්සේ ධර්ම දේශනා කළේ. උදාහරණ විදිහට රූපස්කන්ධය මුල් නොකර ධර්මය දේශනා කළේ නෑ. එතකොට මුල්ම දේශනාවලටත් අභිධර්මය අහු වෙලා තියෙනවා. අභිධර්මය කියන වචනය නොකිව්වට ස්කන්ධ, ධාතු, ආයතන ... කියන සියල්ලම දේශනා කරල තියෙනවා. ලෝකය ධාතුවලට බෙදල දේශනා කරල තියෙනවා. චක්ඛායතන, සෝතායතන වශයෙන් දේශනා කරල තියෙනවා. විවිධ ක්‍රමවලට පෙන්වපු තැන් තමයි මේ තියෙන්නෙ. ඒ නිසා අභිධර්මය කියන්නෙ වෙනම ධර්මයක් නෙවෙයි. ත්‍රිපිටකය තුළම තියෙන දෙයක්. අභිධර්මය බුද්ධ දේශනාවක් නෙවෙයි කියන්නෙ තේරුම් ගන්න බැරිකමට.

සූත්‍ර පිටකයේ තියෙන බුද්ධ දේශනාවලට පසු කාලීනව දීපු අර්ථ කථන යම් කිසි විදිහකින් වැරදී ගියොත් ඒක විසඳ ගන්න ක්‍රමයක් සූත්‍ර පිටකයෙන් නොලැබෙන අතරම, ඒ සඳහා අභිධර්මයේ පිහිට පතන්න සිද්ධ වෙනවා. සාමාන්‍ය වෛද්‍යවරයෙකුට රෝග විනිශ්චය කරල බෙහෙත් නියම කරල රෝගීන් සුවපත් කිරීමේ හැකියාව තියෙනවා. යම් හේතුවකින් එක සමාන වගේ තියෙන බෙහෙත් කලවම් වීමක් සිද්ධ වුනොත් ඒක තෝර බේර ගන්න සාමාන්‍ය වෛද්‍යවරයෙකුට හැකියාවක් නෑ. ඒ සඳහා බෙහෙත් නිෂ්පාදනය කරන විශේෂඥයින්ගෙ සහය ලබා ගන්න අනිවාර්යෙන්ම සිද්ධ වෙනවා. ඒ ඒ බෙහෙතේ තියෙන රසායනික සංයෝගයන්, ඒවායේ මාත්‍රාවන් .... ආදී සියලු විස්තර දන්නෙ විශේෂඥයින් විතරයි.

ලෙඩෙකුට බේත් දීල සනීප කරන්න, ඒ බේත හදන හැටි, ඒකෙ අඩංගු රසායනික සංයෝග ආදිය දන ගෙන තිබීම අවශ්‍ය වෙන්නෙ නෑ. අහවල් රෝගයට දෙන බේත් පෙත්තෙ නම දන ගත්තම ඇති. ඊට අමතරව ඒ බේත් පෙත්තෙ අන්තර්ගතය ගැන වැඩිමනත් කරුණු දන ගන්න නම් ඒ පිළිබඳ හදාරල වෙනම විශේෂඥ දැනුමක් ලබල තියෙන්න ඕන. හැබැයි ලෙඩේ හොඳ කරන්න බේත්

පෙත්ත ගැන විශේෂ දැනීමක් තියෙන්න ඕන නෑ. නමුත් බේත නිෂ්පාදනය කරපු කෙනෙක් ඉන්නව නම් ඒ පුද්ගලයට ඒ පිළිබඳ විශේෂඥ දැනුමක් තියෙනවා. ඒ විශේෂඥ දැනුම දෙන්නෙ පස්සෙ. මුලින්ම දෙන්නෙ බේත් ටික. ඒක වැඩි හොඳට කරන දෙයක්. හැබැයි බේත වැරැද්දුවොත් ඒ ගැන දැන ගන්න අර විශේෂඥ දැනුම වැදගත්. ඒ වගේ තමයි අභිධර්මයත් විශේෂඥ දැනුමක් වගේ. ඒ දැනුම තියෙන නිසා තමයි, පසු කාලීනව දහමෙ වරද්දපු තැන් හොයා ගන්න පුළුවන් වෙන්නෙ. ඒක දැන ගත්තෙ නැත්නම්, එක එක්කෙනා දහමට හිතුමත දෙන්න පටන් ගත්තම හරි වැරැද්ද හොයා ගන්න බැරිව යනවා.

සූත්‍ර පිටකය කියන්නෙ සාමාන්‍ය වෛද්‍යවරයකුගෙ දැනුම වගේ දෙයක්. අභිධර්ම පිටකය විශේෂඥයින්ගෙ දැනුම වගේ. අද වෙන කොටත් සූත්‍ර දේශනාවලට පසුකාලීනව උගතුන් දීල තියෙන අර්ථ කථන තුළ සදොස් තැන් තියෙනවා. ඒ නිසාම නිවන් මග යටපත් වෙලා ආර්ය උතුමන්ගේ බිහිවීම අඩු වෙලා තියෙනවා. **සූත්‍ර පිටකයේ තියෙන බුද්ධ වචනවල අර්ථ වැරදිලා ගියාම, ඒක සූත්‍ර දේශනාවලින් විසඳගන්න බැරි වුනොත් අභිධර්මයේ පිහිට පතන්න අවශ්‍යම වෙනවා.** ඒ නිසා අභිධර්මය නිවන් මග විවර කර ගන්න උදව් වෙන නිසා ඒක අවශ්‍ය නෑ කියල කියන්න බෑ.

බුද්ධ පරිනිර්වාණයෙන් තුන් මසකට පසු අජාසත් රජතුමාගෙ අනුග්‍රහයෙන් රජගහ නුවර වේභාර පර්වත පාමුල සප්තපර්ණී ගුහාවෙ (නිග්‍රෝධ ගුහාව) දොරටුව අසලදී මණ්ඩප සකස් කරල, මහා කාශ්‍යප මහ රහතන් වහන්සේගෙ මූලිකත්වයෙන් සිවුපිළිසිඹියාපත් මහ රහතන් වහන්සේලා 500 නමක් එක් රැස් වෙලා, සාසන චිරස්ථිතිය සඳහා පළවෙනි ධර්ම සංගායනාව පවත්වපු බව චුල්ල වග්ග පාළි පංචසතිකක්ඛන්ධකයේ සංගීති නිධානයේ සඳහන් වෙනවා.

මේ ධර්ම සංගායනාව කොච්චර සැලකිල්ලෙන් කළාද කියනව නම්, දහස් ගණන් රහතන් වහන්සේලා අතරින් සිවුපිළිසිඹියාපත් මහ රහත් උතුමන් 500 නමක් විතරයි සංගායනාවට සහභාගි කර ගත්තෙ. ඒ වගේම ආනන්ද හාමුදුරුවො අරිහත්වයට පත් වෙන කල්ම සංගායනාවට නොගෙන ආසනය හිස් කර තැබූ බවත් සඳහන් වෙනවා. ආනන්ද හාමුදුරුවො අරිහත්වයට පත් වෙලා සංගීති ශාලාව ළඟට ඇවිත් දොරට තට්ටු කරල තමන් පැමිණි බව සඳහන් කළාම, මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ දොර ළඟට ඇවිත්, රහත් වුනා නම් දොර අරින්නෙ නැතිව ඇතුල් වෙන්න කියල ආනන්ද හාමුදුරුවන්ට දැන්වුවා. ඒ අනුව ආනන්ද හාමුදුරුවො තමන්ගෙ ඍද්ධි බලයෙන් යතුරු සිදුරෙන් ඇතුල් වූ බවත් සඳහන් වෙනවා. ඒ වගේම සමහර විස්තරවල පොළව යටින් කිමිදිලා පැමිණි බවත්, තවත් තැනක අහසින් ඍද්ධියෙන් පැමිණි බවත් සඳහන් වෙනවා. ඒ කාරණය කොහොම වුනත් මෙයින් පෙනී යන්නෙ, සංගායනාව කොච්චර නම් සැලකිල්ලකින් වගකීමකින් සිද්ධ කළාද කියන කාරණය.

මේ ධර්ම සංගීතිය පවත්වන්න ප්‍රධාන වශයෙන් හේතු වුනේ, මහළු වෙලා පැවිදි වෙච්ච සුභද්‍ර කියන භික්ෂුවගෙ අධර්මවාදී අදහස්. මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ පාවා නුවර ඉඳල කුසිනාරා නුවර බලා වඩින අතරමගදී, ආජීවකයෙකුගෙන් බුදු හිමියන්ගෙ පිරිනිවන් පෑම ගැන දැන ගත්තා. ශාස්තෘ වියෝවෙන් රහත් නොවූ භික්ෂූන් වැළපෙන කොට, මහළු වෙලා පැවිදි වෙච්ච සුභද්‍ර කියන භික්ෂුව මේ විදිහට ප්‍රකාශ කළා. ''ඇවැත්නි සෝක නොකරන්න. නොවැළපෙන්න. ඒ මහා ශ්‍රමණයාගෙන් අපි හොඳින්ම මිදුනෙමු. මෙය ඔබලාට කැපය, නොකැපය කියල මහා ශ්‍රමණයාගෙ නීති පැනවීමෙන් අපි පීඩා වින්දෙමු. දැන් අපි යමක් කැමති නම් එය කරමු. යමක් නොකැමති නම් එය නොකරන්නෙමු.''

මේ වචන අහල සංවේගයට පත්වෙච්ච හත් ලක්ෂයක් භික්ෂූන් අතුරෙන් සංඝ ස්ථවිර වූ මහා කාශ්‍යප තෙරුන් වහන්සේ, මේ වගේ නිර්ලජ්ජිත ශ්‍රමණයන්ගෙ පක්ෂ බලය වැඩි වීමෙන් සාසනය ඉක්මනින්ම අතුරුදන් වෙන්න පුළුවන් කියල, අධර්මය අවිනය බැබලිලා ධර්මය විනය බැහැර කරන්න පෙර, අධර්මවාදීන් අවිනයවාදීන් බලවත් වෙන්නත්, ධර්මවාදීන් විනයවාදීන් දුබල වෙන්නත් පෙර ධර්ම විනය සංගායනා කළ යුතුයි කියල හිතල, 500 ක් සිවුපිළිසිඹියාපත් මහ රහතන් වහන්සේලා එකතු වෙලා තුන් මාසයක් පුරා පළවෙනි ධර්ම සංගායනාව පැවැත්වුවා. පළවෙනි ධර්ම සංගීතියෙන් පසුව ධර්මය නොනැසී ඉදිරියට පැවතීමට, සංගීතිකාරක මහ රහතන් වහන්සේලා විසින් විනය පිටකය උපාලි තෙරුන්ටත්, දීඝ නිකාය ආනන්ද තෙරුන්ටත්, මජ්ජිම නිකාය සැරියුත් තෙරුන්ගේ ශිෂ්‍ය භික්ෂූන්ටත්, සංයුක්ත නිකාය මහා කාශ්‍යප තෙරුන්ටත්, අංගුත්තර නිකාය අනුරුද්ධ තෙරුන්ටත් පවරපු බව සඳහන් වෙනවා. (සුමංගල විලාසිනී - දීඝ නිකාය අට්ඨ කථා)

පළවෙනි ධර්ම සංගායනාවෙදි දීඝ නිකාය, මජ්ඣිම නිකාය ... ආදිය ඒ ඒ තෙරවරුන්ට බාර කළත්, අභිධර්මය කිසිවෙකුටත් බාර දුන් බවක් සඳහන් වෙන්නෙ නෑ කියල, සමහර විචාරකයො අභිධර්මය බුද්ධ දේශනාවක් නෙවෙයි කියල පහර ගහනවා. නමුත් කෙනෙකුට බාර කළ දෙයක් තවත් කෙනෙකුට අමුතුවෙන් බාර දෙන්න අවශ්‍ය නෑ. මොකද බුදුන් වහන්සේ විසින්ම අභිධර්මය ධර්ම සේනාධිපති සැරියුත් මහ රහතන් වහන්සේට බාර දුන්නා. ධර්ම පුරෝහිත මුගලන් මහ රහතන් වහන්සේ ඒකෙ ප්‍රවීණ කථිකයා වුණා. ධර්ම භාණ්ඩාගාරික ආනන්ද හාමුදුරුවො ඒක හිතේ දරා ගෙන ඒ ධර්මයේ ආරක්ෂකයා වුණා. විශේෂයෙන් සැරියුත් මහ රහතන් වහන්සේගෙ අතවැසි 500 ක් රහත් භික්ෂූන් වහන්සේලා පෙරුම් පුරාගෙන ප්‍රාර්ථනා කළ විදිහට අභිධර්මිකයෝ බවට පත් වුණා. ඒ නිසා උන් වහන්සේලා ධරමාන කාලයේම (ජීවමානව වැඩ විසූ කාලයේ), සංගීතිකාරක මහ රහත් උතුමන් අභිධර්මය වෙනත් පිරිසකට කොහොම නම් බාර කරන්නද ? මේ විදිහට බුද්ධ කාලයේ පටන්ම අභිධර්මය රකින්න පිරිසක් හිටපු නිසා ඒක වෙන පිරිසකට බාර දීමක් සිද්ධ වුනේ නෑ. මේ කරුණ සාධක කර ගෙන අභිධර්මය සංගායනා කළේ නෑ කියල කීම හිස් ප්‍රලාපයක් විතරයි.

පළවෙනි සංගායනාවෙදි අභිධර්මය විතරක් නෙවෙයි, සූත්‍ර පිටකයේ ඛුද්ධක නිකායේ භාරකාරත්වය පවරපු කෙනෙකුත් සඳහන් වෙන්නෙ නෑ. ඒ අනුව ඛුද්ධක නිකායත් පළවෙනි සංගීතියට ඇතුළත් වුනේ නෑ කියල ඉවත් කරන්න සිද්ධ වෙනවා. මේ විදිහට තම තමන්ගෙ දෘෂ්ටි මතවාද අනුව ධර්මය ඉවත් කරන්න ගියොත් සාසනයට යන කල දසාව මොකක්ද ?

තුන් වෙනි ධර්ම සංගායනාව දක්වා සැරියුත් තෙරුන්ගේ පටන් අභිධර්ම පිටකය පවත්වා ගෙන ආපු ඇදුරු පරපුර ධර්ම සංගනී, අත්ථ සාලිනී අටුවාවල දක්වා තියෙනවා. පළවෙනි සංගායනාවෙදි ඛුද්ධක නිකාය කාටවත් නොපවරන්නත් හේතුවක් තියෙනවා. ඛුද්ධක නිකාය ග්‍රන්ථ රාශියකින් යුක්තයි. කොටස් 15 ක් විතර තියෙනවා. බුදුන් වහන්සේ ජීවමාන කාලයේදිම ඛුද්ධක නිකායට අයත් ධර්මයන් භික්ෂූන් විසින් පරියාප්ති (පෙළ පත / පූර්ණ වූ පත) වශයෙන් ප්‍රගුණ කරපු බව ''ඉධ භික්ඛවේ භික්ඛු ධම්මං පරියාපුණ්ණාති ගෙය්‍යං වෙය්‍ය කරණං ගාථං උදානං ඉතිවුත්තකං ජාතකං අබ්භූත ධම්මං වේදල්ලං ....'' කියන දේශනා පාළියෙනුත් ප්‍රකාශ වෙනවා. මෙයින්


කියවෙන්නෙ, භික්ෂූන් නවාංග සාස්තෘ සාසනය පරියාප්ති වශයෙන් හදාරපු බව. අභිධර්මය අයිති වෙන්නෙත් මේ අංග නවයෙන් වෙය්‍යාකරණ කියන කොටසට. ඒ අනුවත් පෙනී යන්නෙ බුදුන් වහන්සේ ජීවමාන කාලයේ ප්‍රඥාවන්ත භික්ෂූන් අභිධර්මය දැන සිටි බව.

නිද්දේස පාළිය සහ පටිසම්භිදා මග්ග පාළිය කියන මේ කොටස් 2 ත් සැරියුත් මහ රහතන් වහන්සේගෙම විග්‍රහයන්. ඒවත් උන් වහන්සේගෙ අතවැසියන් කෙරෙහි පැවතියා. සෝණ කුටිකන්න තෙරුන්, මහා කාශ්‍යප තෙරුන්ගෙන් සූත්‍ර නිපාතය ඉගෙන ගත් බව සඳහන් වෙනවා. ධම්ම පදය වෙනම සංග්‍රහයක් විදිහට ඉගෙන ගත් බවත් සඳහන් වෙනවා. මේ කරුණු අනුව අභිධර්මය වගේම බුද්ධක නිකායේ කොටස් තථාගතයන් වහන්සේ ජීවමාන කාලයේ පටන්ම භික්ෂූන් වහන්සේලා ළඟ තිබිච්ච නිසා අභිධර්මයත්, බුද්ධක නිකායත් පළවෙනි සංගායනාවෙදි ඉදිරියට පවත්වාගෙන යන්න කාටවත් අමුතුවෙන් පවරන්න අවශ්‍යතාවයක් තිබුණෙ නෑ.

ඒ වගේම බුද්ධක භාණක නමින් පරපුරක් සිටීමෙන්, බුද්ධක නිකාය කට පාඩමින් ගෙනා ඇදුරු පරපුරක් හිටපු බව සාසන ඉතිහාසයේ සඳහන් වෙනවා. මේ සියලු කරුණු අනුව පළවෙනි සංගීතියෙදි බුද්ධක නිකාය සහ අභිධර්මය භික්ෂූන්ට නොපැවරීමෙන්, ඒවා සංගායනා නොවූ බවට කරන තර්ක නිශ්ප්‍රභා වෙනවා.

අභිධර්මය බුද්ධ භාෂිතයක් නම් ඒකට නිධානයක් තිබිය යුතු බවත්, ඒ වගේ නිධානයක් සඳහන් නොවන නිසා අභිධර්මය බුද්ධ දේශනාවක් විදිහට පිළිගන්න බෑ කියන කාරණයත් අභිධර්ම විරෝධීන්ගෙ තවත් මතයක්. මේක ඉතා බොළඳ තර්කයක්. මොකද නිධානයක් නොදක්වපු ජාතක, ධම්ම පද, සූත්‍ර නිපාත ආදී ගාථා වගේම ඉති වුත්තක ආදී දේශනාත් බොහොමයක් පෙළ දහමේ තියෙන නිසා. අභිධර්මයට නිධානයක් නැත්තෙ නෑ. බුද්ධත්වයෙන් 7 වන වර්ෂයේ තව්තිසා දෙව් ලොවදි දෙවියන්ට අභිධර්මය දේශනා කිරීමත්, ඒ දේශනාව අවසානයේ තව්තිසා දෙව් ලොවින් සංකස්ස පුරයට වැඩම කිරීමත්, එතනදි සැරියුත් හිමියන්ට ''යේ ඣාන පසුතා ධීරා ...'' ආදී ධම්ම පද ගාථාවෙන් දහම් දෙසීමත් පිළිබඳ විස්තර ධර්මයේ සඳහන් වෙනවා. තථාගතයන් වහන්සේ අභිධර්මය දෙවියන්ට දේශනා කළා කියන කාරණයට නිධානය වෙන්නෙ ඉහත කරුණු.

අනුරාධපුරයේ වාසය කරපු සුමනදේව හිමියන් ලෝවාමහාපායේ දහම් දෙසද්දි, එක් විරුද්ධ මතවාදියෙක් අභිධර්මය බුද්ධ භාෂිතයක් නම් ඒකෙ නිධානය කොහෙද කියල ඇහුවම, දෙව් ලොවදි බුදුන් වහන්සේ අභිධර්මය දේශනා කරපු බව සූත්‍ර නිධානයක් වගේ පාළියෙන් මේ විදිහට ප්‍රකාශ කළා. ''ඒකං සමයං භගවා දේවේසු විහරති පාරිච්ඡත්ථක මූලේ පණ්ඩුකම්බල සිලායං තත්‍ර ඛෝ භගවා දේවානං තාවතිංසානං අභිධම්ම කථං කථේසි. කුසලා ධම්මා අකුසලා ධම්මා අබ්‍යාකථා ධම්මා - එක් සමයක භාග්‍යවතුන් වහන්සේ තව්තිසා දෙව් ලොව වැඩ වාසය කරන කොට පරසතු රුක් මුල පණ්ඩුකම්බල සෙලාසනයේ වැඩ සිටිමින් කුසලා ධම්මා, අකුසලා ධම්මා, අබ්‍යාකථා ධම්මා ... ආදී වශයෙන් තව්තිසා වැසි දෙවියන්ට අභිධර්මය දේශනා කළා.'' යමක් ඉල්ලා අඬන දරුවෙකුට ඒ දේ දෙනව වගේ, අභිධර්මයේ නිධානය අහපු ඔහුට සුමනදේව හිමියන් ඔය විදිහට කරුණු දැක්වුවා.



පළවෙනි ධර්ම සංගායනාවෙන් වසර 100 කට පසු, කාලාසෝක රජු දවස විසාලා නුවර මහා වන විහාරයේ වාසය කරපු වජ්ජිපුත්තක භික්ෂූන් විසින් විනය විරෝධී දස වස්තුවක් ඉපැද්දෙව්වා. මේ විදිහට විනය ප්‍රඥප්තීන් වෙනස් කර ගනිමින් දස දහසක් වජ්ජිපුත්තක භික්ෂූන් නොයෙක් අකැප දේවල් කරමින් සාසන භේදයක් ඇති කළා. ඒ බව අහපු කාකණ්ඩ පුත්‍ර යස කියන රහතන් වහන්සේ, දස වස්තුව විනිශ්චය කරල ඒක අවිනයයි කියල බැහැර කරල සාසනය ආරක්‍ෂා කරන්න එකසිය විසි වයස් වූ සබ්බකාමී රහතන් වහන්සේ ඇතුළු මහ රහතන් වහන්සේලා සමග සාකච්ඡා කරල, දස වස්තුව විනය විරෝධී බව ප්‍රකාශ කරල නිර්ලජ්ජී වජ්ජි භික්ෂූන් මර්ධනය කළා.

ඊට පස්සෙ රැස් වෙච්ච දොළොස් දහසක් මහ රහතුන් අතරින් තෝරා ගත් 700 ක් සිවුපිළිසිඹියාපත් මහ රහතන් වහන්සේලා එකතු වෙලා දෙවන ධර්ම සංගායනාව සිද්ධ කළා. ඒකෙන් පස්සෙ වජ්ජිපුත්තක භික්ෂූන් මහා සාංඝික නමින් නිකායක් පිහිටුවල සංගායනාවක් කළා. මේ අය ධර්මය වෙනස් කරල අමුතුවෙන් පිටක, ආගම, සූත්‍ර, පාරමිතා, අවතංසක, අවදාන, රත්න කූට, කල්ප ආදී නම්වලින් මිථ්‍යා මත ඇතුල් කරල සංස්කෘත ග්‍රන්ථ හැදුවා. මේ වජ්ජිපුත්තක භික්ෂූන් අභිධර්ම පිටකයේ ප්‍රකරණ 6 නොපිළිගත් බව සඳහන් වෙනවා. මෙයින් දෙවන සංගායනාවෙදි අභිධර්ම පිටකයේ ප්‍රකරණ 6 ක් තිබිල තියෙන බව සනාථ වෙනවා. පළවෙනි ධර්ම සංගායනාවෙදි අභිධර්මය සංග්‍රහ නොවුන නම්, දෙවන සංගායනාවෙදි ප්‍රකරණ 6 ක් තියෙන්න විදිහක් නෑ. පළවෙනි සංගීතියෙදි අභිධර්මය නොතිබුනයි කියන අයගෙ මතය බිඳින්න මේක වැදගත් ප්‍රබල සාධකයක්.

සම්බුද්ධ පරිනිර්වාණයෙන් 218 වන වසරෙදි පැළලුප් නුවර රාජාභිෂේකයට පත් වෙච්ච අශෝක අධිරාජ්‍යයාගෙ කාලයේ තීර්ථකයන්ගෙ මත ගත් ශ්‍රමණයන් සාසනයට ඇතුල් වෙලා නොයෙක් විප්ලව ඇති කළා. ඒවායින් හට ගත් සාසන අර්බුධ සංසිඳුවල මොග්ගලීපුත්ත තිස්ස මහ රහතන් වහන්සේ ප්‍රමුඛ දහසක් රහතන් වහන්සේලා එකතු වෙලා අශෝකාරාමයෙදි තුන්වන ධර්ම සංගායනාව මාස 9 ක් තිස්සේ පැවැත්වුවා. පළවෙනි සංගායනාව තුන් මසකින් අවසන් කිරීමෙන් පෙනී යන්නෙ, එදා ඇති වෙච්ච සාසන විරෝධී මත මර්ධනය කරන්න හදිසියේ සිදු කරපු එකක් බව.

තුන් වෙනි ධර්ම සංගායනාවෙදි තමයි ත්‍රිපිටකය වෙන වෙනම කොටස් විදිහට වෙන් කරල සම්පූර්ණ කරල තියෙන්නෙ. මාස 9 ක් පමණ ඒ සඳහා ගත වෙලා තියෙන්නෙ ඒ නිසා වෙන්න ඕන. නිවසක තියෙන සියලු භාණ්ඩ එක ගොඩකට දාල තියෙන කොට, ඒවා ගෘහ භාණ්ඩ විදිහට නම් කරනව වගේ පළවෙනි සංගායනාවෙදි නිකාය 5 තුළ සූත්‍ර පිටකය, අභිධර්ම පිටකය වගේම විනය පිටකයත් තිබුණා. ගෙදරක එක ගොඩකට දාල තියෙන භාණ්ඩවලින් කුස්සියේ බඩු කුස්සියටත්, සාලයේ බඩු සාලයටත්, කාමරවල බඩු කාමරවලටත් වෙන් කරල තියෙනව වගේ, ධර්ම විනය වශයෙන් එකට තිබිච්ච බුද්ධ දේශනා, ශ්‍රාවක දේශනා, විනය, සූත්‍ර, අභිධර්ම

වශයෙන් වෙන් කරල මුඛ පරම්පරාවෙන් සුරක්ෂිතව ඉදිරියට ධර්මය පැවතීම සඳහා තුන්වෙනි ධර්ම සංගායනාවෙදි කටයුතු කරල තියෙනවා.

පරවාදයන් ඛණ්ඩනය කරමින් ධර්මයෙන් කරුණු පෙන්වල, මොග්ගලීපුත්ත තිස්ස මහ රහතන් වහන්සේ විසින් විග්‍රහ කරපු කරුණු ඇතුලත් කරල හදපු කථාවත්ථුප්‍රකරණය කියන්නෙ අභිධර්ම පිටකයේ හත් වෙනි ප්‍රකරණය. දෙවෙනි ධර්ම සංගායනාව දක්වාම ප්‍රකරණ 6 ක් විදිහට තිබිච්ච අභිධර්ම පිටකය තුන් වෙනි ධර්ම සංගායනාවෙදි සප්ත ප්‍රකරණයක් වුණා. අභිධර්මය පසු කාලීනව සකස් වෙච්ච දෙයක් විදිහට සමහරු මත ප්‍රකාශ කරන්නෙ, කථා වස්තුව තුන්වෙනි සංගායනාවෙදි එකතු වෙලා තියෙන නිසා.

බුදුන් වහන්සේ ජීවමාන කාලයේ මහ රහතන් වහන්සේලා වගේම ධම්මදින්නා මෙහෙණිය වගේ භික්ෂුණීන් විස්තර කරපු චුල්ල වේදල්ල වගේ සූත්‍ර, ශ්‍රාවක භාෂිත වශයෙන් සූත්‍ර පිටකයේ සඳහන් වෙනවා. ඒ වගේම මුණ්ඩරාජ සූත්‍රය, ගෝඨමුඛ සූත්‍රය, මධුර සූත්‍රය වගේ දේශනා බුද්ධ පරිනිර්වාණයෙන් පසු ශ්‍රාවකයන් වහන්සේලා විසින් දේශනා කරපු ඒවා. **ජීවමාන බුදු සමයෙදි ශ්‍රාවක භාෂිත බුද්ධානුමැතිය ලැබුව වගේ, සිවුපිළිසිඹියාපත් මහ රහතන් වහන්සේලාගේ සියලු දේශනා බුද්ධ වචන විදිහට පිළිගන්න පුළුවන්. උන්වහන්සේලා කිසිම දාක ධර්ම විරෝධී අදහස් මාත්‍රයක්වත් ප්‍රකාශ කරයි කියල සිහි බුද්ධිය තියෙන කෙනෙකුට හිතන්න බෑ.** ඒ නිසා කථාවත්ථුප්‍රකරණය තුන් වෙනි ධර්ම සංගායනාවෙදි එකතු වුනා කියල ඒක ධර්ම විරෝධී එකක් විදිහට පිළිගන්න බෑ. ධර්ම සංගායනා තුනකින්ම සිවුපිළිසිඹියාපත් මහ රහතන් වහන්සේලා විසින් අභිධර්මය බුද්ධ දේශනාවක් විදිහට පිළිගෙන තියෙන නිසා, ඒ ගැන අල්ප මාත්‍ර හෝ සැකයක් ඇති කර ගන්න අවශ්‍යතාවයක් නෑ.

තුන්වෙනි සංගීතියෙදි ත්‍රිපිටකය දැරීම ඒ ඒ ආචාර්යවරුන්ට බාර වුනා. එයින් පළවෙනි සංගායනාවේ පටන් උපාලි මහ රහතන් වහන්සේ හා උන් වහන්සේගෙ ශිෂ්‍ය පරම්පරාවේ දාසක, සෝණක, සිග්ගව, මොග්ගලී පුත්තතිස්ස කියන රහතන් වහන්සේලා විසින් විනය පිටකය පවත්වා ගෙන ගියා. ධර්ම භාණ්ඩාගාරික ආනන්ද තෙරුන්ගේ පරපුරේ දීඝ භාණක, සාරිපුත්ත ශිෂ්‍ය පරපුරේ මජ්ඣිම භාණක, මහා කාශ්‍යප පරපුරේ සංයුක්ත භාණක, අනුරුද්ධ පරපුරේ අංගුත්තර භාණක කියන ආචාර්යවරුන් සහ ජාතක භාණක, ධම්මපද භාණකාදී ආචාර්යවරුන් විසින් සූත්‍ර පිටකය දරාගෙන ගියා. සාරිපුත්ත ශිෂ්‍ය පරපුරේ භද්දජී, සෝභිත, පියජාලි, පියපාල, පියදස්සී, කෝසියපුත්ත, මොග්ගලීපුත්ත, සිග්ගව, සන්දේහ, සුදත්ත, ධම්මිය, දාසක, සෝණක, රේවත කියන ආචාර්යවරුන් අභිධර්ම පිටකය දරාගෙන ආවා.

මේ හැර ශිලා ලිපි, අටුවා ආදියේ පෙනෙන පෙටක, නෙකායික, තෙපිටක, පංච නේකායික, වේනයික සුත්තන්තික, විනයධර, මතිකාධර, ධම්ම කථික ආදී වචනවලින් කියවෙන්නෙ, ඒ ඒ ආචාර්යවරුන් විසින් ත්‍රිපිටක ධර්මය කොටස් වශයෙනුත්, සමහර භික්ෂූන් සම්පූර්ණ වශයෙනුත් (ත්‍රිපිටකධාරී) දරන ලද බව.

තුන්වෙනි ධර්ම සංගායනාව අවසානය තෙක් ථේරවාද ආචාර්ය පරම්පරාවේ මොග්ගලීපුත්ත තිස්ස හිමියන්ගෙ ශිෂ්‍ය වූ මහින්ද මහ රහතන් වහන්සේගෙ පරපුරෙන් ත්‍රිපිටක ධර්මය සංගීතිකාරක මහ රහතුන්ගේ වාචනා මාර්ගය අනුව මුඛ පරම්පරාවෙන් පැවතියා. මේ විදිහට සම්බුද්ධ පරිනිර්වාණයෙන් පස්වෙනි සතවර්ෂය තෙක් කටපාඩමින් නොකඩ කොට ගෙනා ත්‍රිපිටක පෙළ දහම බු.ව. 440-454 අතර කාලයේ වළගම්බා රජු දවස පරියාප්තිධර සඩ් අභිඥාලාභී සිවුපිළිසිඹියාපත් පන්සියයක් මහරහතන් වහන්සේලා විසින් අළුලෙන් විහාරයේදි ග්‍රන්ථාරූඪ කරල සංගායනාවක් කළා.

ග්‍රන්ථාරූඪ කරපු කාලයේ මහ රහතන් වහන්සේලා ත්‍රිපිටකයම පුස්කොළවල ලියා තැබීමෙන් පෙනී යන්නෙ, ඒ උතුමන් අභිධර්ම පිටකය බුද්ධ දේශනාවක් විදිහට පිළිගෙන තියෙන බව. මේ විදිහට සංගායනා හතරකින් ත්‍රිපිටකය බුද්ධ දේශනා විදිහට පිළිගෙන තියෙද්දි, මහ රහතන් වහන්සේලාටත් අභියෝග කරමින් පෘථජ්ජන උගතුන්, අභිධර්මය බුද්ධ දේශනාවක් නෙවෙයි, පසුකාලීනව හදාගත්ත එකක්, පළවෙනි සංගායනාවෙදි සංග්‍රහ කරපු එකක් නෙවෙයි ... ආදී වශයෙන් බොළඳ තර්ක ඉදිරිපත් කරනවා.

අභිධර්මය බුද්ධ දේශනාවක් බව ඔප්පු කර ගන්න මෙතෙක් ඉදිරිපත් කරපු සාක්ෂි ප්‍රමාණවත් වගේම, තවත් තහවුරු කර ගන්න සූත්‍ර පිටකයේ සහ විනය පිටකයේ අභිධර්මය පිළිබඳ දේශනා කරල තියෙන කරුණු විමසා බලන්න පුළුවන්.

**මජ්ඣිම නිකායේ ගුලිස්සානි සූත්‍රයේ සැරියුත් හිමියන් ආරණ්‍ය භික්ෂූන්ට අභිධර්මය උගත යුතුයි කියල අවවාද කරපු බව මේ විදිහට සඳහන් වෙනවා.** ''අරඤ්ඤකේන ආවුසෝ භික්ඛුණා අභිධම්මේ, අභිවිනයේ යෝගෝ කරණීයෝ සත්තාවුසෝ .... අභිධම්මේ අභිවිනයේ පඤ්හං පුච්ඡිතාරෝ - ඇවැත්නි, ආරණ්‍යයෙහි වසන භික්ෂුව විසින් අභිධර්මය හා අභිවිනය උගත යුතුය. ඇවැත්නි වනයෙහි වසන භික්ෂුවගෙන් අභිධර්මය අභිවිනය ගැන ප්‍රශ්න අසන්නෝ වෙති. එසේ විචාල කල්හි පිළිතුරු දිය නොහැකි වූ විට මොහුට අභිධර්මය, අභිවිනය ගැන දැනුමක් නැතැයි කියා දොස් කියති. ඒ නිසා වනයෙහි වසන භික්ෂුව අභිධර්මයෙහි අභිවිනයෙහි දක්ෂයෙකු විය යුතුය.''

**මහාවග්ග පාළියේ, උපසම්පදා කර්ම කරවන භික්ෂූන් අංග පසකින් යුක්ත විය යුතු බවත්, අතවැසියන් අභිධර්මයේ හික්ම වීමට සමර්ථ වීම එයින් එක් අංගයක් බවත් ප්‍රකාශ වෙනවා.** (පංචහි භික්ඛවේ අංගේහි සමන්නාගතේන භික්ඛුණා උපසම්පාදේතබ්බං .... අන්තේවාසිකං වා සද්ධිවිහාරිකං වා අභිධම්මේ විනේතුං...)

පාචිත්තියා පාළියේ ''ඉංඝ තාව සුත්තන්තේවා ගාථායෝවා, අභිධම්මං වා පරියාපුනස්සු'' කියන පාඨයෙන්, ඒ කාලයේ අභිධර්මය භික්ෂූන් විසින් වෙනම පුහුණු කළ කරුණක් බව දැක්වෙනවා. එහිම භික්ඛුණී විභංගයේ ''අභිධම්මේ ඕකාසං කරාපෙත්වා සුත්තන්තං වා විනයං වා පුච්ඡති'' කියන මේ වාක්‍යයෙන් භික්ෂුණීන් වහන්සේලාත් අභිධර්මය හදාරපු බව ප්‍රකාශ වෙනවා.

බුදු රජාණන් වහන්සේ බරණැස ඉසිපතනාරාමයේ වැඩ වාසය කරද්දි, බොහෝ ස්ථවිර භික්ෂූන් පිණ්ඩපාතයේ ගිහින් ආපසු ඇවිත් මණ්ඩල මාලකයේ රැස් වෙලා අභිධර්මය ගැන සාකච්ඡා කරන බව අංගුත්තර නිකායේ හත්ථිසාරිපුත්ත සූත්‍රයේ සඳහන් වෙනවා. (තේන බෝ පන සමයේන සම්බහුලා ථේරා භික්ඛු මණ්ඩල මාලේ සන්නිසින්නා සන්නිපතිතා අභිධම්ම කථං කථෙන්ති) මෙයින් පෙනී යන්නෙ, බුද්ධ කාලයේ මහා කොට්ඨිත හාමුදුරුවො වගේ මහා ප්‍රාඥයන් රැස්වෙලා අභිධර්ම කථා සිදු කරල තියෙන බව.

බුද්ධ කාලයේ අභිධර්මයේ ප්‍රවීණ වූ ධම්ම කථික භික්ෂූන් නානා ප්‍රදේශවල වෙන වෙනම වැඩ හිටපු බව පාරාජිකා පාළියේ හා චුල්ලවග්ග පාළියේ දබ්බමල්ල පුත්ත තෙරුන්ගෙ කථාවෙනුත් පැහැදිලි වෙනවා. සෙනසුන් පැනවීමෙන් ☞

අග්‍රස්ථානය ලැබූ දබ්බමල්ල තෙරුන් විසින් නොයෙක් දෙසින් පැමිණෙන එක් එක් දක්ෂතාවයන් තිබිච්ච භික්ෂූන්ට වෙන වෙනම ආසන පනවපු බව සඳහන් වෙනවා. සූත්‍ර දේශනා ප්‍රගුණ කරපු භික්ෂූන්ට එක තැනක, විනයධර භික්ෂූන්ට එක තැනක, ධර්ම කථිකයන්ට එක තැනක ... ආදී වශයෙන්. ''අභිධම්මිකෝයේව ධම්ම කථිකෝ'' කියන දේශනයට අනුව ධර්ම කථිකයන් අභිධර්ම ධරයන් බව පෙන්වා තියෙනවා.

මන්තානිපුත්ත පුණ්ණ ථේර අපදානයේ ''අභිධම්මනයඤ්ඤූහං'' කියල තමන් අභිධර්ම න්‍යායන් දන්න බව පවසල තියෙනවා. ධර්ම කථිකයන් අතර අග තැන්පත් වුනේ පුණ්ණ හාමුදුරුවො. ඒ කාරණයෙනුත් ධර්ම කථිකයන් අභිධර්මිකයන් බව සනාථ වෙනවා.

එක් කාලයක භාග්‍යවතුන් වහන්සේ සැරියුත්, මුගලන්, ආනන්ද, රේවත ආදී සාසනයේ බොහෝ ප්‍රකට තෙරවරුන් සමග ගෝසිංග සාල වනයේ වැඩ වාසය කළා. මේ තෙරුන් වහන්සේලා එකතු වෙලා හිටපු අවස්ථාවක ගෝසිංග සාල වනය ගැන සැරියුත් හාමුදුරුවො මේ විදිහට ප්‍රකාශ කළා. ''රාත්‍රිය ඉතා පැහැදිලිය. ගස්වල මල් පිපී ඇත. දෙව් සුවඳ මෙන් සුවඳ හමයි.'' මේ විදිහට පරිසරයේ සොබා සෞන්දර්ය ප්‍රකාශ කරල එක් එක් රහතන් වහන්සේලා ගෝසිංග සාල වනය බබලන්න හේතු පැහැදිලි කළා. එතනදී මුගලන් මහ රහතන් වහන්සේ ''ද්වේ භික්ඛූ අභිධම්ම කථං කථෙන්ති'' යම් භික්ෂූන් වහන්සේලා දෙනමක් අභිධර්මය කථා කරයිද ඒ හේතුවෙන් ගෝසිංග සාල වනය බබලන බව ප්‍රකාශ කළා කියල සූත්‍රයේ සඳහන් වෙනවා.

**අංගුත්තර නිකායේ තතීය අනාගත භය සූත්‍රයේ, කාය භාවනා, සීල භාවනා, චිත්ත භාවනා, පඤ්ඤා භාවනා නොවැඩූ අය අභිධර්මය කථා කරන්න යෑමෙන් කළු ධර්ම (අසත් ධර්ම) මතු වෙලා සත්ධර්මය වැනසෙන හැටි පෙන්වා තියෙනවා.** මේ දේශනාව අනුව නොවැඩූ කාය භාවනා ආදිය තියෙන අය අභිධර්මය කථා නොකළ යුතු බව සඳහන් වෙනවා. ඉහත සතරාකාර භාවනා උපරිම වශයෙන් තියෙන්නෙ රහතන් වහන්සේලාට, අවමය තියෙන්නෙ සෝතාපන්න ආර්ය ශ්‍රාවකයන්ට. මේ අනුව කාය, සීල, චිත්ත, පඤ්ඤා භාවනා නැති පෘථජ්ජනයන්ට අභිධර්මය කථා කරන්න අයිතියක් නෑ. නමුත් අභිධර්මය බුද්ධ දේශනාවක් නෙවෙයි කියල මත ප්‍රකාශ කරන්නෙත්, වර්තමානයේ අභිධර්මාචාර්යවරුන් සහ අභිධර්ම විශාරදයන් විදිහට පෙනී සිටින්නෙත් පෘථජ්ජන භූමියේ ඉන්න අයමයි. මේ අනුව මේ අය කරන්නෙ තමන්ට අයිති නැති, විෂය නොවන පරම ගම්භීර අභිධර්මය ගැන කරුණු කියමින් අසද්ධර්මය මතු කරමින් සද්ධර්මය විනාස කිරීම නෙවෙයිද ? මේ කාරණය තථාගතයන් වහන්සේ විසින් සාසනයට සිදුවන අනාගත බයක් විදිහටයි දකල තියෙන්නෙ.

අභිධර්මය අවලංගු කරන තැනැත්තා ජින චක්‍රයට (තථාගත ධර්මයට) පහර දෙන්නේය, සර්වඥතා ඥානය අවලංගු කරන්නේය, සාස්තෘන් වහන්සේගේ විසාරද ඥානය නවත්වන්නේය, දහම් අසනු කැමති ජනයා රවටන්නේය, ආර්ය මාර්ගය හරහා වැටක් බඳින්නේය, අටලොස් භේදකර වස්තුන්ගෙන් එකක පෙනී සිටින්නේය, භික්ෂූන්ට දඬුවම් කරන උක්ෂේපනීය කර්මය, නිස්සය කර්මය, තජ්ජනීය කර්මය යන විනය කර්මයන්ට සුදුස්සෙක් වන්නේය, දඬුවම් පිණිස ඒ විනය කර්මයක් කොට සසුනෙන් නෙරපිය යුත්තෙක් වන්නේය කියල අර්ථ කථාචාර්යන් වහන්සේලා ප්‍රකාශ කරල තියෙනවා.

පළවෙනි ධර්ම සංගායනාවට පෙර අභිධර්මය තිබුණෙ නෑ කියල කියන අය හේතු සහිතව ඒ කාරණය සනාථ කරන්නෙ නෑ. එහෙම කියන අය විනය සූත්‍ර පිටක දෙක පළවෙනි සංගීතියේදී සංග්‍රහ වූ බව පිළිගන්නවා. විනය පිටකයේ වගේම සූත්‍ර පිටකයෙත් නොයෙක් තැන්වල අභිධර්මය සඳහන් වෙන බව මෙතෙක් පෙන්වා තියෙන කරුණුවලින් සනාථ වෙනවා. එහෙනම් අභිධර්මය බුද්ධ දේශනාවක් නෙවෙයි කියල මත ප්‍රකාශ කරන අයට විනය සූත්‍ර පිටක අනුව අභිධර්මය පිළිගන්න සිද්ධ වෙනවා. එහෙම පිළිගන්නෙ නැත්නම්, විනය සූත්‍ර දෙපිටකය පිළිගන්නත් ඒ අයට සාධාරණ අයිතියක් නෑ. සූත්‍ර පිටකයේ උද්දේස වශයෙන් (මාතෘකා) දේශනා කළ දහම් කරුණුවල පූර්ණ විස්තරය (නිද්දේස, පටිනිද්දේස) වටහා ගන්න පුළුවන් වෙන්නෙ අභිධර්ම පිටකයෙන්.

විභංග ප්‍රකරණය තුළ ඒ වගේ සියුම් විවරණයන් බොහෝ කොටම දකින්න තියෙනවා. පටිච්ච සමුප්පාදයේ මාතෘකා පාළිය සූත්‍ර පිටකයේ තිබුණත් පූර්ණ විස්තරයක් සඳහන් වෙන්නෙ නෑ. ඒක දැන ගන්න පුළුවන් වෙන්නෙ පටිච්ච සමුප්පාද විභංගය පරිශීලනය කිරීමෙන්. හේතු පටිච්ච සමුප්පාදය, ප්‍රත්‍ය පටිච්ච සමුප්පාදය, අඤ්ඤමඤ්ඤ පටිච්ච සමුප්පාදය, සම්පයුක්ත පටිච්ච සමුප්පාදය, ලෝභ මූල, දෝස මූල, මෝහ මූල පටිච්ච සමුප්පාද චක්‍ර, කුසල මූල පටිච්ච සමුප්පාදය වගේ චක්‍රයන් විස්තර වශයෙන් විභංග ප්‍රකරණයේ සඳහන් වෙලා තියෙනවා.

ඒ වගේම එක චිත්තක්ෂණයක් තුළ පටිච්ච සමුප්පාද චක්‍ර 4 ක් ක්‍රියාත්මක වන හැටිත් විස්තර වෙනවා. සිත පිළිබඳ මේ වගේ සූක්ෂම විග්‍රහයක් සර්වඥතා ඥානයකින් මිසක් වෙන ක්‍රමයකින් විස්තර කරන්න පුළුවන් කමක් නෑ. ''අභිධම්මෝ නාම න අඤ්ඤේසං විසයෝ සබ්බඤ්ඤු බුද්ධානං යේව විසයෝ'' කියල අභිධර්මය සර්වඥවරයෙකුට හැර අන් කෙනෙකුට විෂය නොවන බව අර්ථ කථාචාර්යන් වහන්සේලා පවා ප්‍රකාශ කරල තියෙන්නෙ අභිධර්මයේ තියෙන ගැඹුර නිසා.

සත්තිස් බෝධි පාක්ෂික ධර්මත් අභිධර්මය විදිහට දක්වල තියෙනවා. මේ දේශනය වරදවා වටහා ගෙන, අභිධර්මය කියන්නෙ බෝධි පාක්ෂික ධර්ම මිසක් අභිධර්ම පිටකය නෙවෙයි කියල සමහර අය ප්‍රකාශ කරනවා. සමහර අසපුවාසී භික්ෂූන් මේ වැරදි මතයේ සිටින බවත්, සූත්‍ර පිටකයේ ඛුද්දක නිකායේ කොටසුත් බුද්ධ දේශනා නෙවෙයි කියල බැහැර කරන බවත් පෙන්වා දෙන්න ඕන. මේ වගේ වැරදි මත සමාජගත කිරීමෙන් සිද්ධ වෙන්නෙ, ඒවා පිළිගන්න පශ්චිම ජනතාව වගේම අනුගාමික පැවිදි පිරිස් දෘෂ්ටානුගතියට වැටිල අවැඩ සිද්ධ කර ගැනීම. බෝධි පාක්ෂික ධර්මයන් අභිධර්ම පිටකයෙත් තියෙනවා. සූත්‍ර පිටකයට වඩා මේ කරුණුත් මැනවින් විස්තර කරල තියෙන්නෙ අභිධර්මය තුළ. බෝධි පාක්ෂික ධර්ම කියන කොට අභිධර්මපිටකාගත කරුණුත් ඒකට ඇතුලත් වෙනවා. බෝධි පාක්ෂික ධර්මවලින් පිටත අමුතු අභිධර්මයක් නෑ.

ඒ නිසා සර්වඥතා ඥානයෙන් ලෝකයට හෙළි කළ ශ්‍රී සද්ධර්මය පෘථජ්ජන නුවණින් බලල වැරදි දෘෂ්ටි ඇති කර ගෙන පරිහානියට පත් නොවී, විමර්ශන බුද්ධියෙන් ධර්මය දන්න කල්‍යාණ මිත්‍ර ඇසුරෙන් ධර්ම න්‍යායන් නිවැරදිව වටහා ගෙන, ධර්මය ගැන සැක නොකර සිවුසස් දහම් අවබෝධ කර ගන්න උත්සාහ කරන්න ඕන. එයින් දියුණුවක් මිසක් පිරිහීමක් වෙන්නෙ නෑ.

**කිවුල්දෙණියේ විජිතනන්ද හිමි**
**නිග්‍රෝධාරාම සේනාසනය, පොල්පිටිය,**
**මැටිකුඹුර, පොල්ගහවෙල**
**071-6839346**

# සාසනික පැවිද්ද... 4

භික්ෂුවගේ පැවැත්මට සිවුපසය අත්‍යවශ්‍ය කරුණක්. ඒත් හැමෝගෙන්ම සිවුපසය ඉල්ලන්න භික්ෂුවට අයිතියක් නෑ. දස නෑයන්ගෙන් සිවුපසයට අදාල දේවල් ඉල්ල ගන්න පුළුවන්. ඒ කියන්නෙ පිණ්ඩපාතෙ වැඩල ගන්න දේවල් නෙවෙයි, වෙනම කියල ඉල්ල ගන්නව නම් මේ දස නෑයන්ගෙන් විතරයි ඉල්ලන්න හිමිකම තියෙන්නෙ. ඉස්සරත් භික්ෂූන් වහන්සේලා කාගෙන් හරි අවශ්‍ය දෙයක් ඉල්ල ගත්තම, ඒ ඔබේ නෑයෙක්ද කියල අහල නෑයෙක් නම් ප්‍රශ්නයක් නෑ කියල කියපු තැන් ධර්මයේ පෙන්වා තියෙනවා. ඒ ගැන ධර්මයේ මේ විදිහට සඳහන් වෙනවා.

ජෙට්ඨ භාතා කණිට්ඨාච
තථා භගිනියෝ දුවේ
චූල මාතා චූල පිතා
මහා මාතා මහා පිතා
මාතුච්ඡා මාතුලෝ චේති
දසමේ ඥාතයෝ මතා

1. වැඩි මහල් සහෝදරයා
2. බාල සහෝදරයා
3. වැඩි මහල් සහෝදරිය
4. බාල සහෝදරිය
5. බාප්පා
6. පුංචි අම්මා
7. නැන්දා
8. මහප්පා
9. ලොකු අම්මා
10. මාමා

මේ පෙන්වන්නෙ මව්පිය දෙපාර්ශවයෙන් බෙදී ගිය නෑදෑ පිරිස. වෙනත් විදිහකින් කියනව නම් සතර වරිගයේ ඥාතීන් මේකට අයිති වෙනවා. එතකොට අම්ම තාත්තගෙන් තමයි නෑදෑ පරපුර පටන් ගෙන විහිදිලා යන්නෙ. ඒ නිසා අම්ම තාත්තගෙ නම් මේ දහයට ඇතුළත් නොකළට ඒ අයගෙන් කොහොමත් ඉල්ල ගන්න පුළුවන්. ඒක අමුතුවෙන් කියන්න ඕන නෑ. ඊට අමතරව භික්ෂූන් වහන්සේ නමකට තමන්ගෙ අම්මට තාත්තට සලකන්නත් අයිතියක් තියෙනවා. මොකද හාමුදුරු නමක් වුනත් පිණ්ඩපාතෙ කරල හරි තමන්ගෙ අම්ම තාත්තට සිවුපසයෙන් සලකන්න ඕන කියල බුද්ධ දේශනාවෙ තියෙනවා. හැබැයි නැන්දට, පුංචි අම්මට, බාප්පට .... ආදී නෑයන්ට එහෙම කරන්න කියල නෑ. එතකොට අම්ම තාත්ත කියන්නෙ මේ කියන නෑකමට වඩා එහා ගිය සම්බන්ධයක්. ඒ නිසා මේ දස නෑයන් කිව්වම අම්ම, තාත්තත් අයිතියි.

<u>සිවුපසයේ තෙවදෑරුම් සතුට</u>

1. යථා ලාභ සන්තෝසය (සිවුපසය ලැබුණු පරිදි සතුටු වීම) - ඒ කියන්නෙ නොලැබුණා කියල දුක් වෙන්නෙ නෑ. නීරසව ලැබුන කියල වෙනසකුත් නෑ. ඒ විදිහට සතුටු වෙන්න පුරුදු වෙන්න ඕන.

2. යථා බල සන්තෝසය (රෝගයකට බෙහෙතක් දීමෙන් පහසුව ලැබෙන පරිද්දෙන් ප්‍රත්‍යයෙහි සතුටු වීම) - රස



පිණිස නෙවෙයි, අසීමිතව බඩ පුරව ගන්න නෙවෙයි, බඩ ගිනි ක්ලාන්ත කැරකිලි ආදිය දුරු කර ගෙන නිවන් මග පූර්ණ කර ගන්න කියන අදහස.

3. යථා සාරුප්ප සන්තෝසය (තමන්ගෙ තත්ත්වයට ගැලපෙන පරිද්දෙන් සිවුපසයෙන් සතුටු වීම) - ඒ කියන්නෙ සමහරු විසාල වශයෙන් බලාපොරොත්තු වෙනවා. කොච්චර දුන්නත් මදි. එහෙම වෙන්නෙ නැතිව තමන්ගෙ තත්ත්වයට ගැලපෙන විදිහට සතුටු වෙන්න ඕන.

<u>සිවුපස පරිභෝගය</u>

1. ථෙය්‍ය පරිභෝගය
2. ඉණ පරිභෝගය
3. දායජ්ජ පරිභෝගය
4. සාමි පරිභෝගය

1. මහණ දම් පුරන්නෙ නැතිව ශ්‍රමණ වෙස් අරගෙන සංඝයා මැද පෙනී සිටිමින් සිවුපසය පරිභෝග කිරීම සොරා කෑමක්. ඒ තමයි ථෙය්‍ය පරිභෝගය.

සද්ධාය දින්නං යං දානං
දුස්සීලෝ පරිභුඤ්ජති
තත්තෝ ලෝහ ගුලෝ භුත්තෝ
සෙය්‍යෝ අග්ගි සිඛූපමෝ

**යමෙක් සද්ධාවෙන් දෙන දානය දුස්සීලව ඉඳගෙන පරිභෝග කරනවට වඩා රත් වූ ගිනි විසිවෙන ලෝහ ගුලි ගිලීම යහපත්.** එයින් යම් විපතක් වේ නම්, එය මේ ජීවිතයට පමණයි. නමුත් දුසිල්ව ඉඳගෙන සිවුපස පරිභෝග කිරීමෙන් සසර ගමන තුළ බොහෝ අපාය ආදී දුක් විපාකවලට මුහුණ දෙන්න සිද්ධ වෙනවා. මේ තමයි ථෙය්‍ය පරිභෝගය හෙවත් හොරා කෑම.

2. ඉණ පරිභෝගය කියල කියන්නෙ සිල්වතුන් වහන්සේලා වුනත් (මග ඵල නොලැබූ) ප්‍රත්‍යවේක්ෂා නොකර පරිභෝග කිරීම. ඒක ණයට පරිභෝග කිරීමක් නිසා ඉණ පරිභෝගය කියල හඳුන්වනවා. එතකොට ඒ ණය / වන්දිය ගෙවන්න වෙනවා. නමුත් ඇහිපිය ගහන මොහොතක් හරි මෙත් සිතක් වැඩුවොත් ඉණ පරිභෝගයට අහු වෙන්නෙ නෑ. ඒ කියන්නෙ මෙත් භාවනාව වඩන කෙනෙක් ප්‍රත්‍යවේක්ෂා නොකළත් ඉණ පරිභෝගයට අහු වෙන්නෙ නෑ. මෙත් සිත වැඩීම විතරක් නෙවෙයි, අච්චරාසංඝ සූත්‍ර 182 ක තියෙන කාරණාවලින් මොකක් වැඩුවත් ඉණ පරිභෝගයට අහු වෙන්නෙ නෑ. මොකද ඒ කාරණා 182 න් කියන්නෙ නිවනට හේතු වන කර්මස්ථාන.

3. මාර්ගඵල ලාභීන්ගෙ සිවුපස පරිභෝගය දායජ්ජ පරිභෝගය කියල හඳුන්වනවා. දායජ්ජ කියන්නෙ දායාදයක් විදියට අයිතියක්, උරුමයක් පැවතීම. ඒ කියන්නෙ බුදුන් වහන්සේගෙ දරුවො වශයෙන් හිමි වන අයිතිය. මොකද දායාදයක් විදිහට හිමිකම ලැබෙන්නෙ නියම බුද්ධ ශ්‍රාවකයන්ට හෙවත් මගඵල ලාභීන්ට. එතකොට මගඵල ලාභීන් ප්‍රත්‍යවේක්ෂා නොකළත් ඉණ පරිභෝගයට අහු වෙන්නෙ නෑ. නමුත් ප්‍රත්‍යවේක්ෂා කරල ගත්තොත්, ආහාරයට තියෙන

අමනුස්ස බැල්ම නැති වෙන නිසා ප්‍රත්‍යවේක්ෂා කිරීම ඒ හේතුවෙන් වැදගත්.

4. රහතන් වහන්සේලාගේ සිවුපසය පරිභෝගය තමයි සාමි පරිභෝගය. බක්කුල මහ රහතන් වහන්සේ පැවිදි වෙලා අටවෙනි දවසෙ අරිහත්වයට පත් වෙලා, මම ණයට කෑවෙ දින 07 ක් පමණක් බව ප්‍රකාශ කළා. මොකද සමහර විට උන් වහන්සේ ඒ කාලය තුළ ප්‍රත්‍යවේක්ෂා නොකර සිවුපසය ගත්ත වෙන්නත් පුළුවන්. ඒ කියන්නෙ ඒ දින 7 තුළ මගඵල ලාභියෙක් නොවී ප්‍රත්‍යවේක්ෂා නොකර ගත්ත නම් ඉණ පරිභෝගයට අහු වෙනවා. එහෙම ඉඳල අට වෙනි දවසෙදි එක පාරටම අරිහත්වයට පත් වුනා නම්, එතැන් පටන් ප්‍රත්‍යවේක්ෂා නොකළැයි කියල ඉණ පරිභෝගයට අහු වෙන්නෙ නෑ. ඒ වගේ දෙයක් තමයි එතනදි සිද්ධ වෙන්න ඇත්තෙ. ඒ වගේම රහතන් වහන්සේට සිවුපසය සම්බන්ධයෙන් මගඵල ලාභීන්ටත් වඩා ස්වාමිත්වයක් ඇති නිසාම ස්වාමි පරිභෝගය කියල හඳුන්වනවා. මොකද රහතන් වහන්සේ කෙළෙස් සහමුලින්ම දුරු කරල ඉන්න නිසා, උන් වහන්සේ අතින් කිසිම පාපයක් නොවන නිසා ඒ ස්වාමිත්වය / හිමිකම පූර්ණ වශයෙන්ම තියෙනවා.

<u>අග්ගික්ඛන්ධෝපම සූත්‍රය</u>

එක් කාලයක තථාගතයන් වහන්සේ භික්ෂු සංඝයා සමග කොසොල් ජනපදයේ චාරිකාවෙ වැඩියා. මගට වැඩිය තථාගතයන් වහන්සේ එක් ප්‍රදේශයක ගිනිගෙන දිලිසෙන ගිනිදැල් සහිත මහා ගිනි කන්දක් දැකල පාරෙන් ඉවත් වෙලා ගසක් මුල පනවපු ආසනයක වැඩ හිටියා. එහිදී උන්වහන්සේ භික්ෂූණ් අමතල මහණෙනි, ගිනිගෙන දිලිසෙන අර මහා ගිනි කන්ද දක්කද කියල අහල, එසේය ස්වාමීනි කියල පිළිතුරු දුන්නට පස්සෙ මේ විදියට වදාරනවා.

මහණෙනි, කුමක් සිතන්නේද ? මේ ගිනිගෙන දැවෙන ගිනි කන්ද වැළඳගෙන හිඳියි සයනය කරයි, නැත්නම් මොළොක් අත් පා ඇති තරුණ කුමාරිකාවක් වැළඳගෙන හිඳියි සයනය කරයි කියන දෙකෙන් කුමක් උතුම්ද ? ස්වාමීනි, අර තරුණිය වැළඳගෙන සිටීම උතුම්, අර ගිනි කන්ද වැළඳ ගැනීම මහා දුකක්මයි කියල භික්ෂූණ් පිළිතුරු දුන්නා.

මහණෙනි, පාප ධර්ම ඇති, අපිරිසිදු, සැක කටයුතු හැසිරීම් ඇති, සැඟවිය යුතු දේවල් ඇති අශ්‍රමණවම ශ්‍රමණ වෙමියි කියන, අබ්‍රහ්මචාරීව බ්‍රහ්මචාරියෙක් යැයි කියන, ඇතුළත කුණු වූ කෙළෙස් සහිත දුස්සීලයාට ඒ ගිනි කන්ද වැළඳ ගැනීම උතුම්. ඊට හේතුව නම් ගිනි කන්ද වැළඳ ගැනීමෙන් මරණයට හෝ මරණ මාත්‍ර දුකකට හෝ පත් වුනත් ඒ හේතුවෙන් මරණින් මතු දුගතියකට යන්නෙ නෑ. නමුත් දුස්සීලයා තරුණ ස්ත්‍රියක් සමග සයනය කරයිද, වැළඳ ගනීද එය ඔහුට බොහෝ කල් අහිත පිණිස, දුක් පිණිස පවතිනවා, මරණින් මතු දුගතියේ උපත ලබනවා.

මහණෙනි, ශක්තිමත් පුරුෂයෙක් දැඩි පටියකින් කලවා දෙක වෙළල අදිනවා. ඒ වර පට සිවිය, හම, මස, නහර ඇට කපා ගෙන ඇට මිදුළුවල ගැටී සිටිනවා කියන යමක් වෙයිද, ගෘහපතියන්ගේ අභිවාදනය (වන්දනා මාන) පිළිගනී කියන යමක් වේද මෙයින් කුමක් වඩා ශ්‍රේෂ්ඨද ? ස්වාමීනි, අභිවාදනය පිළිගැනීම ශ්‍රේෂ්ඨයි, වර පටින් වෙලා ඇදීම මහ දුකක්.

මහණෙනි, වර පටින් ඇද යම් තද කිරීමක් වේද එය ශ්‍රේෂ්ඨයි. මක් නිසාද, ඒ හේතුවෙන් මරණය හෝ මරණ මාත්‍ර දුකක් සිද්ධ වෙන නමුත් ගිහියන්ගේ අභිවාදනය දුස්සීලව ඉඳගෙන පිළිගැනීම ඔහුට බොහෝ කල් අහිත පිණිස දුක් පිණිස පවතින අතර අපාගත වෙන්නත් සිද්ධ වෙනවා.

මහණෙනි, යම් පුරුෂයෙක් තියුණු සැතකින් පපුවට පහර දෙයි කියන යමක් වෙයිද, ගෘහපතියන්ගේ ඇඳිලි බැඳීම් (නමස්කාර කිරීම්) දුස්සීලව ඉඳගෙන පිළිගනීද, මේ දෙකෙන් සැතකින් පහර කෑම උතුම්. ඇඳිලි බැඳීම් පිළිගැනීම මහා අනර්ථකාරීයි.

මහණෙනි, ශක්තිමත් පුරුෂයෙක් ගිනි ගෙන දිලිසෙන යකඩ පටියකින් වෙළයි යන යමක් වේද, සැදැහැයෙන් පුදන සිවුරු දුස්සීලව ඉඳගෙන පරිහරණය කරයි යන යමක් වේද මෙයින් යකඩ පටියෙන් සිවුර වෙලීමම උතුම්.

මහණෙනි, බලවත් පුරුෂයෙක් ගිනි ගෙන දිලිසෙන රත් වූ යකඩ අඬුවකින්, කට විවර කොට ගිනි ගත් ලෝහ ගුලි බහාලයිද, එය ඔහුගේ දිව කට පපුව අතුනු බහන් දවා අධෝ මුඛයෙන් පිට වෙයි යන යමක් වේද, සැදැහැවතුන් දෙන පිණ්ඩපාතය දුස්සීලව ඉඳගෙන වළඳයි යන යමක් වේද, මේ දෙකෙන් ලෝහ ගුලි ගිලීමම යහපත්.

මහණෙනි, පුරුෂයෙක් හිසින් හෝ කඳින් ගෙන ගිනි ගත් යකඩ ඇඳක, පුටුවක සයනය කරයි හිඳුවයි යන යමක් වේද, සැදැහැවතුන් දුන් ඇඳ පුටු දුස්සීලව ඉඳගෙන පරිහරණය කිරීම යන යමක් වේද මෙයින් රත් වූ ඇඳ පුටුවල සිටීමම උතුම්.

මහණෙනි, යම් පුරුෂයෙක් පා උඩට හිස යටට හරවා පැසුණු ගිනි දැල් සහිත ලෝදිය හැළියක ඔබයි යන යමක් වේද, සැදැහැවතුන් දුන් විහාර ආරාම දුසිල්ව ඉඳගෙන පරිහරණය කරයි යන යමක් වේද, මෙයින් ලෝදිය හැලියේ සිටීමම උතුම්. එයින් වන යම් මරණය හෝ මරණය සමාන දුකක් වෙයිද එය මෙලොවට පමණයි. ඒ හේතුවෙන් දුගතිගාමී වෙන්නෙ නෑ. නමුත් දුසිල්ව ඉඳගෙන විහාරාරාම පරිහරණය බොහෝ දුක් පිණිස අවැඩ පිණිස පවතින අතර දුගතිගාමී වෙන්නත් හේතු වෙනවා.

ඒ නිසා සැදැහැවතුන් දෙන සිවුපසය මහත් ඵල කරදීම සඳහා සිල් ගුණ සහිතව වාසය කරන්න භික්ෂුව උත්සාහවන්ත වෙන්න ඕන. මේ දේශනාව අහපු 60 නමක් පමණ භික්ෂූන් උණු ලේ වමනය දැම්මා. 60 නමක් පැවිදි ජීවිතය ගත කිරීම ඉතා දුෂ්කරයි කියල සිවුරු හැර ගියා. තවත් 60 නමක් සියලු කෙළෙසුන් නසල අරිහත්වයට පත් වුණා. **දුසිල්ව ඉඳගෙන කරන සිවුපස පරිභෝගයේ භයානක බව මේ ගිනි කඳු උපමා සූත්‍රයෙන් පැහැදිලි වෙනවා.**

<u>සිවුපසය</u>

චීවර, පිණ්ඩපාත, සේනාසන, ගිලන් පස කියන මේ කාරණා පැවිද්දාගේ නිස්සය (ඇසුරු කරන) හතර විදිහට හැඳින්වෙනවා. මේ පිළිබඳ තථාගතයන් වහන්සේ මේ විදිහට දේශනා කරල තියෙනවා.

1. **පැවිද්ද යනු පාත්‍රය ගෙන ගෙපිළිවෙලින් පිඬු සිඟා ගොස් වඩින ආහාරය වැළඳීමයි.** මේ සඳහා පැවිද්දා දිවි ඇති තෙක් උත්සාහ කළ යුතුයි. සංඝයාට දෙන දානය, දෙතුන් නම බැගින් ආරාධනා කර දෙන දානය, පෞද්ගලික වශයෙන් ආරාධනා කර දෙන දානය, සලාක දානය, පක්ෂයකට වරක් බැගින් දෙන දානය, පොහෝ දිනවල දෙන දානය කියන මේ සියල්ල අතිරේක ලාභ වශයෙන් සැලකිය යුතුය.

2. **පැවිද්ද යනු පාංශුකූල චීවරය නිසා පවතින එකකි.** මේ සඳහා ජීවිතාන්තය තෙක් උත්සාහ කළ යුතුය. ඊට අමතරව ලැබෙන පට සිවුරු, කපු නූලෙන් තැනූ සිවුරු, ලොම්වලින් තැනූ සිවුරු ආදිය අතිරේක ලාභයක් ලෙස සැලකිය යුතුය.

3. **පැවිද්ද යනු රුක්ඛ මූල** ☞

**සේනාසනය නිසා පවතින එකකි.** මේ සඳහා දිවි ඇති තෙක් උත්සාහ කළ යුතුය. පෙර පුණ්‍ය විපාක වශයෙන් සකස් කළ සේනාසන, කුටි ගෙවල්, විහාර ලැබෙයි නම් ඒ සියල්ල අතිරේක ලාභයන් ලෙස බාරගත හැක.

4. **පැවිද්ද යනු අරළු, එළ ගව මුත්‍රවල දමා පල් කර හදන බෙහෙත් ගිලන් පස ලෙස ගැනීමයි.** ඒ සඳහා ජීවිතාන්තය දක්වා වෑයම් කළ යුතුය. ගිතෙල්, වෙඬරු, තල තෙල්, මී පැණි, උක් සකුරු යන මේවා අතිරේක ලාභ ලෙස සලකා පරිභෝග කළ හැක.

<u>ප්‍රත්‍යවේක්ෂා කරමින් සිවුපස පරිභෝගය</u>

1. <u>චීවර ප්‍රත්‍යවේක්ෂාව</u> - පැවිද්දා නිදන, පොරවන වස්ත්‍ර සියල්ලම චීවර කියල හඳුන්වනවා. ලස්සන වෙන්න, උසස් විදිහට පෙනී සිටින්න සිවුරු පරිභෝග කරනව නම් ඒක පැවිද්දාට ගැලපෙන්නෙ නෑ. ඒ නිසා ප්‍රත්‍යවේක්ෂා කරල සිවුරු පරිහරණය කරන්න ඕන.

මම මේ සිවුරු පරිභෝග කරන්නෙ සීතල උෂ්ණය වළක්වා ගන්න, අව්වෙන් සුළඟින් පත්තෑ ... ආදී සර්පයන්ගෙන් ඇති වන පීඩා දුරු කර ගන්න, ලැජ්ජා ස්ථාන ආවරණය කර ගන්න කියන අදහසින් සිවුරු පරිහරණය කරන්න ඕන.

ධාතු වශයෙන්, පටිකූල වශයෙන් චීවර ප්‍රත්‍යවේක්ෂා කරන්න ඕන. පටිකූල කියන්නෙ ප්‍රතික්ෂේපිත / පිළිකුල් කියන අදහස. පිළිකුල් කිව්වම නොයෙක් අර්ථ එනවා. අද ද්වේශ සහගත අර්ථයෙන් ගන්න කොටත් පිළිකුල කියනවා. නමුත් මේ කියන්නෙ එහෙම එකක් නෙවෙයි. ප්‍රිය නොකරන ස්වභාවය. විශේෂයෙන් කෙලෙස් පිළිකුල් කරන්න ඕන. සිවුර කියන්නෙ පඨවි, ආපෝ, තේජෝ, වායෝ කියන ධාතු සමූහයක්. මේ ශරීරයත් ඒ වගේම ධාතු සමූහයක්. සත්ව / පුද්ගල වශයෙන් ගත යුතු හරයක් ඒ තුළ නෑ. ඒ නිසා සිවුර ශරීරයේ වෙලිල තියෙන බව දන්නෙ නෑ. ශරීරයත් තමා කෙරෙහි සිවුර වෙලිල තියෙන බව දන්නෙ නෑ. ශරීරයත් සිවුරත් ඔවුනොවුන් ගැන අපේක්ෂාවක් නැතිව පවතිනවා. මේ විදිහට ධාතු වශයෙන් මෙනෙහි කරන කොට සිවුර නිසා ඇති වෙන්න පුළුවන් තණ්හා මාන දුරුවෙලා යනවා.

පටික්කූල වශයෙනුත් සිවුරු පරිභෝග කරන්න පුළුවන්. සිදුරු 9 කින් සහ බොහෝ කුඩා සිදුරුවලින් මළ මුත්‍ර, කෙළ, සොටු, දහඩිය ආදිය උතුරන වැගිරෙන මේ ශරීරයට පෙරවපු සිවුරුත් අපවිත්‍ර වෙලා පිළිකුල් බවට පත් වෙන බව සිහි කරන්න ඕන.

<u>පිණ්ඩපාත ප්‍රත්‍යවේක්ෂා</u>

චත්තාරෝ පංච ආලෝපේ
අභුත්වා උදකං පිවේ
අලං ඵාසු විහාරාය
පහිතත්තස්ස භික්ඛුණෝ

පැවිද්දා විසින් සම්පූර්ණයෙන් කුස පිරිල තද නොවන විදිහට ආහාර ගන්න ඕන. බත් පිඬු 4 - 5 ක් වළඳන්න ඉඩ තියෙද්දි තවත් ආහාර නොගෙන පැන් පානය කරන්න ඕන. මේ විදිහට ආහාර වැළඳීමෙන් ඉරියව් පැවැත්වීමට පහසු වෙනව වගේම නිරෝගී භාවයත් ලැබෙනවා. ආහාර තණ්හාව දුරු කර ගන්න පුත්‍ර මාංස උපමාවක් තථාගතයන් වහන්සේ විසින් පෙන්වා තියෙනවා.

අඹු සැමි දෙන්නෙක් මාර්ග උපකරණ රැගෙන දරුවෙකුත් සමග යොදුන් 100 ක් පමණ දුර කාන්තාරයක ගමන් කරනවා. මෙහෙම යන කොට කාන්තාරය මැදදි, රැගෙන ගිය ආහාර පාන අවසන් වෙනවා. දැන් මේ අයට ඉදිරියට යන්න හෝ ආපසු එන්න හැකියාවක් නැතිව කුසගින්නෙන්, පිපාසයෙන් පීඩාවට පත් වෙලා වාඩි වෙලා ඉන්නවා. පුරුෂයා තමන්ගෙ බිරිඳ අමතල මෙහෙම කියනවා. සොඳුර යොදුන් 50 ක් එහා මෙහා දිසාවක්, ගම්මානයක්, නිවසක් නෑ. දැන් කළ යුතු කිසිවකුත් නෑ. දැන් අපි තුන් දෙනාටම සිද්ධ වෙන්නෙ මැරෙන්න. අපි තුන් දෙනාම මැරෙනවට වඩා ඔබ දෙපළවත් ජීවත් වෙන්න ඕන. ඒ නිසා මා මරාගෙන මස් අනුභව කරල කුස ගිනි නිවාගෙන ඉතිරි මස් ටික මගදි ප්‍රයෝජනයට ගන්න රැගෙන ගිහින් ඔබ දෙපළ ජීවිතය රැක ගන්න. මේ විදිහට ස්වාමි පුරුෂයා බිරිඳට මතක් කළා.

ඒ අවස්ථාවෙදි බිරිඳ, ස්වාමීනි ස්ත්‍රියකට කරන්න පුළුවන් කිසි කර්මාන්තයක් මෙහේ නෑ, ඒ නිසා මා මරාගෙන මස් අනුභව කරල ඔබ දෙපළ මේ විපතින් මිදිල ජීවිතය රැක ගන්න කියල ඉල්ලුවා. එතකොට පුරුෂයා නැවතත් මෙහෙම කියනවා. සොඳුර ඔබ මැරුණොත් මේ දරුවා ජීවත් වෙයි කියල හිතන්න බෑ. ඒ නිසා ඔබගේ මරණය දෙන්නෙකුගේම අවසානයයි, අපි දෙන්නා ජීවත් වුනොත් අනාගතයෙදි හෝ අපිට දරුවන් ලබා ගන්න පුළුවන්. ඒ නිසා මේ දරුවා මරල මස් ආහාරයට අරගෙන අපි දෙන්න මේ කාන්තාරයෙන් එතෙර වෙමු.

මේ අවස්ථාවෙදි මව තමන්ගෙ දරුවා පියා ළඟට යැව්වා. බොහෝ දුක් විඳල පෝෂණය කරපු මේ දරුවා මට නම් මරන්න බෑ කියල පියා නැවතත් මව ළඟට යැව්වා. මේ විදිහට එකිනෙකා වෙතට එහාට මෙහාට යවපු දරුවා ආහාර පාන ආදියක් නැති නිසා නිකම්ම මරණයට පත් වුණා. දරුවගෙ මරණය ගැන හඬා වැළපුන මේ දෙන්නා, ජීවත් වෙන්න වෙනත් ක්‍රමයක් නැති නිසා දරුවගෙ මස් අනුභව කරල ජීවිතය බේර ගෙන කාන්තාරයෙන් එතෙර වුණා.

එතකොට මේ දෙමාපියන් දරුවගෙ මස් ආහාරයට ගත්තෙ සතුටකින් හෝ රස තණ්හාවකින් නෙවෙයි. තණ්හා මාන නැතිව කාන්තාරයෙන් එතෙර වෙලා දිවි බේර ගන්න හිතල ආහාර අනුභව කළා වගේ, භික්ෂුවක් දානය වැළඳිය යුත්තෙ සසර දුකින් එතෙර වෙන්න කය පවත්වා ගැනීමේ අදහසින් මිසක් රස තණ්හා ආදිය බලාපොරොත්තුවෙන් නෙවෙයි.

3. <u>සේනාසන ප්‍රත්‍යවේක්ෂාව</u>

ආවාස, ඇඳ, පුටු, ඇතිරිලි, කොට්ට, මෙට්ට ආදිය සේනාසනවලට අයිති වෙනවා. සැදැහැවතුන් විසින් සාසනය උදෙසා පූජා කළ ඒ සේනාසන පරිභෝග කරන්න ඕන ඉතා පරිස්සමින්. විනෝදය පිණිස එකතු වෙලා රාජ කතා ආදී තිරස්චීන කතා කිරීම සඳහා, පවුකම් කිරීම සඳහා සේනාසන පරිහරණය නොකළ යුතුයි. සීත උෂ්ණ වළක්ව ගන්න, මැසි මදුරුවන්ගෙන්, අව්වෙන්, වැස්සෙන්, සුළඟින්, සර්පාදීන්ගෙන් එන පීඩා දුරු කර ගන්න නොයෙක් අරමුණුවලට යා නොදී චිත්ත ඒකාග්‍රතාවයක ඉඳගෙන වාසය කරන්න සේනාසන පරිහරණය කළ යුතුයි.

4. <u>ගිලන් පස ප්‍රත්‍යවේක්ෂාව</u>

මෙතනදි ගිලන් පස කියල හඳුන්වන්නෙ ලෙඩ රෝග සුව කර ගැනීමට ගන්නා වූ ඖෂධ අෂ්ටපානාදිය. විනෝදය පිණිස, රස විඳීම පිණිස ගිලන් පස බෙහෙත් ආදිය පරිභෝග කිරීම පැවිද්දාට ගැලපෙන්නෙ නෑ. උපන් ශාරීරික ආබාධයන් දුරු කර ගන්න, ඉදිරියේදි ඇති වෙන්න ඉඩ තියෙන රෝග වළක්වා ගන්න ගිලන් පස බෙහෙත් පරිභෝග කළ යුතුයි.

<u>සිවුරු පිළිබඳ දැන ගත යුතු කරුණු</u>

බුදුන් වහන්සේ විසින් පැවිද්දන්ගෙ පරිභෝගය සඳහා සිවුරු 9 ක් අනුදැන වදාරල තියෙනවා. එයින් සංඝාටි (දෙපට සිවුර), උත්තරාසංඝ ☞

(තනිපට සිවුර), අන්තරාවාසක (අඳනය) කියන තුන ප්‍රධානයි. සිවුරු මහ ගන්න කොට තමන්ගෙ ශරීර ප්‍රමාණ අනුව පිළියෙල කර ගන්න ඕන. සාමාන්‍යයෙන් සිවුරක් දිගින් රියන් 5 කුත් පළලින් රියන් 4 1/2 කුත් වශයෙන් තමයි ගන්නෙ. අඳනය දිගින් පස් රියනක් සහ පළලින් රියන් 2 1/2 ක් දිගින් ගැනීම ප්‍රමාණවත්. උස වැඩි හිමිවරුන්ට සහ පොඩි හිමිවරුන්ට තම තමන්ගෙ උසේ ප්‍රමාණයට දිග පළල ගන්න ඕන. කෙනෙක් හිටගෙන අතක් උඩට ඉස්සුවම බිම සිට නැගිච්ච අත දක්වා සිවුරේ උස ගන්න ඕන. උස අඩි 7 ක් නම් පළල 9 ක් විදිහට ගන්න ඕන. හැම වෙලාවෙම උසට වඩා අඩි 2 ක් සිවුරේ පළල තියෙන්න ඕන.

සිවුර මහන කොට කඩ කපල මහගන්න ඕන. ඒ කියන්නෙ කෑලි කඩන්න ඕන. අවම කඩ ප්‍රමාණය 5 ක්. හත් කඩ, පහළොස් කඩ, විසිපස් කඩ, හතලිස් පස් කඩ, හැත්තෑ පස් කඩ, සියක් කඩ, දහස් කඩ වශයෙන් කඩ කපා සිවුරු සකස් කර ගන්න පුළුවන්. තුන් සිවුරම කඩ කපල මහගන්න රෙදි මදි නම්, එකක් හෝ දෙකක් කඩ 5 කට අඩුවෙන් වුනත් සකස් කරගත්තට වරදක් නැති බවත්, සියලු සිවුරුම කඩ නොකපා නොපෙරවිය යුතු බවත් විනයේ සඳහන් වෙනවා.

අළුත් රෙදිවලින් සිවුරු මහන කොට අඳනය සහ තනිපට සිවුර කියන දෙක එක පොටක් වශයෙනුත්, සංඝාටිය දෙපටක් වශයෙනුත් සකස් කර ගන්න ඕන. රෙදි පරණ නම් අඳනය සහ උත්තරාසංඝය දෙපොටක් එන විදිහටත්, සංඝාටිය හතර පොටක් එන විදිහටත්, පාංශුකූල සිවුරුවලින් මහන කොට කැමති ආකාරයටත් සකස් කර ගන්න අනුදැන වදාරල තියෙනවා. සිවුරක් මහන කොට අලංකාරය පිණිස කිසිම මැස්මක් නොකළ යුතු බවත් සඳහන් වෙනවා. අංශකඩය කියන්නෙ වර්තමානයේ බොහෝ පැවිද්දන් පරිභෝග කරන පරිෂ්කාරයක්. ඒක බැනියම්, කමිස ආදී ක්‍රමයට සකස් නොකළ යුතු බව විනයේ සඳහන් වෙනවා.

### සිවුරු රෙදි

සිවුරු සඳහා රෙදි ගන්න කොට වර්ග 6 ක් අනුදැන වදාරල තියෙනවා. අනුජානාමි භික්ඛවේ ඡ චීවරානි ඛෝමං, කප්පාසිකං, කෝසෙය්‍යං, කම්බලං, සාණං භංගං''

''ඛෝම'' කියන්නෙ ඒ නම තියෙන ගස් වර්ගයේ කෙඳිවලින් වියන රෙදි නිසා. කපු නූලෙන් වියන රෙදි කප්පාසික කියලත්, පට රෙදි කෝසෙයිය කියලත් හඳුන්වනවා. ලෝමවලින් වියන ඒවා කම්බල කියලත්, හණවලින් වියන රෙදි සාණ කියලත්, මිශ්‍ර නූලෙන් වියන රෙදි භංග කියලත් හඳුන්වනවා. මේ රෙදි වර්ග 6 සහ ඒවාට අනුලෝම වන වෙනත් රෙදි සිවුරු මහන්න ගන්න පුළුවන්. හිස කෙස්, පියාපත්, ගස්වල සුඹුළු, හම් ආදියෙන් සිවුරු සකස් කිරීම විනයානුකූල නෑ.

### සිවුරේ පැහැය

විනය පිටකයේ මහා වග්ග පාළියේ සිවුරේ පැහැය ගැන මේ විදිහට දක්වල තියෙනවා. න භික්ඛවේ සබ්බ නීලකානි චීවරානි - සම්පූර්ණයෙන් නිල් පාට සිවුරු, න භික්ඛවේ සබ්බ පීතකානි චීවරානි - තනිකර කහ පාට සිවුරු, න භික්ඛවේ සබ්බ ලෝහිතකානි - රතු පාට, න භික්ඛවේ සබ්බ මඤ්ජෙට්ඨකානි - මදටිය පාට, න භික්ඛවේ සබ්බ කණ්හානි - තනිකර කළු පාට, න භික්ඛවේ සබ්බ මහාරංග රත්තානි - පත්තෑයන්ගේ පිටේ



පැහැය, න භික්ඛවේ සබ්බ මහානාම රත්තානි - ඉදුණු කොළවල පැහැය ඇති සිවුරු නොදැරිය යුතුය, යමෙක් දරයි නම් ආපත්ති සිද්ධ වේ. ඒ කියන්නෙ අපත්‍ය හෙවත් ප්‍රත්‍ය වෙන්නෙ නෑ.

සම්පූර්ණ නිල්, කහ, රතු ආදී වර්ණ තථාගතයන් වහන්සේ විසින් ප්‍රතික්ෂේප කිරීමෙන් පෙනී යන්නෙ, සිවුරේ පැහැය මිශ්‍ර වර්ණයක් විදිහට සකස් කර ගත යුතු බව. සිවුර හඳුන්වන්නෙ කාසාය වස්ත්‍රය කියල. ඒක වර්තමානයේ වැරදි ආකාරයට කහ පාට වස්ත්‍රය කාසාය කියල අර්ථ දක්වල තියෙනවා. කාසාය හෙවත් බෙහෙත් විදිහට ගන්න කසාය කවුරුත් දන්න දෙයක්. කොළ, මුල්, පොතු, ගෙඩි ආදිය දමල තැම්බුවම කසාය සකස් වෙනවා. ඒකෙ වර්ණය අඳුරුයි. කසායක තියෙන වර්ණය කාසාය වස්ත්‍රයට ගැළපෙන වර්ණය. සිවුරට කාසාය වස්ත්‍රය කියන නම ලැබිල තියෙන්නෙ ඒ නිසා. ගස්වල පොතු ආදිය තම්බල කසට පෙවූ අර්ථයෙනුත් කාසාය වස්ත්‍රය කියල හඳුන්වනවා. නුග පල වන්නං කියල ඉදුණු නුග ගෙඩියක පැහැය සිවුරේ වර්ණය විදිහටත් අටුවාවල පෙන්වා තියෙනවා.

ලෝකයේ තියෙන නොයෙක් වර්ණ අතරින් මේ කහට පැහැය සිවුරට අරගෙන තියෙන්නෙ ඒකෙ අනුසස් සලකගෙන. සුදු පැහැය තියෙන සිවුරු පරිහරණය කරන්න ගත්තොත් ඉතා ඉක්මනින් කිළිටි වෙනවා. එතකොට නිතර සේදීමේ පළිබෝධය ඇති වෙනවා. ඒ පළිබෝධය නැති බව මේ කහට පැහැයේ එක් ආනිසංසයක්. එක් වරක් පඬු පෙව්වම බොහෝ කාලයක් පවතින නිසා නිතර පඬු පෙවීමේ පළිබෝධය ඇති වෙන්නෙත් නෑ. ඒ තමයි දෙවන ආනිසංසය. සිවුර ලස්සනයි කියල තණ්හා මාන ආදී කෙළෙස් නූපදීම තවත් ආනිසංසයක්. දුරට නොපෙනෙන නිසා අන්තරායන් අඩු වීමත් තවත් ආනිසංසයක්. අඳුරු වර්ණය මදුරුවන්ට අප්‍රිය නිසා මැසි මදුරුවන්ගෙන් ඇති වන හානි අඩුවීම තවත් ආනිසංසයක්. මේ විදිහට බලන කොට කහට පැහැය බොහෝ අනුසස් ඇති නිසා පැවිද්දාගේ සිවුරුවලට ඉතා යෝග්‍යයි.

### පඬු වර්ග

බුදුන් වහන්සේ ජීවමානව වැඩ හිටපු කාලයේ භික්ෂූන් වහන්සේලා ගොම සහ රතු මැටි දිය කරල සිවුරු පඬු ගැහුවා. ඒකෙන් සිවුරු දුර්වර්ණ වුණා. ඒ ගැන තථාගතයන් වහන්සේට දැන්වුවම, අනුජානාමි භික්ඛවේ ඡ රජනානි මූල රජනං පුප්ඵ රජනං ඵල රජනං කියල පඬු පෙවීම සඳහා ගස්වල මුල්, කඳ, පොතු, කොළ, මල්, ගෙඩි කියන වර්ග 6 අනුදැන වදාළා.

විනය අටුවාවේ හලිද්දිං ඨපෙත්වා සබ්බං මූල රජනං වට්ටති - කහ හැර සියලු මුල් ජාතිත්, පතඟි සහ ටියොල් කියන ගස් වර්ගය හැර අනික් සියලු ගස්වල කොටස් පඬු පෙවීම සඳහා ගන්න පුළුවන් බව දක්වා තියෙනවා. ලොත් හා කඩොල් පොතු හැර සියලු පොතු ජාති, සිහින් කසා පත් හා බේරු කොළ හැර සියලු කොළ වර්ග, වනුක් මල් හා කැල මල් හැර සියලු මල් ජාති හා සියලු ගෙඩි වර්ග සිවුරු පඬු පොවන්න යොදා ගන්න පුළුවන්.

**කිවුල්දෙණියේ විජිතනන්ද හිමි**
**නිග්‍රෝධාරාම සේනාසනය, පොල්පිටිය,**
**මැටිකුඹුර, පොල්ගහවෙල**
**071-6839346**


# කල් ගිය කැස්ස, ඇදුම, හතිය සඳහා ප්‍රත්‍යක්ෂ අරිෂ්ටයක්

පරිසරයේ තියෙන දූෂිත බව නිසා ඇති වන කැස්ස, ඇදුම, හතිය කියන රෝගී තත්ත්වයන් මේ වෙන කොටත් සමාජයේ බහුල වෙලා තියෙනවා. කර්ම විපාකයක් විදිහට කර්මජවම ඇති වන ඇදුම, හතිය කියන රෝගී තත්ත්වයන් මනුස්සයන් අතර තිබුණත්, අද වෙන කොට බහුල වශයෙන්ම තියෙන්නෙ මනුස්සයින්ගෙ ප්‍රයෝග විපත්ති නිසා ඇති වෙච්ච මේ වගේ රෝගී තත්ත්වයන්.

විශේෂයෙන් මේ වෙන කොට පොඩි දරුවාගේ පටන් තුන් කුදු මහල්ලා දක්වාම වයස් භේදයකින් තොරව මේ රෝගී තත්ත්වයන් දකින්න පුළුවන්. හැබැයි බහුලවම තියෙන කර්මජ නොවන, ප්‍රයෝග විපත්තිය නිසාම ඇති වෙච්ච රෝගීතාවයන් ඖෂධ ප්‍රතිකාර මගින් සනීප කරගන්න පුළුවන්. ඒත් දැන් තියෙන බොහොමයක් ඖෂධ ප්‍රතිකාර ක්‍රම මගින් මේ රෝගී තත්ත්වයන් නිට්ටාවටම සනීප වීමක් නෙවෙයි වෙන්නෙ, තාවකාලිකව යටපත් වීමක්. විශේෂයෙන් ඇදුම, හතිය ගත්තම තාවකාලිකව හුස්ම ගන්න පහසු වෙන යම් යම් ඉන්හේලර් ක්‍රම වගේම, විවිධ බෙහෙත් නිර්දේශ කිරීමක් තමයි බොහෝ කොටම සිද්ධ වෙන්නෙ. ඉතින් ජීවිත කාලය පුරාවටම ඒවා පාවිච්චි කර කර ඉන්න ඕන.

මේ වගේ අවස්ථාවක වහරක අභයරතනාලංකාර හිමියන් බෙහෙත් සමාධියෙන් මතු කර ගත්, දැනටමත් අත්හදා බලල සාර්ථක ප්‍රතිඵල තියෙන, කිසිම අතුරු ආබාධයක් හෝ වැඩි වියදමක් නැතිව පහසුවෙන් හදා ගන්න පුළුවන් ප්‍රත්‍යක්ෂ අරිෂ්ටයක් තමයි මේ හඳුන්වා දෙන්න යන්නෙ.

මේ සඳහා අවශ්‍ය වෙන්නෙ කැහිපිත්තන් කොළ ග්‍රෑම් 500 යි, නුග පොතු ග්‍රෑම් 500 යි, තල් සූකිරි ග්‍රෑම් 500 යි. හැබැයි මේ අනුපාතය එන විදිහට අමුද්‍රව්‍ය අවශ්‍ය ප්‍රමාණයන්ගෙන් ගන්න පුළුවන්.




ඉස්සෙල්ලම මේ කැහිපිත්තන් කොළ සහ නුග පොතු හොඳට ලියල කොටල අරගෙන ඒකට උණු කර නිවාගත් වතුර ලීටර් 6 ක් දාල, ලීටර් 4 ක් දක්වා අඩු වෙන කල් තම්බ ගන්න ඕන. ඉස්සෙල්ලම ලීටර් 4 ක් භාජනයට දාල ඒ හතරෙ සීමාවෙන් සලකුණක් දාගත්තම, ලීටර 6 - 4 දක්වා හිඳෙනකොට අවශ්‍ය මට්ටම පහසුවෙන් බලාගන්න පුළුවන්. හැබැයි මේ වතුර ප්‍රමාණය කිව්වෙත් ඉහත කිව්ව අනිත් අමුද්‍රව්‍යවල ග්‍රෑම් 500 ක් සඳහා පමණයි. ඒ නිසා ඒ වතුර ප්‍රමාණයත් අනෙක් අමුද්‍රව්‍ය ප්‍රමාණයන් අනුව වෙනස් වෙනවා. උදාහරණ විදිහට ඉහත අමුද්‍රව්‍ය කිලෝ ග්‍රෑම් 1 බැගින් ගත්තොත්, වතුර ලීටර් 12 ක් දාල ඒක ලීටර් 8 ක් දක්වා හිඳෙන කල් තම්බ ගන්න ඕන. ඒ විදිහට තම්බ ගත්තට පස්සෙ එන මිශ්‍රණයේ රොඩ්ඩ මිරිකල පෙරල එන ද්‍රාවණයට තල් සූකිරි එකතු කරන්න ඕන.

ඊළඟට මේ මිශ්‍රණය මැටි මුට්ටියකට දාල රෙදි කැබැල්ලකින් කට බැඳල පැහෙන්න තියන්න ඕන. පැහීමේ කාර්ය පහසු වෙන්න රා මණ්ඩි හෝ වෙනත් මොනව හෝ අරිෂ්ට වර්ගයකින් තේ හැඳි 2-3 ක් විතර දාන්න ඕන. එහෙම නැත්නම් ගුදමක දාල පැහෙන්න තියන්න ඕන. ඒ විදිහට දැඩි අව් රශ්මියක් නැති තැනක දින 21 ක් පැහෙන්න තියන්න ඕන. ඒ කියන්නෙ ගේ ඇතුලෙ හෝ වෙනත් හෙවණ තියන ස්ථානයක තියන්න පුළුවන්. මොකද අව් රශ්මියක් ආවොත් ජලය අසාමාන්‍ය විදිහට වාෂ්ප වෙලා යන්න පුළුවන්. ඒ විදිහට දින 21 ක් ගියාට පස්සෙ නැවතත් පෙරා ගෙන බෝතල්වල අසුරල තියා ගන්න පුළුවන්. ඒ තමයි අරිෂ්ටය. මේ අරිෂ්ටයෙන් දවසකට 3 වරක් මේස හැඳි 2 බැගින් කෑමට පෙර බොන්න ගන්න ඕන. කුඩා දරුවන්ට නම් වරකට තේ හැඳි 2 ක් වුනත් ප්‍රමාණවත්. ඒ විදිහට ගත්තම සාමාන්‍යයෙන් සති 2 කින් විතර වෙනසක් අත්දකින්න පුළුවන්. සනීප වෙනකල් ඒ විදිහට දිගටම ගන්න ඕන.

සටහන:
**නීතිඥ චන්දන සිරිවර්ධන**

## අරි සිතුම් සුව සෙත වෛද්‍ය සායනය

සුගතිය, නිවන පූර්ණ කර ගැනීමේ පහසුව පිණිස ගිලාන ප්‍රත්‍ය කටයුත්තක් වශයෙන්, පූජ්‍යපාද වහරක අභයරතනාලංකාර හිමියන් විසින් බෙහෙත් සමාධියෙන් මතු කරනු ලැබූ බෙහෙත් හා ප්‍රතිකාර ක්‍රම ඇසුරින් කෙරෙන, අරි සිතුම් සුව සෙත වෛද්‍ය සායනය සෑම ඉරිදා දිනකම උදෑසන 7.00 සිට වහරක අරිය චින්තාශ්‍රම බෞද්ධ විහාරස්ථානයේදී පැවැත්වෙන අතර රෝග විමර්ශනය සහ සියලු රෝග සඳහා ඖෂධ ප්‍රතිකාරද කරනු ලැබේ. වැඩි විස්තර සඳහා පහත දුරකථන අංකවලින් විමසන්න. (ගමන් මාර්ගය 32 පිටුවේ දක්වා ඇත.)

0777-193907 / 071-8585621 / 078-4891332 / 077-1620072

# වාස්තු විද්‍යාවේ හේතු ඵල සම්බන්ධය දහම් ඇසින් ....

**12 වන කොටස**

වාස්තු විද්‍යාව කියන්නෙ මහ සංකීර්ණ විෂයක්. ඒ නිසා ඒවායේ මූලධර්ම, ක්‍රම සහ විධි සියල්ලම විස්තර කිරීම කරන්න පුළුවන් දෙයක් නෙවෙයි. නමුත් අද මනුස්සයො හැම පැත්තෙන්ම පීඩාවට පත් වෙලා ඉන්න විදිහ බැලුවම වාස්තු දෝසත් ඒකට එක්තරා හේතුවක් වෙලා තියෙන බව පේනවා. ඒ නිසා යම් පමණකට හෝ ඒ දෝස ඉවත් කර ගෙන, කරදර බාධක දුක් පීඩාවන් අඩුවෙන් ජීවිතය ගෙනියන්න පුළුවන් විදිහට ප්‍රයෝග සම්පත්තියක් වශයෙන් මේ වාස්තු විද්‍යාවේ යම් කිසි කොටසක් දැන ගැනීම වැදගත්. ඒ වගේ පහසුවෙන් ඉවත් කර ගන්න පුළුවන් තවත් පොඩි පොඩි දෝස කිහිපයක් තමයි මේ විග්‍රහ කරන්නෙ. හැබැයි පොඩි පොඩි දෝස වුනත් මේ දෝස කිහිපයක් එකතු වුනාම එන සම්ප්‍රයුක්ත බලපෑම ලොකු එකක් වෙන්න පුළුවන්. ඒ නිසා මේවා ගැන යම් තරමකට හරි දැන ගෙන ඒවා මග හැර ගන්න කටයුතු කිරීම වැදගත්.

වාස්තු කියන්නෙ ගෙවල් දොරවල් විතරක් නෙවෙයි, මනුස්සයො පරිහරණය කරන වතු පිටි, මං මාවත්, ඇඳ පුටු මේස, යාන වාහන ආදී සියලු භාණ්ඩ, ස්ථාන ඇතුළු වස්තු වශයෙන් පරිහරණය කරන මේ සියල්ලම අයිති වෙනවා. වස්තු කියන්නෙ තමන්ට ප්‍රිය මනාප දෙයක්. ඒ කියන්නෙ බාහිර තියෙන ද්‍රව්‍යයක් වස්තුවක් බවට පත් කර ගෙන පාවිච්චි කරන විදිහ. වාස්තු කියන වචනය ඒ විදිහට කිව්වත් ගැලපෙනවා. වාත්තු කිරීම කියන්නෙ යමක් හරියට පිහිටුවීම. මොනව හරි අපවිත්‍ර දෙයක්, අවිධිමත් දෙයක් සුද්ධ පවිත්‍ර කරල විධිමත් කිරීම. වාත්තු කෙරුව වගේ පිහිටල තියෙනව කියන්නෙත් යමක් නියමිත විදිහට ක්‍රමානුකූලව පිහිටල තියෙන කොට. ඒ වගේ ප්‍රතිමා වහන්සේ නමක් වුනත් වාත්තු කරන්න පුළුවන්. ඒ කියන්නෙ මනා ලෙස පිහිටුවන්න පුළුවන් මොනව හරි දෙයක්. එතකොට මනුස්සයො පරිහරණය කරන්න අල්ල ගත්තු වස්තු කාලයක් යද්දී ගෙවෙනවා, කැඩෙනවා, බිඳෙනවා. එහෙම නැත්නම් ඒවා හරියට පිහිටන්නෙ නැතිව යනවා. ඒවා හරි විදිහට පළ දෙන්න නම් නියමිත පරිදි පිහිටුවන්න, වාත්තු කරන්න ඕන. ඒක එක්තරා ප්‍රයෝග සම්පත්තියක්. හැබැයි ඒ ප්‍රයෝග සම්පත්තිය වුනත් කර්ම විපාකවලට යටත්. ඒ කියන්නෙ පිං පවු අනුව ඒවායේ සාර්ථකවීම් අඩු වැඩි වෙනවා. වෙනත් විදිහකින් කියනව නම්, තමන්ට කර්ම ශක්තියෙන්ම අයිති නැති සම්පත්තියක් වාස්තු විද්‍යානුකූලව කෙරුව පළියට ලැබෙන්නෙ නෑ. එහෙම ලැබෙන්න නම් ඒකට පෙර හේතු තියෙන්න ඕන. ඒ නිසා මේ විස්තර කරන කාරණා කර්ම වේගයන්ටත් යටත්ව සිද්ධ වෙනවයි කියන කාරණය තේරුම් ගන්න ඕන.

ගෙවල්වල තියෙන දෝස ගැන කතා කරද්දි, විශේෂයෙන් ගෙයක් ඇතුලෙ ළිං, වළවල් වගේ දේවල් තියෙන්න හොඳ නැති බව මීට පෙරත් පැහැදිලි කළා. ඊට අමතරව ප්‍රධාන දොරට හෝ පැලි දොරට



(පිටුපස දොර) හරියටම එල්ල වෙන විදිහට අඩි 60 ක් ඇතුළත ළිඳක් / වළක් කපන්නත් හොඳ නෑ. ඒ කියන්නෙ දොර කෙළින්ම තියෙන්න හොඳ නෑ. ඒ වගේම ජනේලයක් එල්ල කරලත් ළිඳක් / වළක් කැපීම ඒ තරම් හොඳ නෑ. පොඩ්ඩක් එහාට මෙහාට කරල ගන්න ඕන. කෝණාකාරව ගත්තට ගැටළුවක් නෑ. අංශක 45 න් එහාට නම් වඩාත් හොඳයි. මේ වගේ දෝසයක් ආවොත් ඒ ස්ථානයට සම්බන්ධ අයටත් යන යන තැන බාධක හෙවත් වළවල් එන්න ගන්නවා. වැඩක් කරන්න ගියාමත් වළක් කපපු තැනක් හා සමානයි. වළ කැපෙනව කියන්නෙත් හොඳ දෙයක් නෙවෙයි, විනාසයක්. ඒ දෝසයේ තියෙන හේතු ඵල සම්බන්ධය ඒ විදිහට යම් ප්‍රමාණයකට දැන ගන්න ඕන.

ඒ වගේම ගෙදර වහලෙ මුදුන් යට ලීය දෙපැත්තෙ නෙත්ති දෙකට එල්ල කරල ඒ කෙළින් හිටින්නත් වළවල් / ළිං කපන්න හොඳ නෑ. ඒ විදිහට එල්ල කරල දුරින් අඩි 60 ක් යන කල් ළිඳක් හෝ වළක් කපන්න හොඳ නෑ. (මෙතනදි අඩි 60 ක් කියන්නෙ සාමාන්‍යයෙන් මහ පොළවේ සිට මුදුන් යට ලීයට තියෙන උස වගේ දෙගුණයක්.) වෙනත් විදිහකින් කියනව නම් ගේ උස වගේ දෙගුණයක්. ඒ වගේම ඒ අඩි 60 ට කෙළින් සීමාව ඇතුළට ගිනි පෝරණු, ගඩොල් පෝරණු වගේ දේවල් දාන්නත් හොඳ නෑ. කෙළින් අඩි 60 ක් දුර සීමාව ඇතුළෙ ඒ දෝසය බලපානවා. එහෙම දෝසයක් ආවොත් විශේෂයෙන් ගෙදර ප්‍රධානියගෙ හිසට ඒ දෝසය බලපානවා. මොකද මුදුන් ලීය ප්‍රධාන වශයෙන් සම්බන්ධ වෙන්නෙ ප්‍රධානියගෙ හිසට. ඊට අමතරව ප්‍රධානියා මුල් කර ගෙන ගෙදර අනිත් අයටත් බලපාන්න පුළුවන්.

ඊළඟට ළිඳක් ගිණිකොණ දිසාවට අහු වෙන්නත් හොඳ නෑ. ළිඳෙන් එන ආපෝ හෙවත් ජල ධාතුවට නියම දිසාව තමයි ඊසාන දිග. ගිණිකොණ කියන්නෙ තේජෝ කියන ගිනි ධාතුවට අදාල දිසාව. ළිඳක් ගිණිකොණට අහු වුනාම ගින්නයි ජලයයි එකතු වුණා වගේ. ඒ කියන්නෙ එකිනෙකට විරුද්ධ / සතුරු බලවේග දෙකක්. ඒ වගේ දෙකක් එකතු වුනාම මහ සට්ටනයක්. විශේෂයෙන් ඒ දෝසය ගෙදර ඉන්න අයගෙ ස්නායු ආබාධවලට, අංශ භාගය, දරුවන්ගේ විවිධ මානසික ඌනතා, ශරීරගත විවිධ සෙම් ආබාධ, රක්ත උෂ්ණ විෂමතා ආදියට හේතු වෙන්න පුළුවන්. හැබැයි ඉතින් කර ගන්නම දෙයක් නැත්නම්, ඒ ළිඳ ඉවත් කරන්නම බැරි නම්, ඒ දෝසය එක්තරා ප්‍රමාණයකට කැපෙන්න පුංචි උපක්‍රමයක් යොදන්න පුළුවන්. ඒ තමයි මීට කලිනුත් විස්තර කරල තියෙන සුදු පාට තීරු තියෙන දිගටි පත්‍ර සහිත ශාක වර්ගය ළිඳ වටේට ආවරණය වෙන්න හිටුවීම. ඒ කියන්නෙ ලකී බැම්බු කියන වර්ගයේ සුදු පාට විශේෂය. ඒ වගේම දුටු සතුටු කියන පඳුරු විශේෂය, එහෙම නැත්නම් සුදු මල් පිපෙන වද මල් කියන මේ වගේ දෙයක් වුනත් ඒ වෙනුවට හිටවන්න පුළුවන්. එතකොට අර ජල ධාතුව සහ ගිනි ධාතුව සට්ටනය වන තත්ත්වය සෑහෙන මට්ටමකට සමනය වෙනවා.

ඒ වගේම මාළු ටැංකි වුනත් ගෙවල් ඇතුලෙ හදන්න හොඳ නෑ. දැන් අළුත් ක්‍රමවලට අනුව ඇස්වලට, මනසට හොඳයි කියල ගෙවල් ඇතුලෙ හැදුවත් ඒවායේ නොපෙනෙන පැත්ත ගැන මිනිස්සු දන්නෙ නෑ. මාළු කියන්නෙ දියේ ඉන්න සත්තු. හැම වෙලේම දිය වෙච්ච ගමන් තමයි ඉන්නෙ. ඔළුව කෙළින් නෑ. පැත්ත වැටිච්ච ගමන් හැම වෙලේම තිරස් අතටමයි ඉන්නෙ. මාළු ටැංකි ගේ ඇතුලෙ හදා ගත්තම මිනිස්සුන්ටත් ඒ වගේ ස්වභාවයක් එනවා. මොකද උන්ගෙන් විහිදෙන කිරණ පවා ගේ ඇතුලෙ දුවනවා. ඒවා මිනිස්සුන්ටත් බලපානවා. හැම අතින්ම වැටෙන පැත්ත තමයි තියෙන්නෙ. ඊට අමතරව විශ්වයෙන් එන අත්‍යාවශ්‍ය සුද්ධ කිරණ ගේ ඇතුළට ඇද ගන්නත් බාධා එනවා.

ඊළඟට ප්‍රධාන යට ලීයට සම්බන්ධ වෙන්න පෝරුණුව හදන්නත් හොඳම නෑ. යට ලීයට තියා වහලෙන් එන ලීයකටවත් දුම් වදින විදිහට පෝරුණුවක් තියන්න හොඳ නෑ. ඒ කියන්නෙ වහලෙ ලී, පෝරුණුව ඇතුළට අහු වෙන්න හොඳ නෑ. ඒ නිසා ඒ දෝසය මග හරින්න පෝරුණුව කුහරයක් ආකාරයට කෙළින්ම වහළත් පන්නල උඩට ගන්න ඕන. හැබැයි මුදුන් යට ලීයට වඩා පහතින් තියන එක තමයි වඩා හොඳ. මොකද මුදුන් යට ලීය තමයි මුදුන හෙවත් ප්‍රධානියා. ප්‍රධානියාට වඩා රස්නයක් උඩින් තිබීමත් ගැලපෙන්නෙ නෑ. එහෙම තිබුණොත් ඒක හිසරදයක් වගේ විශේෂයෙන් ගෘහ මූලිකයට බලපානවා. පෝරුණුව ඇතුලතින් යන ලී තියේ නම් ඒවත් කපල ඉවත් කරන්න ඕන. ඒ වගේ දෝස ආවොත් ගෙදර ඉන්න පිරිසටත් දුවිල්ලක්, දාහ ගතියක් එන්න පුළුවන්. ඒ වගේම පෝරුණුවෙ උඩට කොන්ක්‍රීට් තහඩුවක් (ස්ලැබ් එකක්) දානව මිසක්, වෙනම වහළක් ගහන්නත් හොඳ නෑ. මොකද වහළක් ගැහුවොත් ඒකත් ගෙදර වහළක් විදිහට තමයි ක්‍රියාත්මක වෙන්නෙ. එතකොට වහළවල් 2 ක් එනවා. වහළක් වගේ තවත් සැරයක් රත් වෙනවා.

ඒ වගේම ගෙවල් ඉස්සරහට ගේට්ටුවක් / ඉදිකඩක් දාන කොටත් ඒක ගෙදර ප්‍රධාන දොරට / උළුවස්සට ගැලපෙන විදිහට දාන්න ඕන. ඒ කියන්නෙ ඉස්සරහ ප්‍රධාන දොරයි, ගේට්ටුවයි / ඉදිකඩයි එක එල්ලෙම එකට එන්න තියන්න හොඳ නෑ. පොඩ්ඩක් ඒ දෙක එහාට මෙහාට කරල තමයි තියන්න ඕන. එකක සීමාව අනෙකෙ සීමාවට අහු නොවෙන්න පන්නන්න පුළුවන් නම් තමයි වඩා හොඳ. පොඩ්ඩක් හරි ඒ සීමාවට අහු වුනොත් ඒ අහු වෙච්ච ප්‍රමාණයට අනුව දෝසයේ බලපෑම එන්න පුළුවන්. ඒ කියන්නෙ සරල රේඛාවක් ගැහුව වගේ කෙළින්ම උළුවහු දෙකක් / දොරටු දෙකක් තියෙන්න හොඳ නෑ. මෙතනදී ගේට්ටුවයි, ප්‍රධාන දොරයි එක එල්ලෙ වැටුනම ඒ දෝසය ප්‍රධාන වශයෙන්ම බලපාන්නෙ ගෙහිමියාට. එතකොට ගෙහිමියා පිළිබඳ බාහිර මිනිස්සුන්ගෙ අවධානය වැඩි වෙලා ආපදාවන්ට, කරදරවලට ලක් වෙන්න තියෙන සම්භාවිතාව වැඩියි. ප්‍රසිද්ධියේ දකින නිසා හඟවන්න බෑ. සතුරු කරදරවලට ලක් වෙන්න තියෙන ඉඩකඩ වැඩියි. හරියට නිකං අනතුරකට පාර කැපුව වගෙයි. ගෙහිමියාට අමතරව ගෙදර ඉන්න පිරිමි දරුවන්ටත් ඒ දෝසය බලපානවා. ඉතින් ගෙවල්වල දොර ජනෙල්, පිවිසුම් තියන කොට ඒ දෝස එන්නෙ නැති වෙන්න තියන්න ඕන.



ඊළඟට ගේ ඇතුලෙත් එහෙමයි. දොරවල් /උළුවහු දෙකක් එක එල්ලෙ තියන්න හොඳ නෑ. තුනක් එල්ල කරල ආවොත් ලොකුම දෝසයක්. ජනෙල් වුනත් එහෙමයි. හැබැයි විශේෂයෙන් ප්‍රධාන දොරටයි, පැලි දොරටයි තමයි ඒ කාරණය බලපාන්නෙ. ඒ විදිහට හැම වෙලේම දොරට දොරක් එල්ල කරල පේනව කියන්නෙ සියල්ල විවෘතයි. ඒකෙන් එන දෝසයේ බලපෑම තමයි රහස් තියා ගන්න බෑ. වැදගත් දෙයක් හඟවල තියන්න බෑ. ගෙදර රහස් එළි වෙනවා.

ඒ වගේම පිට ඉඳගෙන ගේ ඉස්සරහ පැත්තෙන් බැලුවම අනිත් පැත්ත පේනව නම් ඒකත් දෝසයක්. එකතු කිරීමේ හැඩයට පේනව නම් එතන ආලෝක කතිරය වැටිල දෝසයක් එනවා. ඒ කියන්නෙ ගෙදර ඉස්සරහින් බැලුවොත් පිටිපස්ස පේනවා, වම් පැත්තෙන් බැලුවොත් දකුණු පැත්ත පේනවා. තවත් විදිහකින් කියනව නම් ගෙදර ඉස්සරහයි - පිටුපසයි, වමයි - දකුණයි එකට යා කළාම එකතු කිරීමේ ලකුණෙ හැඩයට කැපෙන තැනක් එනවා. අන්න ඒක තමයි ආලෝක කතිරය. ඒ විදිහට ආලෝකය වැටෙන්න හදල තිබීමත් දෝසයක්. ඒ දෝසයේ ප්‍රතිඵල විදිහට ඒ ගෙදර ජීවනාලෝකය බොහෙම අඩු වෙනවා. මොකද ආලෝකය රැඳෙන්නෙ නෑ. එතකොට කොච්චර මුදල් හරි හම්බ කළත් ඉතිරියක් නෑ, විනාස වෙනවා.

ඒ වගේම මීට කලින් වතාවක් පැහැදිලි කළා වගේ ගෙවල්වල තියෙන මේ දෝස අරින කොටත් නව ගුණ ශාන්තියෙන් හෝ ජල නන්දන පිරිතෙන් හෝ දස දිසා පිරිතෙන් හෝ ඒ වගේ විශේෂ සෙත් ශාන්ති පිරිතකින් හදා ගත්තු තෙල් හඳුන්කූරු ආදිය පත්තු කරල, හඳුන් කුඩු වගේ දෙයක් ඉහල ඒ වගේ දේකින් ආරක්ෂාවක් ක්‍රියාත්මක වන වෙලාවක තමයි ඒ දොස් ඉවත් කරන්න ඕන. එහෙම නැතිව එක පාරටම දොස් අරින්න ගියොත් ඒවායේ බලපෑම තමන්ටත් එන්න පුළුවන්.

ඒ වගේම ගෙදර බාහිර වටපිටාව ගත්තම පිහිටල තියෙන ගස්වැල්වල ස්වභාවය පවා ඒ ගෙදර මිනිස්සුන්ට බලපානවා. විශේෂයෙන් ගෙවල් ඉස්සරහට මුහුණ දාල දෙබල් හෙවත් කරු තියෙන ගස් හිටවන්න හොඳ නෑ. උදාහරණ විදිහට අරලිය කියන්නෙ ඒ විදිහට කරු බෙදී බෙදී යන ගහක්. විශේෂයෙන් ගහක කඳ මැදින් දෙබලක් එන විදිහට බෙදුනොත් සහ ඒ වගේ ගහක් හරියටම ගේ ඉස්සරහට ආවොත් දෝසයක්. ඒ වගේ ගස් ගෙදර ඉස්සරහට අහු වෙන්නෙ නැති වෙන්න වෙනත් පැත්තකට වෙන්න හිටවන්න ඕන. මොකද දෙබල් තියෙන නිසා. හැබැයි ගහ මැදින් නැතිව වෙනත් තැනකින් / අත්තකින් වෙනත් දිසාවකට මුහුණ දාල දෙබලක් තිබීම ගැටළුවක් නෑ. කඳේ හට ගත්ත දෙබල්වලින් තමයි හුඟක් දොස් එන්නෙ. ඒ කියන්නෙ ගේ ඉස්සරහට ලම්භකව තමයි දෙබලක් එන්න හොඳ නැත්තෙ. ගහක් හිටෙව්වට පස්සෙ ඒ වගේ දෙබල් එනව නම් උපක්‍රමශීලීව කප්පාදු කරල ඒ දෝසය ඉවත් කර ගන්න කටයුතු කරන්න ඕන. එතකොට මේ වගේ දෝසයකින් එන බලපෑම තමයි, යන යන තැන දෙබලක් හට ගැනීම. ඒ කියන්නෙ බාධකයක්. වැඩක් කරන්න ගියාම දෙබලක් තියෙනව කියල කතාවටත් කියනවා. ඕනම කටයුත්තකට ගෙදරින් පිට වෙන්න තියෙන ප්‍රධාන දොරටුව ඉදිරිපිටට ඒ වගේ දෙබල් සහිත ගහක් ආව ගමන් තමන්ගෙ වැඩ කටයුතුවලටත් දෙබලක් එනවා. ඒකෙන් දොස් එනව කියල ඕන තරම් අත්දැකීන්න තියෙනවා.

ඊළඟට සමහරු කලාවක් ☞

විදිහට, ලස්සනයි කියල සමහර ගස් ගැට ගහනවා. ඒ කියන්නෙ ගහ ළපටි කාලෙදි වැළක් වගේ අඹරවල අස්සෙන් අරගෙන ගැටයක් දානවා. එතකොට ගහ ලොකු වුනාම එතැන මහ ගැටයක්. නමුත් ඒක මහ දෝසයක්. හරි භයානකයි. ඒ දෝසය නිසා ගෙදර උදවියට සර්ප දෂ්ඨ කිරීම් හෝ වෙනත් මොනව හරි හදිසි අනතුරු වෙන්න පුළුවන්. විශේෂයෙන් ගෙදර ප්‍රධානියාට. ඒ දෝසය නිසා සර්පයින්ගෙ මොනව හරි ආකර්ශනයකුත් එනවා. හැබැයි සමහර උදවිය ගස්වල ගෙඩි හැදෙන්න කියල රෑනකින් ගහ වටේට වෙලීම මේ දෝසයට අහු වෙන්නෙ නෑ. මේ කියන්නෙ ගහෙන්ම ගැටයක් දැමීම නිසා එන දෝසයක්. මේ සම්බන්ධයෙන් වහරක අභයරතනාලංකාර හිමියන්ට ගිහි කල අත්දකින්න ලැබිච්ච සිද්ධියක් මේ විදිහට පැහැදිලි කළා.

''මම දන්න අපේ ගමේ එක්තරා මනුස්සයෙක් සිහිසුන් වෙලා ඉඳල පසුව හොඳ වෙලා අන්තිමට සර්පයෙක් දෂ්ට කරල මළා. කාලයක් යද්දි ඒ ගෙදර ළමයි සියලු දෙනාම හදිසි අනතුරුවලින් අකාලෙ මළා. ඒ විතරක් නෙවෙයි මුළු පවුලම ඉවර වුණා. ගෙදර බිරිඳ විතරයි අන්තිමට ඉතුරු වුණේ. මේ කාරණය ගැන හොයල බලද්දි මට සමාධියට ගෝචර වුණා මෙන්න මෙහෙම දෝසයක් බලපාල තියෙන බව. ඒ කියන්නෙ ඒ ගෙදර ඉස්සරහ අඹ ගහක් පොඩි පැළය කාලෙදිම රවුමක් දාල අඹරවල ගැට ගහල තිබුණා. ඒ ගහ එහෙම්ම ලොකු වුණා. අන්තිමට මහ ගැටයක් හැදුණා. ඒ දෝසය ඒ ගෙදර උදවියටත් බලපෑවා. හැබැයි ඒ ගෙදර අය ඒක දැන ගෙන හිටියෙ නෑ.''

ඒ වගේම ගෙවල් ඉස්සරහ, විශේෂයෙන් දොරකඩට කෙලින්ම වැටෙන්න රෝස, දෙහි, දෙළුම්, පතොක්, වැටකෙයියා වගේ කටු සහිත ගස් හිටවන්නත් හොඳ නෑ. ඒ වගේ ගස් පුළුවන් තරම් පැත්තකට වෙන්න තමයි හිටවන්න ඕන. ඒ වගේම ජනේලයක් ඉස්සරහටත්, පැලි දොරටත් කෙලින්ම අහුවෙන්න හිටවන්නත් ඒ තරම් හොඳ නෑ. විශේෂයෙන් ඉස්සරහ ප්‍රධාන දොරට සහ පැළි දොරට ආවොත් තමයි ඒ දෝසය ලොකුවට බලපාන්නෙ. ඒකෙන් එන දෝසය තමයි කටුක ජීවිත ගත කරන්න සිද්ධ වීම.

එතකොට මේ කියන රෝස, දෙහි වගේ කටු සහිත ගස් ගෙවල් ඉස්සරහින් අහක් කරන්නම බැරි නම්, ඒවා වැහෙන්න දොරටුවත් ඒ කටු ගසුත් අතරට සමන් පිච්ච වැලක් හිටෙව්වම ඒකෙන් එන දෝසය සෑහෙන මට්ටමකට කැපෙනවා.

එහෙම නැත්නම් අර කලින් කියපු සුදු පාට පටි තියෙන ලකී බැම්බූ, දුටු සතුටු, සුදු වද මල් වගේ දෙයක් හිටවන්නත් පුළුවන්. ඒවායේ නම් ගත්තත් හොඳ අර්ථයක් කිය වෙනවා. ලකී කියන නම දාල තියෙන්නෙත් මොකක් හරි වාසනා ගුණයක් තියෙන නිසා. දුටු සතුටු කියන්නෙ දැක්ක ගමන් සතුටු වීම.

ඒ වගේම අද ඉස්සර වගේ නෙවෙයි, ලස්සනට කියල නොයෙක් වෙවර්ණ තියෙන විචිත්‍රවර්ණ මල් ගස් ගෙනත් හිටවීමත් දකින්න තියෙන දෙයක්. ඒවායේ වාස්තු විද්‍යානුකූල සුදුසු නුසුදුසු බව අඳුනන්නෙ නෑ. නමුත් සමහර මල් වර්ග ගෙවල් ඉස්සරහ හිටවන්න හොඳ නෑ. විශේෂයෙන් යකා මල් හෙවත් රාස්ස මල්






කියන විශේෂය සුදුසුම නෑ. ඒ මල් පිපුනොත් ගෙදර ඉන්න අය නිකරුනේ රණ්ඩු වෙනවා, කා කොටා ගන්නවා, ඇවිස්සෙනවා. මොකද ඒ මල්වලට අමනුස්ස ආකර්ශනයකුත් තියෙනවා. ඒ නිසා වත්තකවත් හිටවන්න සුදුසු නෑ. ඒ මලත් කළු පාටයි. රැවුල් වගේ රැන් රැන් එල්ලෙනවා. කොළයි මලුයි දෙකම කළු පාටට තියෙන වර්ගයකුත් තියෙනවා. කළු පාට කොහොමත් ගැලපෙන්නෙ නෑ. කිඩාරම් මලත් ඒ වගේ. ගෙයක් පැත්ත පළාතෙවත් තියන්න හොඳ නෑ. ඒකෙන් එන ගන්ධය අමනුස්සයින්ට ආහාරයක්. ඒ නිසා විශේෂයෙන් ගැලපෙන්නෙ සුදු පාට මල් පිපෙන සමන් මල්, පිච්ච මල්, සඳුන් වගේ ගස්. ගෙදර පිටු පසටත් සමන් පිච්ච වැලක් විශේෂයෙන් හොඳයි.

ගෙවල් ඉස්සරහ හිටවන්න හොඳ නැති තවත් ගස් ජාතියක් තමයි රත් කෙසෙල්. රත් කෙසෙල් විශේෂයෙන් ගන්නෙ ලේ සම්බන්ධ කාලි යක්ෂණියගෙන් කර ගන්න වැඩ කටයුතුවලට. මහ සොහොන්, රීරි යක්ෂ ආදී කොට්ඨාසත් ඒවට සම්බන්ධ වෙනවා. සොහොන්, ලේ කාලි සම්බන්ධ කරල ගන්න ගුරුහරුකම්වලට හුඟක් වෙලාවට රත් කෙසෙල් යොදා ගන්නවා. ඒ නිසා ඒ වගේ දෙයක් ඇතින් හිටවනව මිසක් ගෙවල් ඉස්සරහට ගන්න හොඳ නෑ. ඒ කාරණය පැරණි ජන කතාවලත් එනවා. ඊට අමතරව, විශේෂයෙන් කතා කරන කොට අගට කෙසෙල් කියන වචනය ස්වභාවයෙන්ම එන කෙසෙල් වර්ගත් ගෙවල් ඉස්සරහ හිටවන්න හොඳ නෑ.

උදාහරණයක් විදිහට ඇඹුල් කෙසෙල්, අළු කෙසෙල්, සීනි කෙසෙල්, ඇට් කෙසෙල් කියන කොට ස්වභාවයෙන්ම අගට කෙසෙල් කියන වචනය යොදල තමයි කතා කරන්නෙ. නමුත් කෝලි කුට්ටු, සුවඳැල්, හොරණමාළු, ආනමාළු, ඇම්බුං කියන කෙසෙල් වර්ග හඳුන්වන කොට ඒවා අගට කෙසෙල් කියන වචනය යොදල කතා කරන්නෙ නෑ. ඒ වගේ ගස් ගෙවල් ඉස්සරහ තිබුණට ගැටළුවක් නෑ. ඒ වගේම සුදු කොච්චි කියන කොටත් කෙසෙල් කියන නම දාල කතා කරන්නෙ නෑ. නමුත් ඒවත් රත් කෙසෙල්වලින්ම තමයි හැදෙන්නෙ. එකම වර්ගය හැදුනට පස්සෙ වෙනස් වෙනවා. ඒ සුදු කොච්චි ගත්තම කෙහෙල් කැනත් රත් කෙසෙල්වලට වඩා ලොකුයි. ඒ සුදු කොච්චි කියන වර්ගයත් ගෙයක් ඉදිරිපිට තිබුන කියල ගැටළුවක් නෑ.

දැන් එතකොට මේ වාස්තු දෝස ගත්තම බුදු දහමේ එන සූවිසි පට්ඨානය තුළින් ඒ සියල්ලම පහදන්න පුළුවන්. හේතු ප්‍රත්‍යය, ආරම්මණ ප්‍රත්‍යය, අධිපති ප්‍රත්‍යය, ආසේවන ප්‍රත්‍යය, උපනිශ්‍රය ප්‍රත්‍යය, නිශ්‍රය ප්‍රත්‍යය, සමනන්තර ප්‍රත්‍යය, අනන්තර ප්‍රත්‍යය ... ආදී වශයෙන් කියන ප්‍රත්‍ය 24 මේ හැම එකකටම සම්බන්ධයි. හරියට දැන ගත්තොත් මේ හැම එකක්ම බලපාන හැටි සූවිසි පට්ඨානයෙන්ම පහදන්න පුළුවන්. හැබැයි ඒක 100% ක්ම පහදනව කියන්නෙ බොහොම ගැඹුරු අතිසියුම් දෙයක්. මේ ප්‍රත්‍ය 24 ට කොටු නොවෙච්ච එකක් ලෝකය තුළ නෑ. ලෝකය තුළ තියෙන අපි පරිහරණය කරන හැම එකක්ම ඔය ප්‍රත්‍ය 24 ට කොටු වෙලා තියෙන්නෙ. ලෝකෙන් එතෙර තියෙන ලෝකෝත්තර වූ නිවන විතරයි ඒකට අහු වෙන්නෙ නැත්තෙ.

සටහන:
**නීතිඥ චන්දන සිරිවර්ධන**

# හෙළ බොදු පියුම දහම් සඟරාවේ 52 වන කලාපය සඳහා ශ්‍රමය හා මූල්‍යමය දායකත්වය සැපයූ පිංවතුන්

**ශ්‍රම දායකත්වය -**

♦ ධම්මික සේනාධීර මහතා - නෙක්මෝ කම්පියුටර්ස් ආයතනය - මාලබේ ♦ අසංග මංජුල කුමාර මහතා - හෝමාගම ♦ අමිත් සමරනායක මහතා - බෙල්ලන්තර ♦ චන්දන සිරිවර්ධන මහතා - අලපලාදෙනිය ♦ චතුර හිඳුරංගලගේ මහතා - නුගේගොඩ ♦ චිත්‍ර ශිල්පී එස්. එම්. ජයසේකර මහතා - මාලබේ ♦ ෆික්රි ඉස්මයිල් මහතා - ගොතටුව ♦ සමන් සිල්වා මහතා - කළුතර ♦ අතුල ජයතුංග මහතා - අතුරුගිරිය ♦ දර්ශන පෙරේරා මහතා - පිළියන්දල ♦ සුරාජ් වර්ණකුලසූරිය මහතා - දංකොටුව ♦ කැළුම් ලංකේශ්වර මහතා - ගාල්ල ♦ පර්ෆෙක්ට් කම්පියුටර් ආයතනයේ කාර්ය මණ්ඩලය - පිටකෝට්ටේ ♦ ඉමාෂි මුද්‍රණාලයේ අධිපතිතුමා ඇතුළු කාර්ය මණ්ඩලය ♦ නන් අයුරින් දායක වූ පින්වතුන්.

**මූල්‍යමය දායකත්වය -**

♦ ප්‍රියනාත් ආරියරත්න මහතා ඇතුළු පවුලේ සැම - කුරුණෑගල - රු. 50,000/- ♦ ආසිරි වනිගරත්න මහතා සහ දීපිකා සන්දනායක මහත්මිය ඇතුළු පවුලේ සැම - මහරගම - රු. 25,000/- ♦ චතුර හිඳුරංගලගේ මහතා, නදීරා අරම්පොල මහත්මිය, තනුරි හිඳුරංගලගේ සහ සනුරි හිඳුරංගලගේ දියණියන් - නුගේගොඩ - රු.10,000/- ♦ සමන් සිල්වා මහතා - කළුතර - රු. 10,000/- ♦ තුසිත නාකන්දල මහතා, සරූපා නාකන්දල මහත්මිය, දෙවින්යා දුව - ගල්කිස්ස- රු. 10,000/- ♦ අමිත් හඳුගොඩ මහතා ඇතුළු පවුලේ සැම - අත්තිඩිය - රු. 5,000/- ♦ ගයාන් පුෂ්පික ඉන්ද්‍රජිත් ලොකුමාන්න මහතා, හිරෝෂානි ලොකුමාන්න මහත්මිය, සෙනුත් ලොකුමාන්න පුතා - ගල්කිස්ස - රු.5,000/- ♦ සොනාලි සමරදිවාකර මෙනවිය - මහරගම - රු.5,000/- ♦ සුහාෂ් රණසිංහ මහතා - මගලෙගොඩ - රු. 5,000/- ♦ අමිල සල්ගාදු මහතා - බෝමිරිය - රු. 5,000/- ♦ එනුක මෙන්ඩිස් පුතා - මොරටුව - රු.5,000/- ♦ කේ.කේ. නන්දනී මහත්මිය - තිහගොඩ - රු. 5,000/- ♦ දෙව්රංගි වීරසිංහ මහත්මිය - නුගේගොඩ - රු.4,000/- ♦ ඩබ්. එම්. ගුණතිලක මහතා - නිකවැරටිය ♦ කරගම්පිටිය ශාස්ත්‍රානන්ද පිරිවෙන් විහාරස්ථානයේ සදහම් වැඩසටහනට සහභාගි වන පින්වතුන් - රු. 3,000/- ♦ ජනක හපුආරච්චි මහතා ඇතුළු පවුලේ සැම - ගිනිගත්හේන - රු. 3,000/- ♦ කේ.එම්. සමන්ත ප්‍රදීප් මහතා - කඹුරුගමුව, මාතර - රු. 3,000/- ♦ ටී.ටී.පී. සිල්වා මහත්මිය - නාගොඩ කළුතර - රු.2,500/- ♦ ඩබ්. ප්‍රේමවතී මහත්මිය සහ ඩබ්.ඒ. නලින සේකර මහතා - වළල්ලාවිට - රු. 2,500/- ♦ දේශිකා වික්‍රමසිංහ මෙනවිය ඇතුළු පවුලේ සැම - කොළඹ - රු.2,500/- ♦ ස්වර්ණා ජයසේකර මහත්මිය - බේරුවල – රු. 2,500/- ♦ ගුණපාල ඉද්දගොඩ මහතා ඇතුළු පවුලේ සැම - විජේරාම - රු. 2,000/- ♦ ඔස්ටින් ප්‍රනාන්දු මහතා සහ සිසිර සිරිවර්ධන මහතා ඇතුළු පවුලේ සැම - පොල්ගහවෙල - රු. 2,000/- ♦ ඩබ්. උපුල් පරාක්‍රම සිල්වා මහතා - මාරවිල - රු.2,000/- ♦ ෂෙහානි බස්නායක මහත්මිය - මත්තෙගොඩ - රු. 2,000/- ♦ ජයනාත් සුහසිංහ මහතා - හෝමාගම - රු.2,000/- ♦ මහේෂ් විජේසුන්දර මහතා - මොරටුව - රු.2,000/- ♦ එස්.ජී.ඒ. සිසිලිනා හාමිනේ උපාසිකා මාතාව සහ ඩබ්.ජී. ගාමිණී වික්‍රමසිංහ මහතා - කන්තලේ - රු.2,000/- ♦ ටී.ඩී. දෙනවක මහත්මිය - පාරමුල්ල - රු. 2,000/- ♦ ජනිඳු බිම්සර පුතා - බාඳුරාගොඩ - රු.2,000/- ♦ දමයන්ති ලියනගේ මහත්මිය ඇතුළු පවුලේ සැම - කිඹුලපිටිය - රු.1,730/- ♦ අයිරාංගනී තිලකරත්න මහත්මිය - නාවල - රු. 1,500/- ♦ ඩී.ඩී. විතාරණගේ මහතා ඇතුළු පවුලේ සැම - නුගේගොඩ - රු.1,500/- ♦ තිලානි ද සිල්වා මහත්මිය සහ හේමාල් ද සිල්වා මහතා - මොරටුව - රු.1,500/- ♦ ඩබ්. චන්ද්‍රරත්න මහතා ඇතුළු පවුලේ සැම - පාදුක්ක - රු.1500/- ♦ ජී.කේ. සිසිර කුමාර සමරදිවාකර මහතා - එල්ලක්කල - රු.1,010/- ♦ පී. රුවිනා දීපානි මහත්මිය ඇතුළු පවුලේ සැම - පිටකෝට්ටේ - රු.1,000/- ♦ කේ. ඒ. ජයරත්න මහතා ඇතුළු පවුලේ සැම - පොල්ගස්ඕවිට - රු.1,000/- ♦ මෝක්ෂර තිලකසිරි පුතා - බැලුම්මහර - රු.1,000/- ♦ ඕෂිනී පෙරේරා මහත්මිය සහ නමින්ද ලියනගේ මහතා - නුගේගොඩ - රු.1,000/- ♦ ශ්‍යාමල් බණ්ඩාර මහතා - කුරුණෑගල - රු. 1,000/- ♦ එරංග ලියනගේ මහතා සහ බිසන්තිකා ගුණසේකර මහත්මිය - කළුබෝවිල - රු.1,000/- ♦ ක්‍රිෂාන්ත ප්‍රියමධු මහතා - කළුබෝවිල - රු.1,000/- ♦ නිහාල් ලියනගේ මහතා සහ චිත්‍රා ග්‍රේරු මහත්මිය - කළුබෝවිල - රු. 1,000/- ♦ ගාමිණී ලියනගේ මහතා සහ නයෝමි තරංගා ලියනගේ මෙනවිය - නැදිමාල - රු.1,000/- ♦ අමිත් සමරනායක මහතා - බෙල්ලන්තර - රු. 1,000/- ♦ රසිකා මඩුගල්ල මහත්මිය - නුගේගොඩ - රු.1,000/- ♦ අශ්වින් චාමර මහතා, නදීරා මහේෂි මහත්මිය සහ දිසුලි අයංසා දියණිය - කළුබෝවිල - රු.1,000/- ♦ එස්. ප්‍රසන්න ප්‍රියදර්ශන සිල්වා මහතා - ගල්කිස්ස - රු. 1,000/- ♦ සී.එම්.පී.සී. ලක්රුවන් මහතා - කළුතර - රු. 1,000/- ♦ සිරිමල් වේරගම මහතා - යොවුන්ගම - රු.1,000/- ♦ අසංග සෙනරත් අඹගල මහතා - රදාවාන - රු. 1,000/- ♦ අමිල බාලසූරිය මහතා - ඉහළ උඩුගම්පල - රු.1,000/- ♦ ඒ. විල්සන් පෙරේරා සහ එම්. කල්‍යාණි පෙරේරා යන දෙපළට පිං පිණිස නිරංජලා අමරතුංග මහත්මිය - තලපත්පිටිය - රු. 1,000/- ♦ කුමාරි විජේකෝන් මහත්මිය - මීනුවන්ගොඩ - රු.1,000/- ♦ ජී.ඩී.ඩබ්ලිව්. සෝමරත්න මහතා - පයාගල - රු. 1,000/- ♦ සමරා ගජනායක මහත්මිය - කහතුඩුව - රු.1,000/- ♦ ඩී.ඒ. රේණුකා කුමාරි ප්‍රියදර්ශනී මහත්මිය - පඬුවස්නුවර - රු.1,000/- ♦ විමල් ගුණතිලක මහතා - පිට්පන - රු.1,000/- ♦ එල්.එස්. හෙට්ටිආරච්චි මහත්මිය - තල්දූව - රු.1,000/- ♦ කමල් වික්‍රමසිංහ මහතා ඇතුළු පවුලේ සැම - කොළඹ - රු.1,000/- ♦ ෂවීන් ශ්‍රී ජයවර්ධන පුතා ඇතුළු පවුලේ සැම - මාලබේ - රු.1,000/- ♦ පී.ඩී. නයනි නිරෝෂිකා මහත්මිය - මීගොඩ - රු.1,000/- ♦ ජී. ජයලත් මහතා - නියඳගල - - රු.1,000/- ♦ නන්දාවතී විතාරණ මහත්මිය - හ/දකුණු කණුමුල්දෙණිය - රු.1,000/- ♦ නදීෂා හර්ෂනී ගොඩගේ මහත්මිය සහ ජනක චමින්ද මහතා - අත්තිඩිය - රු.1,000/- ♦ හසිත දන්තනන්ගොඩ මහතා සහ ලොමෙත් රන්සිටු පුතා - රු.1,000/- ♦ ඩබ්. සුරාජ් ටෝනි මහතා - වැල්ලව - රු.1,000/- ♦ නෙරුන් කල්පජිත් මහතා - තලම්මහර - රු.1,000/- ♦ ඩිලානි ඩයස් මහත්මිය - නාවින්න - රු.1,000/- ♦ චන්දිම ජයසංඛ මහතා - දොම්පෙ - රු.1,000/- ♦ චාන්දනී කළුපහන මහත්මිය - අම්බලන්ගොඩ - රු.1,000/- ♦ ශ්‍රියාන් සමරරත්න මහතා සහ ශෙවාන්ති සමරරත්න මහත්මිය - මොරටුව - රු.1,000/- ♦ සෝමා වික්‍රමසිංහ මහත්මිය - යක්කල - රු. 1,000/- ♦ කොල්ලුපිටිය හේමාස් ආයතනයේ ගයාන් අගලවත්ත මහතා සහ මැණික් කුරුප්පු මහත්මිය, තිස්ස බී අතාවුද මහතා ඇතුළු පවුලේ සැම - ජා ඇල, එම්.ඩී. තිලකරත්න මහතා ඇතුළු පවුලේ සැම - වැලිපැන්න, රංජිත් වික්‍රමසිංහ මහතා, ☞

පද්මාවතී වික්‍රමසිංහ මහත්මිය, සුභාෂිනී දිසානායක මහත්මිය, ඩබ්. ආර්. ගුණතිලක මහතා සහ මහත්මිය - කඩිගමුව, උපුල් විජේනායක මහතා - මාවනැල්ල, මනෝජ් ජයසූරිය මහතා - මහරගම, ඉසුරු සම්පත් මහතා - කළුතර, චන්දිම ගුණදාස මහතා - මොරටුව, දුමින්දා සංජීවනී මහත්මිය, නයෝමි කෞෂල්‍යා මෙනවිය - නිට්ටඹුව, කුමාරි ගොඩවිට මහත්මිය, - කුරුණෑගල, යමුනා උඩුමලගල මහත්මිය - පිළියන්දල, රසික තුශාන්ත මහතා - හෝමාගම, චතුර මල්වාන මහතා - කෑගල්ල, සුසන්ත, ජානක, කාවින්ද, අමිත් යන මහත්වරුන් - පන්නල, කේ.ඩී. සුනේත්‍රා මහත්මිය සහ කේ.ඩී. කල්‍යාණවතී මහත්මිය - මීගොඩ, ඩබ්.එම්. අනුරාධා විජේසුන්දර මහත්මිය - මොරටුව, වෛද්‍ය ජයරත්න අබේකෝන් මහතා - හබරකඩ, සුනේත්‍රා දමයන්ති මහත්මිය ඇතුළු පවුලේ සැම, ශ්‍රියාලතා ජයතුංග මහත්මිය - කිදෙල්පිටිය, නයනමාලි සමරවීර මහත්මිය - ගිරිඋල්ල, අනුරාධ ජී.ටී. ගම්වර මහතා - බත්තරමුල්ල, ඩබ්.එම්. චන්ද්‍රසිරි විජේරාජ මහතා - කරඳවැටිය. - එකතුව - රු. 9,900/- එකතු වූ සියලු මුදල් පරිත්‍යාග- රු. 241,070/- ♦ පළමු පිටපත් 10000 සඳහා මුද්‍රණ වියදම රු. 232,500/- ♦ අනෙකුත් වියදම් - 56,510/- ♦ සම්පූර්ණ වියදම - රු. 289,010/- මුද්‍රණ කටයුතු සඳහා ගිය හිඟ මුදල සඟරා අලෙවියෙන් පියවා ගන්නා ලදී. සඟරා අලෙවියෙන් ලැබෙන ඉතිරි සියලු මුදල් නැවත මුද්‍රණ කටයුතු ඇතුළු දහම් කටයුතු සඳහා යොදවනු ලැබේ.

**ඉහත නම් සඳහන් පිංවත් පිරිස ඇතුළු ආධාර උපකාර කළ සියලු දෙනා සිදු කරගත් මේ පුණ්‍ය කුසල ආශිර්වාද හේතු කොටගෙන, අනන්ත සසරේ පටන් මේ දක්වා තම තමන් අතින් අවැඩ, අසාධාරණ, වැරදි, ප්‍රමාද දෝෂවලට ලක් වූ සියලු දෙනාට මෙන්ම උදව් උපකාර කළ සැමටත්, මියගිය සතර වරිගයක ඥාති මිත්‍රාදීන්ටත් මේ පුණ්‍ය කුසල ආශිර්වාද විහිදී පැතිරී පිහිටා සුඛිත මුදිත වෙත්වා, සුගතිගාමීව තම තමන්ගේ පැතුම් පරිදි නිර්වාණාවබෝධයටද හේතු වාසනා වේවා! එම ආධාර උපකාර කළ පිංවත් පිරිස් ඇතුළු සිය පවුල්වල සැමටත්, කරන කියන යහපත් රැකී රක්ෂා ව්‍යාපාර ආදියෙන් සියලු ජයග්‍රහණයන් අත් වේවා. දූ දරුවන්ගේ අධ්‍යාපන ආදී කටයුතුවලින් විශිෂ්ඨ ජයග්‍රහණ අත් වී සුචරිත පිරිසක් වී සියලු අභිවෘද්ධිය උදා වේවා!**

## සියවස් ගණනාවකට පෙර සැඟව ගිය නිමල බොදු මග යළි පුබුදුවමින්,

**හෙළ බොදු පියුම දහම් කරුණු ඔබ වෙත රැගෙන එන්නේ, බුදු පියාණන් වහන්සේ අනුදැන වදාළ, අග්ගඤ්ඤ සූත්‍රය, නිරුක්තිපථ සූත්‍රය සහ අරණවිභංග සූත්‍රය යන සූත්‍රාන්තයන්ට අනුව, දහම් පදවල සැඟවුණු දහම් අරුත් මතු කරන පද නිරුක්ති සහ අතීතය, වර්තමානය, අනාගතය හඟවන තුන්කල් නිරුක්ති සහිත ව්‍යවහාර ශබ්ද නිරුක්ති ක්‍රමවේදය අනුව මිස, උන්වහන්සේ අනුමත නොකළ ලිඛිත භාෂා රීති සහිත බමුණන්ගේ ත්‍රිවේද නිරුක්ති මත නොවන බව සලකන්න.**

**පින්වත් ඔබ වෙනුවෙන් එළි දැක්වූ දහම් ගබඩාවන්...**

www.hiddendhamma.net mp3.hiddendhamma.net www.helabodhupiyuma.net www.aaryadharma.org
විද්‍යුත් ලිපිනය: webmaster@helabodhupiyuma.net දු.අ:- 071 3046895 / 036-2267111 / 072 7076688

**දම් සභා ගුවන් හඬ** - www.waharaka.com වෙබ් අඩවිය ඔස්සේ පුර සහ අමාවක පොහොය දිනයන්හි උදෑසන 8.00 සිට සවස 5.00 දක්වා

**සැඟවුණු බොදු මග යළි විවර කරමින් වහරක අරිය චින්තාශ්‍රම බෞද්ධ විහාරස්ථානයේ සදහම් වැඩසටහන් පැවැත්වෙන කාල හෝරාවන්:**

සැම පුන් පොහෝ දිනකම සහ සැම අමාවක පොහොය දිනකම උදෑසන 8.00 සිට සවස 5.00 දක්වා - පෙහෙවත් සමාදානය, දහම් සාකච්ඡා සහ විශේෂ පුණ්‍යානුමෝදනාව. සැම මසකම 1 වන සහ 3 වන සෙනසුරාදා ආශිර්වාද පූජාව. 2 වන සහ 4 වන සෙනසුරාදා භාවනා වැඩසටහන්

**ගමන් මාර්ගය: නිට්ටඹුව - රුවන්වැල්ල ප්‍රධාන මාර්ගයේ ගෝණගල්දෙනිය හන්දියේ සිට වහරක අතුරු මාර්ගයේ මීටර 350 ක් පමණ දුරින් දකුණු පස.**

## හෙළ බොදු පියුම දහම් සඟරාවේ පසුගිය කලාපයන් ඇතුලු සියලු කලාපයන් දැනට ලබාගත හැකි ස්ථාන:

1. ඩී. සී. ආර්. ඇක්සස් මුද්‍රණාලය - 33, තලවතුගොඩ පාර, පිටකෝට්ටේ
2. තෙක්මෝ කම්පියුටර්ස් ආයතනය - මාලබේ. (0714220558 / 0112744308)
3. නිව් පියුමි කොමිනිකේෂන් - පීරිස් මාවත, කළුබෝවිල - 0773742023
4. පිනැකල් නෙට් - ශානි ඉන්ස්ට්ටියුට් - හයිලෙවල් පාර, ගොඩගම
5. සුජය ෆාමසි - කටුබැද්ද හංදිය, මොරටුව.
6. පෝලර් රීජන්ස් 402 සී, ගාලු පාර, පානදුර 038-2235369
7. සරසවි පොත්හල - 330/ඒ, ගාලුපාර, අළුත්ගම - 0773474081
8. ලසන් ට්‍රේඩ්සෙන්ටර් - 8, අලුත්ගොඩ පාර, තිස්සමහාරාමය - 0718523556
9. පත්මසිරි ස්ටෝර්ස් - මුරුතමුරේ (පන්සල අසල) හක්මන - 0718149714
10. යාපා ටෙක්ස් (සීබ්‍රා ඇපරල්ස්) - 150, නව ආර්ථික මධ්‍යස්ථානය, කෑගල්ල. - 0714569500, 035-3222220
11. නුගේගොඩ නාලන්දාරාම විහාරස්ථානයේ සදහම් වැඩසටහනින් (ඉරිදා උදේ 9.00 සිට සවස 2.00 දක්වා පමණි.) (0773742023)
12. දෙහිවල කරගම්පිටිය ශාස්ත්‍රානන්ද පිරිවෙන් විහාරස්ථානයේ සදහම් වැඩසටහනින් (සෙනසුරාදා උදේ 8.30 සිට
13. තුෂාරා ෆැෂන් - හයිලෙවල් පාර, හෝමාගම.
14. තුෂාරි සාරි සෙන්ටර් - කොළඹ පාර, පාදුක්ක.
15. ගේට්වේ අධ්‍යාපන ආයතනය - කලේගාන, ගාල්ල.
16. නිව් මෙට්‍රෝ කම්පියුටර්ස් - කාලිදාස මාවත, මාතර
17. සහන ෆාමසි - මුණගම, හොරණ - 0712608776
18. මෝලෙ කඩේ - මුදුන, වලස්මුල්ල.

**තැපෑලෙන් ගෙන්වා ගැනීම සඳහා විමසන්න - ඩී. සී. ආර්. ඇක්සස් මුද්‍රණාලය - අංක 33, තලවතුගොඩ පාර, පිටකෝට්ටේ - 0777794676**

**ඉහත ආයතන හිමි පින්වතුන් මෙම සද් කාර්ය ඉටු කරනු ලබන්නේ කිසිදු වෙළඳ ලාභයකින් තොරව සාසනික කටයුත්තක් වශයෙන් පමණි.**

# දහමක රසය දැන...

දම් පිණි බින්දු වැටිලා ගිනි කන්ද   පිට
නිම් නැති සිසිල දැනුනා එක   මොහොතකට
කම් සැප විසුව හද ගැඹරේ පතුල   වට
සම්බුදු දහම් බිඳු පොදි ලෙළ දුනි   පෙළට

පස් කම් විඳගෙනම සසරේ සරන   තුරා
දොස් නම් නොදකිනා තරමට රඟති   නුරා
උස් මිටිකම් නොමැති දහමක හරය   අරා
හිස් වුනු සසුන් අඹරේ සඳ නැගෙති   පුරා

දහමක රසය ඔපවත් වී සැමට   බෙදා
වහරක හිමි සඳුන් මුල් වී කරති   උදා
සසරක දුක උරුම කර ගෙන සරන   මෙදා
දවසක අහපු බණ නිවෙනට ඇතිය   සදා

හබය අහවරයි ඇසු ඒ දහම   මත
සබය මැදක සංසුන් ලෙස වැඩෙයි   සිත
නිබය නිදොස සහ අමොහය හැඳින   සත
සුබය ලෙස නොගෙන සසරෙහි සරනු   ඇත

දුක අනිසය අසාරය යන කරුණු   තුන
දැක දැන ගැනීමෙන් සසරෙහි සැරි   සරන
නෙක කම් කළත් දුගතිය නැත පෙර   තිබුන
සැක නැත නිවෙන පසටම දැන් සරති   මන

සාරන්දද සුතුරෙ දුලබවු කරුණු   පස
තෝරන්නට නොදැන සසරෙහි සරති   බැස
පීරන්නට වුනා ලොව ගැන අනිස   නිස
ආරම්භයට සම් දිටු විය ලැබුණි   ඇස



පබැඳුම - හොරණ දයානි ප්‍රනාන්දු

# ලෝ තතු සිහි කරනවද හිමි ලැබුණ සැණේ...



අරණ්‍ය ඇති නිසල බව විදසුනට ගෙන
සරනට ඇති සසර බියකරු බවම දැන
දිරනට යන කයක තව මොන සැපද වන
වරමකි ලැබුන සිහි කරනට මුනිඳු බණ

රුක් මුල මෙන් මනස සවි බල විලස දැනේ
දැක්මකි ඒ සිතට තුන් දොස නිදොස පෙනේ
රැක්මට කිසිත් නැත රිසි ලෙස නොමැති තැනේ
දුක් දුරු කරන මග ගන්නෙම් ලැබුන සැණේ

ගිලන් පස වුවද ලද කෙටි වෙලාවේ
බලන් ඉන්නෙ කුමටද හුදෙ කලාවේ
වෙලන් ඉන්න කෙළෙසුන් කඳ මුලාවේ
හලන්නට බලමි හිඳ ගල් තලාවේ

වළඳන දන් පිඬක් ඇනුමට පෙරද ගතේ
ඇති පණ තණ අගක පිණි බිඳු විලස වෙතේ
හිටි වන එපණ යන්නට පෙර ලැබුණ අතේ
මුනි බණ සිහි කරමි සැනසුම සතුට ඇතේ

ගත් දානයට ණය නැති වන විලස වසා
මෙත් සිත පතුරවමි නිවෙනට බණද අසා
ලත් මෙම භවය වැනසීමට නොහැකි නිසා
සිත් නොහදනා මග ගම් මතු භවය නසා

පෙර බුදු සිරිත යළි පණ ගැන්වෙන තැන්ද
හර ඇති විලස දුලබව මුත් ඇත දැන්ද
කරදර ලෙස නොසිත අරණ්‍ය විද සුන්ද
වෙර ගෙන වඩන උතුමන් අද අඩු මන්ද ?

පබැඳුම - නීතිඥ චන්දන සිරිවර්ධන

නීතිඥ චන්දන සිරිවර්ධන විසින් නුගේගොඩ ගංගොඩවිල විහාර පාරේ අංක 96/A දරණ ස්ථානයේ පිහිටි ඉමාෂි මුද්‍රණාලයේ මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී